රළ සමග

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2016 සැප්තැම්බර්
22 වෙළුම 06 කලාපය

ආධාරය රු 30/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"විප්ලවයේ ප්‍රතිඵලය රැඳී පවතින්නේ, කම්කරු පංතිය ධනපති පංතියේ උපකාරක බලවේගයක, එනම්, ඒකාධිපත්‍යයට විරුද්ධව දෙන ප්‍රහාරයේදී ශක්තියෙන් බලවත් වන නමුත් දේශපාලන වශයෙන් බෙලහීන උපකාරක බලවේගයක, කාර්යකොටස ඉටු කරයිද, නැතහොත්, එය ජනතා විප්ලවයේ නායක කාර්ය කොටස ඉටු කරයිද, යන්න මතය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**03වැනි වෙළුම,**
**15 පිටුව**

**05** **දෙපලු වූ ශ්‍රීල.නි.ප.ය...**



වසරකින් ආණ්ඩුවක් හදා තනතුරු ඇමති ධුර ලබාගැනීටමත් හිරේ විලංගුවේ වැටීමෙන් මිදීමටත්...

**07** **දැනුම තුළ...**



යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම්, ආගමික විශ්වාස, කේන්ද්‍ර ආදියේ සිට ජාතිවාදය වර්ගවාදය...

**09** **"රහ පාලනය"...**



දැන් "යහපාලනයේ" "රහ පාලනය" පෙන්වන කාලය ආරම්භ කර ඇත. දැන් වරාය ඉතිරි ටික...

**11** **විපතක් වූ කසළ...**



කසළ මෙවැනි ආදායම් උපදවාගත හැකි ද්‍රව්‍යයක් බවට පත් කරගෙන ඇත්තේ  රාජ්‍ය මැදිහත් වීම...


| | |
|---|---|
| සංවාදය.......................... | 03 |
| තරුණ.............................. | 04 |
| ආවර්ජනා........................ | 06 |
| ජාත්‍යන්තර...................... | 08 |
| වේදිකාව.......................... | 10 |
| කාලීන.......................... | 12 |
| කාන්තා.......................... | 13 |
| විශේෂාංග........................ | 14 |


# හවුල් ආණ්ඩුවේ
# විකිණිල්ල දිගටම

*02 පිටුවට*




***යුක්තිගරුක දේශයක්!    සාධාරණ සමාජයක්!!    නිවහල් මිනිසෙක්!!!***

# උතුරු මැද ආයුර්වේද සේවක ගැටලු නොවිසඳුණොත් සටන් මඟට




උතුරු මැද පළාත් සභාවට අයත් ආයුර්වේද කාර්ය මණ්ඩලය සඳහා හිමිවිය යුතු එහෙත්, කාලයක් පුරාවට නොවිසඳී පවතින ගැටලු වහා විසඳන ලෙසත් නොඑසේනම් දැඩි වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවත් දන්වා සමස්ත ලංකා ආයුර්වේද සුවසේවා සංගමය විසින් උතුරු මැද පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිපියක් යොමු කර ඇත.

රු.1000.00 විශේෂ දීමනා හිඟ මුදල් ලබා නොදීම, නිල ඇඳුම් දීමනා හිඟ මුදල් රු.1300/- ලබා නො දීම, ආහාර දීමනා හිඟ මුදල් ලබා නොදීම, 2016 සඳහා වූ අයවැයෙන් වැඩිකළ රු.2500/-ක මුදල නොගෙවීම ඇතුළු ගැටලු ගණනාවක් එම සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ගුරුගේ සහෝදරයා විසින් යවන ලද මෙම ලිපියේ ඇතුළත්ය.

අදාළ ගැටලු පිළිබඳව උතුරු මැද පළාත් සභාවේ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා සහ නිලධාරීන් සමඟ ජූලි මාසයේ පවත්වන ලද සාකච්ඡාවේදී එකඟ වූ පරිදි අදාළ විසඳුම් මේ දක්වා නොලැබුණු බව සඳහන් කරන සමස්ත ලංකා ආයුර්වේද සුවසේවා සංගමය, තම සංගමයේ විධායක සභාවේ තීරණයක් අනුව 2016. 08. 29 දින සිට උතුරු මැද පළාත් සභාවට අයත් සියලුම රෝහල් සහ ආයතනයන්හි සේවය කරන පී.එල්. සහ එම්.එන්. වැටුප් කණ්ඩවලට අයත් කාර්ය මණ්ඩල වෘත්තීය ක්‍රියාමාර්ග වෙත එළඹීමට නියමිත බවත් ඒ හේතුවෙන් රෝගී ජනතාවට මුහුණ පෑමට සිදුවන අපහසුතාවයන් වෙනුවෙන් අදාළ බලධරයන් වගකිව යුතු බවත් දන්වා ඇත.

# දුම්රිය කාර්යාල සේවක සේවයට බඳවා ගැනීම නීති විරෝධීයි




වසර ගණනාවක් තිස්සේ දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යාලවල සේවය කරන අනියම් ආදේශක හා ස්ථිර සේවක සේවිකාවන් විශාල ප්‍රමාණයක් සිටියදී දේශපාලන හිතවත්කම් මත තවත් 152 ක් කාර්යාල සේවක සේවයේ ෂෂෂ වන ශ්‍රේණියට බදවා ගැනීම මෙතෙක් සිදුකරන ලද බඳවාගැනීමේ ක්‍රමවේදයට සම්පූර්ණයෙන්ම පටහැණිව සිදු කර ඇතැයි සමස්ත ලංකා දුම්රිය පොදු සේවක සංගමය චෝදනා කරයි.

පසුගිය 31වැනි දින ජනාධිපතිවරයා සහ අගමැතිවරයා වෙත ලිපියක් යොමු කරමින් සමස්ත ලංකා දුම්රිය පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් එස්.පී. විතානගේ සහෝදරයා ප්‍රකාශ කරන්නේ, කාර්යාල සේවකයින් බඳවා ගැනීම් සඳහා වන නිවේදනය දුම්රිය අන්තර්ජාල පිටුවේ පමණක් පළ කර ඇති අතර එය කිසිසේත්ම පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීමක් ලෙස සැලකිය නොහැකි බවය. සාමාන්‍යයෙන් ස්ථිර තනතුරු සඳහා බදවා ගැනීම සිදුකරනු ලබන්නේ රජයේ ගැසට් පත්‍රය මගින් හෝ පුවත්පත් මගින් ප්‍රසිද්ධ කිරීමෙන් වන අතර අන්තර්ජාලයේ පමණක් පළ කිරීමේදී එවැනි පහසුකම් නොමැති ජනතාවට එම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට පවා නොහැකිවනු ඇතැයි විතානගේ සහෝදරයා පවසයි.

කෙසේ වෙතත් මෙම තනතුරු සඳහා ඉල්ලා ඇති සුදුසුකම් සහිත සේවකයින් විශාල ප්‍රමාණයක් දුම්රිය දෙපාර්තමේන්තුවේ අනියම් හා ආදේශක සේවකයින් ලෙස දැනටමත් සේවයේ යෙදෙන බවත් ඔවුන් අතර කාර්යාල සේවක සේවයට අන්තර්ග්‍රහණය කළ හැකි ස්ථිර සේවයකයින් පිරිසක්ද වන බවත් පෙන්වා දෙන පොදු සේවක සංගමය දේශපාලන හිතවතුන් පිරිසක් බඳවා ගැනීමේ අරමුණින් ආණ්ඩුව විසින් බොරු තර්ක ඉදිරිපත් කර තනතුරු 152ක් සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේද අනුමැතියද ලබා ගෙන ඇතැයි කියා සිටී. මෙම තීරණය ප්‍රවාහන අමාත්‍යවරයා හා දුම්රිය බලධාරීන් එක්ව දුම්රිය පරිපාලනය අවුල් කිරීමට ගෙන ඇති තවත් ක්‍රියාමාර්ගයක් බව පෙන්වා දෙන එම සංගමය, දුම්රිය කාර්යාල සේවක සේවයේ තනතුරු සඳහා ඕනෑවටත් වඩා සේවක සේවිකාවන් දුම්රිය දෙපාර්තමේන්තුවේ සිටියදී එම තනතුරුවලට තවත් පිරිසක් දේශපාලන මැදිහත්වීම් මත බදවා ගැනීම කිසිදු අයුරකින් යහපතක් නොවන බැවින් මෙම බඳවා ගැනීම් වහා අවලංගු කරන ලෙස ඉල්ලා සිටී.

# 'බෝට් හවුස්' නිලවරණය ප්‍රජාතන්ත්‍රවාදී කරන්න



සීමාසහිත සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතියේ ( BOAT HOUSE) නිලවරණය මෙම වසර අග දී පැවැත්වීමට නියමිත නමුදු එම නිලවරණය පවත්වන ආකාරය ප්‍රජාතන්ත්‍රවාදී නොවන්නේයැයි චෝදනා කරන සමස්ත ලංකා සුව සේවා සංගමය ඒ සඳහා මැදිහත් වන ලෙස ඉල්ලා සමුපකාර කොමසාරිස්වරයා වෙත ලිපියක් යොමු කර තිබේ.

සංගමයේ සභාපති සමන්ත කෝරලේආරච්චි සහ ප්‍රධාන ලේකම් සෝමරත්න එදිරිසිංහ යන සහෝදරවරුන්ගේ අත්සනින් යොමුකර ඇති ලිපියේ සඳහන් වනුයේ, බහුතර සාමාජිකයින්ට සහභාගිවීමට නොහැකි ලෙස කොළඹින් බැහැර ප්‍රදේශයක නිලවරණය පැවැත්වීමට කටයුතු යොදා ඇති බවට එම සමිතියේ සාමාජිකත්වය දරන වෘත්තීය සමිති සාමාජිකයින් විශාල පිරිසක් විසින් තමන් වෙත දැනුම් දී ඇති බවය.

30,000කට අධික සාමාජිකත්වයක් සිටින 'බෝට් හවුස්' සමිතිය සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඕනෑම කාර්ය මණ්ඩල සාමාජිකයකුට විවෘත සමිතියත් බව පෙන්වා දෙන සුව සේවා සංගමය දැනට බලයේ සිටින කණ්ඩායම දීර්ඝ කාලයක් තිස්සේ එක දිගට බලයේ රැඳී සිටිමින් සාමාජික මුදල් අවභාවිතයේ යොදවන බවට ද චෝදනා එල්ල වී ඇතැයි සඳහන් කරයි.

අදාළ නිලවරණය කොළඹින් බැහැර එක් ස්ථානයක නොපවත්වා සාමාජිකයින්ට පහසුවෙන් සහභාගි විය හැකි පරිදි රට පුරා දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම සුදුසු යැයි යෝජනා කරන සුව සේවා සංගමය පවතින ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා තම සංගමයට අවස්ථාවක් කඩිනමින් ලබාදෙන ලෙස එම ලිපියෙන් ඉල්ලා ඇත.

# සයිටම් සම්මන්ත්‍රණයේදී සරසවි සිසුන්ට එල්ල කළ ප්‍රහාරය හෙළාදකිමු!

## සමාජවාදී ශිෂ්‍ය සංගමය

රත්නපුර නගරයේ පවත්වන ලද සයිටම් සම්මන්ත්‍රණයකදී සයිටම් පෞද්ගලික විශ්වවිද්‍යාලය ප්‍රශ්න කළ සරසවි සිසුන්ට එහි සංවිධායකයින් විසින් පහරදෙනු ලැබීම හෙළා දකිමින් සමාජවාදී ශිෂ්‍ය සංගමය විසින් පසුගිය 24වැනිදා ජනමාධ්‍ය නිවේදනයක් නිකුත් කරන ලදී. එහි ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා විසින් නිකුත් කළ එම නිවේදනය සම්පූර්ණයෙන් මෙසේය.

පෞද්ගලික විශ්වවිද්‍යාල රටට අවශ්‍ය බව කියමින් මාලබේ නීති විරෝධී පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ සිසුන්ගේ දෙමාපියන් විසින් අද (23) දින රත්නපුරයේදී පැවැත්වූ සම්මන්ත්‍රණය අතරතුර කථිකයින් ඉදිරිපත් කළ අදහස් පිළිබඳව ප්‍රශ්න මතුකළ සබරගමුව විශ්වවිද්‍යාලයේ සිසු නායකයින් ශිෂ්‍යයින්ට සහ අනෙකුත් පුද්ගලයින්ට පහරදී ඇති බවත්, ඉන් කිහිප දෙනෙකු මේ වන විටත් රත්නපුර මූලික රෝහලට ඇතුළත් කර ඇති බවත් වාර්තා වේ. මේ සම්බන්ධව ඔවුන් විසින් රත්නපුර පොලීසියට පැමිණිල්ලක්ද සිදුකර ඇත.

නීති විරෝධී ලෙස ආරම්භ කළ මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය මෙරට නිදහස් අධ්‍යාපනයට සහ නිදහස් සෞඛ්‍යට අභියෝග කරමින් මෙරට දෙමාපියන් සහ දූ දරුවන් රවටමින් අද වන තෙක් පවත්වාගෙන එනු ලබන්නේ, පැවති රාජපක්ෂ ආණ්ඩුවේත් පවතින මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුවේත් නොමසුරු සහයෝග යෙන් බව කවුරුත් දන්නා සත්‍යයකි. එහි ඉගෙනගත් පිරිස් රෝගීන්ගේ ජීවිත පිළිබඳ තීන්දු ගැනීම උදෙසා නොබෝ දිනකින් මෙරට සෞඛ්‍ය සේවයට එක්වීමට මංපෙත් විවර කරගැනීම වෙනුවෙන්ද එම සහයෝගය උපරිමයෙන්ම ලබා ගනිමින් සිටිති.

කෙසේ වුවත් මෙම ආයතනයේ වංචනිකභාවයත් ඒ හරහා මෙරට නිදහස් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට සිදුකරන හානිය පිළිබඳවත් වෛද්‍යවරුන්, විශ්වවිද්‍යාල සිසු සිසුවියන්, වෘත්තීය සමිති, ප්‍රගතිශීලී දේශපාලන පක්ෂ සහ පිරිස් විසින් කරන හෙළිදරව් කිරීම් සහ දැනුවත්කිරීම් හේතුවෙන් මෙහි සැබෑ නිරුවත මෙරට ජනතාවට දිනෙන් දින පසක් වෙමින් තිබේ. ඒ නිසා එක් පසෙකින් මුදල් වියදම් කරමින් තමන්ටම සුදු හුණු ගාගැනීමට පටන්ගත් මෙම ආයතනයට සම්බන්ධ පිරිස්, දැන් දැන් තම මතයට එරෙහි පුද්ගලයන් නිහඬකිරීම උදෙසාද ක්‍රියාමාර්ග ගනිමින් සිටී. අද දින වූ මෙම සිදුවීම ඊට කදිම නිදසුනකි.

තමන්ගේ මතය බලහත්කාරීව පතුරුවාහැරීම උදෙසා සිදුකළ මෙම ප්‍රහාරය සමාජවාදී ශිෂ්‍ය සංගමය ලෙස අප හෙළාදකින අතර, ඊට වගකිව යුතු පුද්ගලයින් වහා අත්අඩංගුවට ගන්නා ලෙසට අපි ආණ්ඩුවට බලකර සිටිමු. මෙරට ශිෂ්‍ය ව්‍යාපාරය පොදු ජනතාව උදෙසා ගෙන යන අරගලය මෙවැනි ප්‍රහාරයන් හමුවේ අඩපණ වනු වෙනුවට තව තවත් පන්නරය ලබන බවට ඉතිහාසය සාක්ෂි දරන බවත්, ආණ්ඩුවට මෙන්ම මෙම ආයතනයේ වංචනික පාලනාධිකාරියටද මතක්කර දීමට කැමැත්තෙමු. එසේම මෙවැනි බාධාවන්ට නොසැලී නිදහස් අධ්‍යාපනයත් සෞඛ්‍යත් උදෙසා වූ අරගලයට එක්වන ලෙස සියලු ප්‍රගතිශීලී ජනතාවට ආරාධනා කර සිටිමු.

## හවුල් ආණ්ඩුවේ...

මුල් පිටුවෙන්

ආර්ථික අර්බුදයක ගිලී ඇති මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි අනුව සහ නව ලිබරල්වාදී ආර්ථික සැලසුම් අනුව රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලීකරණය කිරීම වේගවත් කර ඇතැයි වාර්තා වේ.

පැවති ආණ්ඩුවල හා පවතින ආණ්ඩුවේ දුර්වල කළමනාකරණය තුළ මහා පරිමාණයෙන් පාඩු ලබන රාජ්‍ය ආයතන ඒවායේ බරින් ජනතාව නිදහස් කිරීමේ යෝජනාවට මුවාවී පළමු වටයේදී විකුණා දැමීමටත් සෙසු මහජන ආයතන කාර්යක්ෂම කිරීමේ හා සේවාව පුළුල් කිරීමේ හේතු දක්වා පෞද්ගලීකරණය කිරීමටත් වත්මන් ආණ්ඩුව සැලසුම් කරමින් සිටී.

රාජපක්ෂ ආණ්ඩුව සමයේ ඔහුගේ පවුලේ ඥාතීන්ගේ පාලනයට නතු වූ එයර්ලංකා ආයතනය මේ වන විට රුපියල් බිලියන 62ක ණය බරක ගිලී ඇති අතර එම ආයතනය සම්බන්ධයෙන් තමන්ට ඇති එකම විසඳුම එය විකුණා දැමීම යැයි ආණ්ඩුව ප්‍රකාශ කරයි. ආණ්ඩුවේ අභ්‍යන්තර ආරංචි මාර්ග අනුව සැබැවින්ම මෙම පෞද්ගලීකරණ යෝජනාව පසුගිය මැයි මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ඉදිරිපත් වූවකි. ගුවන් සේවය සතු ගුවන්යානා 03ක් දැනටමත් විදෙස් ගුවන් සමාගමකට බදු පදනමින් ලබාදී ඇති අතර සමාගම සතු ගුවන්තොටුපළේ භාණ්ඩ ප්‍රවාහන, ආහාර සැපයුම් හා ඉංජිනේරු සේවා පෞද්ගලීකරණයට පියවර ගනිමින් සිටී.

මීට අමතරව ආණ්ඩුව මිහින් ලංකා, මත්තල ගුවන්තොටුපළ, හම්බන්තොට වරාය, ලංකා හොස්පිටල් සහ තවත් හෝටල් දෙකක් ඇතුළු ආයතන හයක් විකිණීමේ අපේක්ෂාව ප්‍රකාශයට පත්කොට තිබේ. එසේම ආණ්ඩුව ධීවර සංස්ථාව පෞද්ගලීකරණය කිරීමේ වැඩපිළිවෙලක් සකසමින් සිටින ආණ්ඩුවේ නවතම පෞද්ගලීකරණ උත්සාහය ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් කොළඹ වරායේ නැගෙනහිර ජැටිය විකුණා දැමීමය. කොළඹ වරායට විශාල ලාභ ඉපිදවිය හැකි මෙම ජැටියට අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු නොකර එය ඉන්දියානු සමාගමකට පැවරීමට ආණ්ඩුව පියවර ගෙන ඇත්තේ පොට් සිටි ව්‍යාපෘතිය චීනයට පැවරීමට හිලව් වශයෙන් බවද සඳහන්ය.

එපමණක් නොව විශාලතම රාජ්‍ය ආයතන වන ඛනිජ තෙල් සංස්ථාව, විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පත් හා ජලාපවහන මණ්ඩලය, ගුවන්තොටුපළ හා ගුවන් සේවා සමාගම හා වරාය අධිකාරියේ " ව්‍යුහාත්මක ගැලපීම්" (Structural reforms) සිදුකිරීමටද මූල්‍ය අරමුදල ආණ්ඩුවට යෝජනා කර ඇති බව සඳහන්ය. මෙම ව්‍යුහාත්මක ගැලපුම්ද එම ආයතනයන් පෞද්ගලීකරණයට දොර විවර කරන යෝජනා මිස වෙනත් ඒවා නොවේ.

රටේ ආර්ථික කඩා වැටීමට විසඳුම් නොමැති මෛත්‍රී-රනිල් ආණ්ඩුවද පෙර පාලනයන් මෙන්ම විසඳුම් සොයමින් හැරී ඇත්තේ ජාත්‍යන්තර වශයෙන් මෙන්ම දේශීයවද තම අසාර්ථකත්වය ඔප්පු කළ හා ඔප්පු කරමින් සිටින නව ලිබරල් ධනවාදී ආර්ථික ප්‍රතිපත්තියටමය. මෙම උපන්ගෙයිම අසාර්ථක ආර්ථික අත්හදාබැලීම්, ජනතාව සතු සම්පත් ඔවුනට අහිමි කරනු පමණක් නොව රටත් ජනතාවත් කැටුව යනු ඇත්තේ තව තවත් ආර්ථික අර්බුදයක් වෙතටය. එබැවින් එම තත්වය පරාජය කිරීම සඳහා වැඩකරන ජනතාව සමග අත්වැල් බැඳගනිමින් සියලු ජනතාව පෙරට පැමිණිය යුතු කාලය පැමිණ තිබේ.

## ග්‍රෑම් 100 පඩියේ...

10 පිටුවෙන්

සඳහා වන කාර්ය මණ්ඩලයක් නැහැ.

අපි නව ජාතික මිනුම් පර්යේෂණාගාරයක් ඇති කළාට ඒ පර්යේෂණාගාරයේ ඉදිරි සංවර්ධනය පිළිබඳව අවධානයක් යොමු කරලා නැහැ. ඒ නිසාම දැනුත් පර්යේෂණාගාරය තුළ විද්‍යාගාර 60කට අවශ්‍ය කරන නිලධාරින් නොමැතිකම නිසා එය අයාලේ යන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අපි මේ අලුත් ක්ෂෙත්‍ර - විශේෂයෙන් මිනුම් විද්‍යා ක්ෂේත්‍රය සහ කර්මාන්ත මිනුම් ක්ෂේත්‍රය - පිළිබඳව අවධානය යොමු කරමින් ඉදිරියට යන වේලාවේදී මෙන්න මේ මානව සම්පත පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්න කියලා ඇමතිවරයාගෙන් ඉල්ලනවා. ඒ වාගේම මේ නිලධාරින් පරිපාලන ගැටලු රාශියකට මුහුණ දී තිබෙනවා. ඔවුන්ගේ උසස්වීම් පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. ඔවුන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. ඔවුන්ට ලැබෙන විදේශීය පුහුණුවීම් පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. ඔවුන්ට ලැබෙන ස්ථාන මාරු පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. මෙවැනි හේතු නිසා, ඉතා විශාල කාර්ය භාරයක් කළ හැකි නිලධාරීන් ප්‍රමාණයක් යම් කිසි ආකාරයකට මන්දෝත්සාහීව, තමන්ගේ රාජකාරිය හරි හැටි කර ගත නොහැකි වීමේ අර්බුදයකින් පීඩාවට පත්වී තිබෙනවා.

රජය - ආණ්ඩුව - මැදිහත් වෙන්නේ පාරිභෝගිකයන් හෙවත් ජනතාව ආරක්ෂා කිරීමට නම්, මේ ආයතනය මීට වඩා විධිමත් කළ යුතුයි. මේ සඳහා බඳවා ගත හැකි; මේ සඳහා පුහුණුව ලබා දිය හැකි විද්‍යා උපාධිධාරින් රාශියක් අපේ රටේ ඉන්නවා. ඒ විද්‍යා උපාධිධාරින් සාමාන්‍ය උපාධි සහ විශේෂවේදී උපාධි ලබා ගෙන එළියට ඇවිල්ලා කරන්න දෙයක් නැතිව ඉන්නවා. ඒ වාගේම, ඒ විද්‍යා උපාධිධාරීන් තමන්ට නොගැළපෙන රැකියාවල නිරත වෙලා ඉන්නවා. මෙනි අය බඳවා ගෙන, ඔවුන්ට නිසි පුහුණුවක් ලබා දීලා, ඔවුන් මේ කාර්යයට අන්තර්ග්‍රහණය කර ගත්තොත්, රටක් හැටියට ඉදිරියට යන්නට අපට මහගු අවස්ථාවක් ලැබේවි.

ඒ කෙසේ වුණත්, ලෝකය පියවර ගණනාවක් ඉදිරියට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් අලුත් දැනුමක් එකතු කර ගෙන තිබියදී අපත් ඒ දැනුම එකතු කර ගනිමු. ඒ නිසා කුඩා කුඩා වංචා දූෂණ අවම කර ගන්න මෙවැනි ආකාරයේ මැදිහත් වීමක් කරන අතරම, ජනතාවට පොරොන්දු වුණු ආකාරයට, ඡන්ද ලබා ගත් ආකාරයට ක්‍රියා කළ යුතුයි.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# වහා හෙළි කළ යුතු අපරාධ පිළිබඳ රහස්

"ගමේ හොරු දෙදෙනෙක් රණ්ඩු කරන විට අපගේ කෙහෙල් කැන කැපුවේ කවුදැයි සොයාගැනීමට හැකිවෙනු ඇත". යනුවෙන් කියමනක් ගැමි වහරේ තිබේ. මේ දිනවල ලංකාවේ දේශපාලනයේ මීට කිට්ටු යමක් සිදුවෙමින් තිබේ. 2005 සිට වසර 09ක් මේ රට පාලනය කළ රාජපක්‍ෂ පාලනයේ ප්‍රබලයන් දෙපිල බෙදී එකිනෙකාගේ හොරකම් හා ෆයිල් හෙළිකරන බවට තර්ජනය කිරීමට පටන්ගෙන තිබේ. එහෙත් තවමත් ජනතාවගේ කෙසෙල් කැන කැපුවේ (මහජන ධනය හොරකම් කළේ) කවුදැයි හෙළිකර නැත. මෙරට මහජන ධනය හොරා කෑවේ කවුදැයි ජනතාව හරියටම දනිති. එහෙත් ඔවුන් සතුව ඒ පිළිබඳ රහස් තොරතුරු නැත. රහස් තොරතුරු ඇත්තේ, හොරකම් කළ අය සතුව හා ඔවුන් සමඟ එකට වාඩිවී සිටි අය ළඟය. ජනතාව බලා සිටන්නේ ඒවා එළියට දමන තුරුය.

රාජපක්‍ෂ පාලන සමය තුළ රාජපක්‍ෂවරුන් කළ හොකරම් හා අපරාධ පිළිබඳ රහස් තොරතුරු රැසක් තමන් සතුව තිබෙන බවත් ශ්‍රීල.නි.ප.ය දෙකඩකර අලුතින් පක්‍ෂ හැදීමට ආවොත් ඒව එළියට දමන බවත් ඒවා එළියට දැමුවොත් රාජපක්‍ෂවරුන්ට සිදුවන්නේ බලය ලබාගැනීමට නොව පාරේ ඇවිද ඇවිද සිටීමට බවත් වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පසුගියදා මාතරදී ආවේගාත්මකව ප්‍රකාශ කර තිබුණි. ඔහු එම ප්‍රකාශය කළේ, වත්මන් හවුල් ආණ්ඩුවට වසරක් පිරීම නිමිත්තෙන් මාතර පැවති රැලියකදීය. මෛත්‍රීපාල ජනාධිපතිවරයා රාජපක්‍ෂවරුන්ට ප්‍රසිද්ධියේ මෙවැනි අනතුරු ඇඟවීමක් කළ පළමු වතාව මෙය විය. මෙම අනතුරු ඇඟවීම පිටුපස තිබෙන්නේ, ශ්‍රීල.නි.ප.ය බෙදා නව පක්‍ෂයක් සැදීමට රාජපක්‍ෂ කල්ලිය දරන උත්සාය වැළැක්වීම සඳහා කරන ලද තර්ජනයක් බව පැහැදිලිය. ශ්‍රීල.නි.ප.ය බෙදීම ඒ තරමටම වර්ධනය වී ඇත. එය වෙනම කථාවකි. මෙහිදී අපේ අවධානය යොමුවිය යුත්තේ මෛත්‍රී දන්නා රාජපක්‍ෂවරුන්ගේ රහස් මොනවාද යන්නය. එම රහස් සාමාන්‍ය රහස් විය නොහැක. මෛත්‍රී කියන ලෙසම ඒවා හෙළි කළහොත් රාජපක්‍ෂවරුන්ට 'මහ මඟට බැසීමට' සිදුවන තරමේ ඒවාය. එබැවින් මෙම රහස් බරපතළ අපරාධ පිළිබඳ රහස් විය යුතුය.

මීට පෙර මෛත්‍රී මහින්දගේ ආණ්ඩුවෙන් ඉවත්ව ජනාධිපතිවරණයට ආ විට මහින්දද එවැනි ප්‍රකාශ කළේය. ඒ මෛත්‍රීලගේ ෆයිල් තමා ළඟ තිබෙන බවත් තමා ඒව එළියට නොදමන බවත්ය. මොවුන් එකිනෙකාට එරෙහිව එකිනෙකා සතුව තිබෙනවා යයි කියන රහස් හා ෆයිල් ඔවුන්ගේ පවුල්වල පෞද්ගලික රහස් හෝ පෞද්ගලික ලිපිගොනු නොවන බව පැහැදිලිය. ඒවායින් නම් ජනතාවට එතරම් වැඩක්ද නැත. එහෙත් මේ කියන්නේ, රටක් පාලනය කිරීමේදී සිදුකර ඇති මූල්‍ය වංචා හා විවිධ දේශපාලන අපරාධ පිළිබඳ තොරතුරුය. එබැවින් ඒවා ජනතාව දැනගත යුතුය. ඒවා අවශ්‍යවිට පාවිච්චි කිරීම සඳහා වන 'තුරුම්පු' මෙන් සඟවා තබා ගැනීම හා ඒවා ගැන සඳහන් කරමින් තර්ජන පමණක් කිරීම බරපතළ වරදක් වන්නේය.

මෛත්‍රී කණ්ඩායම පිළිබඳ මහින්ද ළඟ තිබෙනවා යයි කියූ ෆයිල් මේ වනතුරු ඔහු හෙළිකළේ නැත. ඒ මෛත්‍රීට ඇති බිය නිසාද නැත්නම් ඊට වඩා බර ෆයිල් තම කණ්ඩායමට එරෙහිව මෛත්‍රීපාල ජනාධිපතිවරයා සතුව තිබෙන නිසාද යන්න පැහැදිලි නැත. දැන් මෛත්‍රීපාල මහතා සතුව තිබෙන බව කියන රාජපක්‍ෂලාගේ රහස් වඩාත් බරපතළ විය හැක. එබැවින් කළ යුතු වන්නේ අලුත් පක්‍ෂයක් හැදුවොත් පමණක් හෙළිකිරීමට හෝ අලුතින් පක්‍ෂයක් හැදුවේ නැත්නම් හෙළි නොකිරීමට හෝ සඟවා තබා නොගෙන ඒවා ජනතාවට හෙළිකිරීමය. එය ජනාධිපතිවරයාගේ වගකීමක් බව ඉතා පැහැදිලිය. නැතිනම් මහින්ද මෙන්ම මෛත්‍රීද පුහු තර්ජනකාරයින්ගේ ගණයට වැටෙනවා ඇත.

මේ පිළිබඳ ප්‍රශ්නයේදී දන්ත වෛද්‍ය රාජිත සේනාරත්න ඇමතිවරයා පවසා තිබුණේ එම රහස් ජ.වි.පෙ.ට හදිසි වූ පමණින් හෙළි නොකරන බවත් අවශ්‍ය වෙලාවට හෙළිකරන බවත්ය. මෛත්‍රීපාල ජනාධිපතිවරයා සතුව ඇතැයි කියන රහස ඔවුන්ගේ පවුලේ අභ්‍යන්තර රහස් නම් එය අපට හෝ ජනතාවට එතරම්ම අදාළ නැත. එහෙත් මෙම රහස් පසුගිය පාලන සමයේ රාජ්‍ය නායකයාගේ හා ඔහුගේ කණ්ඩායමේ මූල්‍ය වංචා හා අපරාධ පිළිබඳ රහස් නම් ඒවා ප්‍රමාද නොවී වහාම හෙළිකළ යුතුය. මෛත්‍රීපාල ජනාධිපතිවරයා ලද ජනවරම මහින්දගේ වංචා දූෂණ හෙළිකිරීමද මුල්කරගත් ජනවරමක් බව අමතක නොකළ යුතුය.

හිටපු පාලකයන්ගේ අපරාධ පිළිබඳ රහස් තොරතුරු තිබිය යුත්තේ, ඔවුන් බියවද්දා 'බ්ලැක්මේල්' කිරීම සඳහා තබාගැනීමට නොව ඊට අදාල අංශ වෙත වහාම ලබා දීමටය. ඒවා හෙළිකළ යුත්තේ තමන්ට 'ඕනෑ වෙලාවට' නොව රටට අවශ්‍ය වෙලාවටය. වත්මන් පාලකයන් මේ පිළිබඳ නෛතික ආදර්ශය රටට ලබාදිය යුතුය.

මෛත්‍රී කළ වර්ගයේ ප්‍රකාශයක් සාමාන්‍ය පුද්ගලයෙක් සිදුකළේ නම් සිදුවන්නේ කුමක්ද? තමා කෙනෙක්ගේ හෝ පිරිසකගේ අපරාධ පිළිබඳ තොරතුරු දන්නේ යයි සාමාන්‍ය පුද්ගලයෙක් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ නම් පසුවදාම පොලීසියට හෝ රහස් පොලීසියට යාමට ඔහුට සිදුවනු ඇත. කට උත්තර දීමට හා අදාළ අපරාධයන් පිළිබඳ නඩුවල සාක්ෂි දීමටද ඔහුට සිදුවනු ඇත. මෙම ප්‍රකාශය කළේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක වෙද්දී නම් "තොරතුරු සැඟවීමේ" වරදට දඬුවම් ලැබීමටද ඔහුට සිදුවනු ඇත. එහෙත් මෙම ප්‍රකාශය කරන්නේ, රටේ ජනාධිපතිවරයා නිසා ඔහු පිළිබඳව අදාළ ආයතන එලෙස ක්‍රියාත්මක වන්නේ නැත. මේ පිළිබඳ සත්‍යය ජනාධිපතිවරයා විසින්ම ජනතාව හමුවේ තැබීම කළ යුත්තේ ඒ නිසාය.

තොරතුරු ෆයිල් පෙන්වා තර්ජනය කිරීමේ හා හිතවත්කමට හෝ එකට හොරකම් කළ නිසා හෝ තොරතුරු හෙළි නොකර සිටීමේ සම්ප්‍රදාය දැන්වත් නැවැත්විය යුතුය. එබැවින් ජනාධිපතිවරයාගේ වගකීම වන්නේ රාජපක්‍ෂවරු පිළිබඳ ඔහු දන්නා 'රහස්' වහාම හෙළි කිරීමය.

මෙහිදී ජනතාවටද වගකීමක් තිබේ. ඒ, එකිනෙකාගේ ෆයිල් අතේ තියාගෙන එකිනෙකාට එරෙහිව ඒවා හෙළිකිරීමට වහසි බස් දොඩන "එක මල්ලේ ලුණු කෑ" අයගේ දේශපාලනයෙන් දැන්වත් සමුගෙන නව දේශපාලන ගමන් සඳහා පෙළගැසීමය. කලක් එකට ආණ්ඩු කළ අය එකිනෙකා ගැන නගන චෝදනාවලින් පෙනී යන්නේ, ඔක්කොම 'එක වල්ලේ පොල්' බව නිසා නව දේශපාලන ගමනක් වෙනුවෙන් තීරණයක් ගැනීම ජනතාවට දැන් වඩාත් පහසු වී ඇත.

# ධීවරයින් වෙනුවෙන් සටන් මධ්‍යස්ථානයක් ගොඩනගන්න අපි සූදානම්!



**සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනයේ ජාතික සංවිධායක රත්න ගමගේ සහෝදරයා**

***නියමුවා:-*** *විශාල වෙරළ තීරයක් හිමි රටක් වුවත් පාරිභෝගිකයන්ට අඩු මිලට මාළු පරිභෝජනය කිරීමට හෝ ධීවර කර්මාන්තයේ නිරතවූවන්ගේ ජීවිත ඔසවා තැබීමට මෙතෙක් පැවති ආණ්ඩු මෙන්ම වත්මන් ආණ්ඩුවද අසමත්. මේ තත්වය පිළිබඳ ඔබේ අදහස.*

***රත්න ගමගේ සහෝදරයා:-*** ඇත්තෙන්ම මහමුහුදෙ ගිහින් තමන්ගේ ජීවිතය පරදුවට තියල අව්ව වැස්ස මාරියාව නොතකා ධීවර ජනතාව නෙලා ගන්නා මත්ස්‍ය අස්වැන්නට සාධාරණ මිලක් නැහැ. මේ රටේ පාරිභෝගික ජනතාව මිලදී ගන්නා මත්ස්‍ය අස්වැන්නටත් සාධාරණ මිලක් නැහැ. එයට හේතුවෙලා තිබෙන්නේ ආණ්ඩුවට ධීවරයාත් පාරිභෝගිකයාත් රැක ගැනීමට වැඩපිළිවෙළක් නැතිකමයි. මේ වැඩපිළිවෙළ සැකසිය යුතු යාන්ත්‍රණය ධීවර සංස්ථාවයි. ධීවර සංස්ථාව හරහා මේ කර්තව්‍යය ඉටුවෙන්නේ නැහැ. සිද්ධවෙන්නේ නැති හේතුව ආණ්ඩුවේ තිබෙන දුර්වල කළමනාකාරිත්වය. ඒ වගේම ආණ්ඩුවට මේ සඳහා ඇත්ත වුවමනාවක් නොතිබීමත් ධීවර කර්මාන්තය නගාසිටුවීමට වැඩපිළිවෙළක් නොමැතිවීමත් නිසා ධීවර ප්‍රජාවත් පාරිභෝගික ප්‍රජාවත් යන පාර්ශව දෙකටම බරපතළ අසාධාරණයක් සිදුවෙලා තිබෙනවා. ආණ්ඩුවට ධීවර කර්මාන්තය වෙනුවෙන් වැඩපිළිවෙළක් නොතිබීම ඔවුන්ගේ පොදු අර්බුදයේම කොටසක්.

***නියමුවා:-*** *ඔබ කියූ පරිදි ධීවරයින් සහ රජය අතර සම්බන්ධතාවය ගොඩනැගූ ධීවර සංස්ථාව ආණ්ඩුව විසින් පෞද්ගලීකරණය කිරීමේ උත්සාහයක නිරත බවට වෘත්තීය සමිති හා ජනමාධ්‍ය චෝදනා කරනවා. මේ තත්වය ඔබ දකින්නේ කොහොමද?*

***රත්න ගමගේ සහෝදරයා:-*** ධීවර සංස්ථාව ආරම්භ කළේ 1964 වර්ෂයේයි. මුල් කාලීනව ධීවර සංස්ථාවෙන් සිදුවුණු කර්තව්‍යයන් ගණනාවක් තිබුණා. පසුකාලීන මේ කටයුතු වෙනත් ආයතනවලට පැවරුවා. උදාහරණයක් වශයෙන් සිවිල් ඉංජිනේරු අංශය එතනින් ඉවත් කරලා ධීවර වරාය නීතිගත සංස්ථාව ගොඩනැගුවා. දැල් ආම්පන්න නිෂ්පාදනය කිරීම සීනෝර් ආයතනය පිහිටුවලා ඒ ආයතනයට දුන්නා. ධීවර සංස්ථාවේ ප්‍රධාන කටයුත්ත වන්නේ ධීවර ප්‍රජාව නෙළාගන්නා මත්ස්‍ය අස්වැන්න සඳහා මිලක් නියමනය කිරීමයි. මුලදී මේ නියාමන කටයුත්ත නිසි ආකාරව සිද්ධ වුණා. ධීවරයින්ට තමන් නෙළාගන්නා මත්ස්‍ය අස්වැන්නට සාධාරණ මිලක් ලැබුණා. පාරිභෝගිකයින්ටත් කිසියම් ආකාරයක සහනදායක තත්වයක් තිබුණා.
නමුත් පසු කාලීනව විශේෂයෙන් මේ පසුගිය කාලයේ ආණ්ඩුවල විවෘත ආර්ථික ප්‍රතිපත්තිත් ධීවර ඇමතිවරුන්ගේ හැසිරීමත් සමග මේ තත්වය වෙනස් වුණා. එවිට ධීවර ප්‍රජාව නෙළා ගන්නා මත්ස්‍ය අස්වැන්න ඍජුව ධීවර සංස්ථාව විසින් මිලදී ගැනීම වෙනුවට අතරමැදියන් යොදාගත්තා. මේ අතරමැදියන් තැරැව්කාරයන් ධීවර ප්‍රජාව නෙළාගන්නා මත්ස්‍ය අස්වැන්න කුණුකොල්ලයට ගත්තා. එතකොට ධීවර ප්‍රජාවට සාධාරණයක් වුණේ නැහැ. ඒ නිසා සමස්ත රටේ මාලු මිල වැඩිවීමකට ලක්වුණා. ඒ අසාධාරණයට මුහුණ දෙන්න වුනේ මහජනතාවටයි.

> "අපි කියන්නේ මේ මහ මුහුදේ මාළු ටික අල්ලා විකුණාලා ධීවර සංස්ථාව ලාභ ලබන ආයතනයක් බවට පත් කරන්න බැරිනම් ආණ්ඩුවට කිසිවක්ම කරන්න බැහැ කියන ඒකයි."

ධීවර සංස්ථාව සතු ආයතන තිබෙනවා. දිස්ත්‍රික් කාර්යාල 25ක් පමණ තිබෙනවා. ශීතාගාර 03ක් පමණ තිබෙනවා. ප්‍රධාන කාර්යාලේ ඉන්ධන පිරවුම් හලක් තියෙනවා. ඊට අමතරව ප්‍රධාන වටිනා මර්මස්ථාන වල වටිනා භූමි සහිතව ඉඩම් දේපළක් සහිත ආයතනයක්.
මේ ආයතනය සමාන්‍යයෙන් දළ වශයෙන් මසකට ටොන් 300 ක් පමණ මත්ස්‍ය ප්‍රමාණයක් මිලදී ගන්නවා. මේ සඳහා අලෙවියෙන් මිලියන 150 ක් පමණ සමාන්‍ය ගනුදෙනුවක් මාසිකව සිදුවෙනවා. දළ වශයෙන් මිලියන 33 පමණ ලාභයක් ලබනවා මේ ලාභය මඟින් සංස්ථා සේවකයන්ගේ වැටුප් අනෙකුත් පුනරාවර්තන වියදම් වෙනුවෙන් අපිට ලැබී තියෙන තොරතුරු අනුව මිලියන 50 ක් පමණ වියදම් වෙනවා. අමාත්‍යංශය පැත්තේන් කියන්නේ මේක පාඩු ලබන ආයතනයක් කියලා ගෙවී ගිය වර්ෂ ගණනාවක් පුරාවට ඉතුරු මුදල පියවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ගත්තා කියන්නේ සේවක සංඛ්‍යාව වැඩි කිරිමක් සිදුවී තියෙනවා. අවශ්‍ය කාඩර් එක ඉක්මවා විශාල අතිරික්ත සේවක ප්‍රමාණයක් ඉන්න බවට ධීවර ඇමතිතුමාත් ප්‍රකාශ කළා. අමාත්‍යංශය පැත්තෙනුත් මාධ්‍ය නිවේදන මඟින් නිකුත් කළා. එසේ වන්නට හේතුව පසුගිය කාලයේ ඇමතිවරු තමන්ගේ දේශපාලන වුවමනාවන් මත සේවකයින් බඳවා ගැනීමයි. මූලික අරමුණින් පරිබාහිරව දේශපාලන වුවමනාවන් වෙනුවෙන් කටයුතු කිරීම නිසා තමා පාඩු ලබන තත්වයට පත්වෙලා තිබෙන්නේ. මේක පාඩු ලබන ආයතනයක් කියලා පෙන්වා පෞද්ගලිකකරණයට යනවා.
අපි කියන්නේ මේ මහ මුහුදේ මාළු ටික අල්ලා විකුණලා ධීවර සංස්ථාව ලාභ ලබන ආයතනයක් බවට පත් කරන්න බැරිනම් ආණ්ඩුවට කිසිවක්ම කරන්න බැහැ කියන ඒකයි.

***නියමුවා:-*** *ධීවරයින්ට ජීවිත රක්ෂණයක් ලබාගැනීම අනිවාර්ය කර තිබෙනවා.*

15 වැනි පිටුවට



# Yes We Can

## ලෝකය වෙනස් කිරීම වෙනුවෙන් කියවීම

මේ එළඹ ඇති සැප්තැම්බරය කියවීමේ මාසයයි. අලුත් පොතක් මිලදී ගැනිම, අලුත් පොතක් කියවීම සඳහා වන බොහෝ උත්තේජනයන් සැපයෙන මාසයයි. පොත් කියවීම එක් මාසයකට සීමා කළ නොහැකිය. එහෙත් කියවන සැප්තැම්බරයේ උදාවීම නොකියවන මාසය එකොළහටම වඩා වටින්නේය. අපි පොත් කියවිය යුත්තේ මන්ද යන කරුණ පිළිබඳව මෙහිදී විමසීමක් සිදු කිරීම උචිතය.

ඉන්දියානු නිදහස් සටනේ සටන්කාමී තරුණ නායක භගත් සිං පිළිබඳ මතකයක් නිරායාසයෙන් මතකයට ගලාගෙන එයි. බ්‍රිතාන්‍ය ආණ්ඩුවෙන් භගත් සිං හට මරණීය දණ්ඩනය නියම කොට එම දිනය උදාවන තෙක් සිරගත කරන ලදී. එම කාලය තුළ සිය පියාට ලිපියක් ලියන භගත් සිං ජීවිතයේ අවසන් දින කිහිපයේ කියවීම සඳහා පොත් 10ක නම් ලැයිස්තුවක් ඉල්ලා සිටී. ජීවිතයේ ආරම්භයේ සිටම මරණය දක්වා වන සෑම මොහොතකම මිනිසාට ඉගෙනීමට දේවල් ඇත. දැනුමින් තාර්කිකභාවයෙන් සන්නද්ධ තරුණයකු මිනිසකු සමාජයට අවශ්‍ය කර තිබේ. මනුෂ්‍ය වර්ගයා සිය ඉතිහාසය පුරාම රැස්කරගත් දැනුම් සම්භාරය මත අද ලොව නිර්මාණය වී තිබේ. හෙට ලෝකය නිර්මාණය කිරිමට නම් අද අපේ පරම්පරාවද නවදැනුම නිෂ්පාදනය කළ යුතුය; දැනුමින් සන්නද්ධ විය යුතු වෙයි. ලෝකය අර්ථකථනය කිරීම සඳහාත් ලෝකය වෙනස් කිරීම සඳහාත් වන පරිපූර්ණ ඥාන මණ්ඩලයක් හිමිකර ගත යුතුය.

කුඩා කලම සිටම අපි අතට හසුවන පත්තර කෑල්ලේ සිට සෑම දෙයක්ම කියවන්නට පුරුදුව සිටියෙමු. එහෙත් සත්‍යය නම් සෑම අයෙකුම වඩාත් රුචි කරන කුමන හෝ ක්ෂේත්‍රයක් පැවතීමයි. සාහිත්‍ය, ඉතිහාසය, දේශපාලන, විද්‍යාව ආදී ක්ෂේත්‍රවලින් එකක් හෝ කිහිපයක් පුද්ගලයකුගේ ප්‍රියතම ක්ෂේත්‍රය වනු ඇත. කියවීමට යමක් තෝරා ගැනීමේදී තමන්ගේ රුචි කරන ක්ෂේත්‍රයෙන් ලේඛන තෝරා ගැනිම වැදගත්ය. නිදසුනක් ලෙස යමෙකු සාහිත්‍ය හැදෑරීමට වඩාත් රුචි කරන්නේ නම් පළමුව ඒ පිළිබඳව විශේෂඥ දැනුමක් ලැබෙන තෙක් කියවිය යුතුය. දේශීය, විදේශිය සාහිත්‍යය කෘතින්, නව සාහිත්‍ය ප්‍රවනතා පමණක් නොව ඒ මතින් ජීවිතයට සමාජයට උකහා ගත හැකි දේ පිළිබඳවද හැදෑරිය යුතුය. එවිට ඔබට යමක් ප්‍රත්‍යක්ෂ වනු ඇත. එනම් ලෝකයෙන් ව්‍යුත්පන්න කොට ගත හැකි සාහිත්‍ය නම් වූ හුදෙකලා ක්ෂේත්‍රයක් නොමැති බවයි.

ඒ ඒ යුගවල, ඒ ඒ රටවල බිහිවන සාහිත්‍ය නිර්මාණ ඒ ඒ සමාජීය තත්වයන් අනුවම ගොඩනැඟෙයි. එකී සමාජ, දේශපාලන තත්වය අධ්‍යයනය නොකොට ඔබට සාහිත්‍ය කෘතියක අරුත හෝ සාහිත්‍ය තේරුම් ගැනිම උගහටය. යටත්විජිත ශ්‍රී ලංකාවේ බිහිවු සාහිත්‍ය නිර්මාණ බොහෝවිට අධිරාජ්‍ය විරෝධීභාවයට සමීප ඒවාය. ඒ නිසා සාහිත්‍ය රුචිකරන පුද්ගලයන් සමාජ, දේශපාලන තත්වයන්ද මැනවින් හැදෑරිය යුතුය. මිනිසා ලෝකයේ පවතින දේ විද්‍යාව, කලාව, ආර්ථිකය, දේශපාලනය, ආගම වශයෙන් ප්‍රභේද කොට ගෙන හැදෑරුවද මේ සියල්ලම දම්වැලක පුරුක් මෙන් එකිනෙකට සම්බන්ධය. හුදෙකලා කොට හැදෑරිය හැකි කිසිදු ක්ෂේත්‍රයක් නොමැත. සියල්ල දේශපාලන හා ආර්ථික තත්වයන්ගෙන් පැන නැගුණු ඒවාය. කියවිය යුත්තේ එක් ක්ෂේත්‍රයකින් පටන් ගෙන සියල්ලමය.

සමාජයේ පොත් කියවමින් දැනුම එකතු කරන සහ කරගත් මිනිස්සු කොතෙකුත් සිටිති. එහෙත් ඇතැම්හු ලෝකය තේරුම් ගැනීම පමණක් සිදු කරන අතර එම දැනුම ප්‍රායෝගිකව තලයට ගෙන ඒමට උනන්දු නොවෙති. නිදසුනක් ලෙස එක් දිනකට කුසගින්නෙන් ලොව පුරා මිය යන දරුවන් සංඛ්‍යාව 45,000ක් බව පොත් කියවීමෙන් ලබාගන්නා දැනුමයි. එහෙත් එවැනි අසාධාරණ වූ සමාජයක් වෙනස් කිරිමට ධෛර්යයක් නොමැති නම් එම දැනුමෙන් ඇති ඵලය කුමක්ද? කාල් මාක්ස්ට අනුව ලෝකය අර්ථකතනය කරගැනීම සඳහා පමණක් නොව වෙනස් කිරිම සඳහාද ඉගෙනගත යුතුය; කියවිය යුතුය.

සෑම අයෙකුම අඩුම තරමින් තම ජීවිතයේ පොතක් හෝ දෙකක් කියවා ඇත. මුදල් ඉපැයිම, පාණ්ඩිත්‍ය පෙන්වීම, කයිවාරු ගැසිමට පමණක් කෙනෙකු සතු දැනුම භාවිතා කරන්නේ නම් ඉන් ඇති ප්‍රයෝජනයක් නැත. ලංකාව රටක් ලෙස අද තිබෙන්නේ සුවිසල් අර්බුදයකට මැදිවය. ආණ්ඩුවක් හෝ දේශපාලනඥයින් වෙනස් කිරීම මගින් පමණක් ගොඩගත නොහැකි අර්බුදයකට පත්වය. මේ සඳහා සමාජ ක්‍රමයේ ව්‍යුහමය වශයෙන් පුළුල් වෙනසක් අපේක්ෂා කරයි. කියවන දෙය ඒ වෙනුවෙන් ඉලක්ක ගත කරන්නේනම් පොත් පමණක් නොව, ගීතද චිත්‍රපටද කියවිය යුතුය. මුහුණු පොත තුළින් සමාජයද කියවා ගත යුතුය. මන්ද සමාජය වෙනස් කිරීම සඳහා බොහෝ කියවීමක් ඉල්ලා සිටින නිසාය.

# සාහිත්‍ය මාසය හා ස්ටයිල්කරණය....

සැප්තැම්බරය එළඹ තිබේ. අසවල් සම්මානය ලැබුණු පොත, අසවල් ලේඛකයා ලියූ පොත, අසවලාගේ, අසවලාගේ, අසවලාගේ කවිපොත යැයි කියමින් සමහරු පොත් සල්පිල්වල සැරිසරන අතර තවත් සමහරු ලොකු කුඩ යට පොප්කෝන් කති. අයිස්ක්‍රීම් කති. සාහිත්‍ය මාසය යනු තැන තැන කට්ටි ගැසී පොප්කෝන් කෑම දැයි දකින්නෙකුට සිතිය හැක. සාහිත්‍ය මාසයට පොත් කඩවල, සල්පිල්වල මිනිසුන් පොදිකන අපූරුව දකින විට ඉමහත් සතුටක් ගෙන දෙන්නේ මෙතරම් මිනිසුන් කියවීමට උනන්දුවක් දක්වන්නේ දැයි යන්න විශ්මය දනවමිනි. පොත් සල්පිල්වල වෙළෙන්දන් වැඩිදෙනෙක් නිදිවර්ජිතව කූඩාරම් අටවා පැල් බැඳගෙන ලතවනුයේ මිනිසුන්ට කියවීමට පොත් දී නෙත් පෑදීමටමද යන්න සිතා බැලිය යුතුය.



අමුතුම තාලයකට ඇවිදිමින් අයිස්ක්‍රීම් තොලගාන තරුණ, තරුණියන් සාහිත්‍ය මාසය අගේට තලුමරති. ක්ෂණික නූඩ්ල්ස් ඊට රසකාරක සපයයි. උගත් ලේඛකයන් යැයි කියා ගන්නා පිරිසක්ද අවිකණ්ණාඩියෙන් ප්‍රදර්ශනය නරඹති. අවුරුද්දක් තිස්සේ පුස් කෑ, දුහුවිලි වැකුණු පොත් කුණුබක්කිවල දමා දුම, දූවිලි ඇවිළෙන ගිනි අව්වේ අතුරුසිදුරු පුරවන තවත් පිරිසක් වසර ගණනකට සෑහෙන පොත් ගැනීමට නගරය පුරා ඇවිදිති. මිලට ගත් පොත් ගෙන ගොස් කබඩ්වලට පුරවති. දකින්නන්ට නම් මෙතරම් ප්‍රාඥයකු ලොව නැත. එහෙත් පොත් පුස් කයි. කබඩ් වේයන් කයි.

ආටෝපවලින් ජීවිත සරසා ගත් මිනිස් සමූහයා ජීවිතය කෙතැනදැයි සෙවීම පසෙක තබා වෙළෙන්දන්ටත්, වෙළඳාමටත් හසුව සිටී. සාහිත්‍ය මාසය පැමිණෙන්නේ ඒ වෙනුවෙනි. මල්කතා, රසකතා ඇතුළු බොහෝ සිහින මවන කර්තෘ වෙළෙන්දන් නව චින්තකයන් බිහි කරනු වෙනුවට බොළඳ ප්‍රේම වෘතාන්තවලින් තරුණ පරපුර වෙළා ගනී. සමාජයේ මිනිස් සිත් පහන් කිරීමට පැමිණෙන ලේඛකයන්ටද අත්ව ඇත්තේ, ඊට නොවෙනස් ඉරණමකි. පොත් ලියන්නන්ගේ පොත් මුද්‍රණයට ගන්නා සමාගම්, ආයතන එම පොත්වලින් කෝටි ගණන් උපයන්නේ සොච්චම් කර්තෘභාග පිරිනැමීමෙනි. ඇතැම් ලේඛක, ලේඛිකාවන්ගේ පොත්වලින් චිත්‍රපට, ටෙලිනාට්‍ය නිෂ්පාදකයන් අනෙක් පසින් ධනය ඉපයීමට ලේඛකයන් සූරාකති. සාහිත්‍ය මාසය තුළ පොතක් එළිදක්වා සමාජයට යමක් දීමට දත කන ලේඛකයන්ට අත් වී ඇති ඉරණමයි ඒ. රුපියල් ශතවලට විකිණෙන සාහිත්‍ය කලාවේ මහිමයයි.

කියවීමට මාසයක් තිබේ. ඉතිරි මාස 11ම ඒ ගැන කියවමින් කල්ගත කෙරේ. ඇතැමුන්ට තමන්ගේ සමාජ තත්ත්වය විදහා පෑමට එක් අවස්ථාවකි සාහිත්‍ය මාසයේ පොත් ගැනීමට බුක්ෆෙයාර් යාම.

කියවීමේ මාසය නිර්මාණය කළේ කවුරුන් ද? මිනිසුන් කියවීමට මාසයක් ඉල්ලා සිටියේ නැත. සැප්තැම්බරය සාහිත්‍ය මාසය ලෙස නම් කරනු ලැබුවේ කියවන මිනිසුන් නොවේ. ලියන මිනිසුන් ද නොවේ. කියවීමේ මාසය නිර්මාණය කරනු ලැබුවේ කියවීමට හෝ ලිවීමට උනන්දුව නැති අය ඒ සඳහා උනන්දු කිරීමටය. එහෙත් අද ඉන් වාසි ලබාගන්නේ ලියන්නන්ද කියවන්නන්ද දෙපිරිසම සූරාකන්නට වෙර දරන සමාගම්ය. ඔවුන් ලාභය වෙනුවෙන් හරසුන් සාහිත්‍ය කෘති නිර්මාණය කළ අතර එම හරසුන් සාහිත්‍යය විකිණීමට වෙළෙඳපොළක්ද නිර්මාණය කළෝය. ඒවා මිල දී ගන්නා යාන්ත්‍රික පාරිභෝගිකයන්ද තොග පිටින් බිහි කිරීමටද එම වෙළෙඳ ධනපතීහු සමත් වූහ. සාහිත්‍යයේ හෙට දවස වෙනුවෙන් ඔවුන් කළ සේවාව එයයි. සාහිත්‍ය මාසය නම් එම යාන්ත්‍රික මිනිසුන්ගේ මවා ගත් සිහින සම්පාත කිරීම වෙනුවෙන් ධනපතීන් හා ධනපති ජනමාධ්‍යයන් විසින් නිර්මාණය කරන ලද වෙළෙඳපොළ බවට පත්කරගෙන තිබේ.

වඩා පරිකල්පනයෙන් හෙබි මිනිසෙකු බිහි කිරීම වෙනුවට හරසුන්, ඔළු මොට කරන සාහිත්‍ය නිර්මාණ වෙළෙඳපොළක් බිහිවීම අහම්බයක් නොවේ. උපායශීලීව කාලාන්තරයක් තිස්සේ කළ කී දෙයෙහි ප්‍රතිඵලයයි. ධනවාදය මිනිස් මොළය තුළ තම ආධිපත්‍යය පවත්වා ගැනීමට නම් ඔවුන්ට අවශ්‍ය දේ මිනිස් හිස් තුළ රෝපණය කළ යුතුය. රූපවාහිනීය, ගුවන් විදුලිය හා බහුතරයක් පුවත් පත් මෙන්ම සමාජ ජාල අඩවි මිනිස් මොළය වහල්භාවයට පත් කරන මෙවලම් වී තිබේ. ධනවාදයේ පැවැත්මට උත්තේජනය වන හරසුන් සංකල්ප පූරණය කරන ලද මිනිසුන් නිර්මාණය කිරීම ධනවාදී සාහිත්‍යයේ අරමුණයි.

අද සාහිත්‍ය මාසය ස්ටයිල්කරණය වී ඇත. එම විලාසිතාවට යටත්ව සමාජය යහපත් කිරීමට ලේඛකයා සතු ශක්‍යතාවය උරා ගන්නා ධනපතියෝ සාහිත්‍ය මාසයේ සාරය උරාගනිති. මල් කතා ලේඛකයන්ට පඳුරු ගාණට පොත් ලිවීමට බල කරනු ලැබුවේ තරුණ පරපුර කමකට නැති, හෙටට වැඩක් නැති උන් බවට පත් කිරීම සඳහාය. අද වන විට තාරුණ්‍යයට හෙටක් නැත. රටක් ද නැත. ඊට වගකිව යුත්තෝ තරුණ මොළ සෝදා හරසුන් උන්මාදයක ගිල් වූ උන්මය.

සාහිත්‍ය ප්‍රගමනයට නම් මාස දින නම් කළ යුතු නොවේ. ස්ටයිල්කරණයෙන් තොර පරිකල්පනීය තාරුණ්‍යයක් හා මිනිස් ප්‍රජාවක් නිර්මාණය කිරීමට නම් සාහිත්‍ය කලාව පෝෂණය කිරීම අතිශය ප්‍රමාණවත්ය. එයින් අලුත් හෙටක් අලුත් රටක් නිර්මාණය වනු නිසැක ය.

## පුවක් මල් පුදින්න කාලේ...

මේ පතොක් මල් පිපෙන කාලේ
රළු ම රළු
ගල් බොරළු පොළොවේ

පොහොණි වුණු
කොපුතුරෙහි මියෙනා
බීජ දළුලනු හැකි ද පොළොවේ

පුපුරනා සේ
රත් වූ කබලක
ඉරිඟු අබ ඇට
මුහුව ලුණු කැට

අපට අවැසිය
පුවක් මල් මෙන්
පීඩනය බිඳ
පුපුරනා යුග

ප්‍රේමරත්න තෙන්නකෝන්

## සිත්තමක කතාව



# දෙපලු වූ ශ්‍රීල.නි.ප.ය හා දේශපාලනයේ ගමන්මඟ

කවුරුන් පිළිගත්තද නැත්ද මේ වනවිට ශ්‍රීල.නි.ප.ය දෙපලු වී තිබේ. 2015 ජනාධිපතිවරණයෙන් මහින්ද පරාජයට පත්වීමත් සමඟ මෙම බෙදීම ආරම්භ විය. මුලදී දෙපිරිසම මෙම බෙදීම සඟවා තබා ගැනීමට කටයුතු කළහ. එහෙත් දැන් එය පැහැදිලිවම දෙපලු වී පාර්ශ්ව දෙක එනම් මෛත්‍රීපාල පිල හා මහින්ද පිල එකිනෙකාට එරෙහිව වාග් සංග්‍රාම කරන තත්වයට පත්ව තිබේ.

ලංකාවේ ප්‍රධාන ධනපති දේශපාලන පක්ෂ දෙකම 'ප්‍රධාන' යැයි පිළිගත්තද ඒවා විධිමත් පක්ෂ සංවිධාන නොවේ. ඒවායේ පක්ෂ ව්‍යවස්ථා, නිලධාරි මණ්ඩල, සම්මේලන ආදිය මවාපෑම් පමණි. මේවා බලය සහිත නායකයෙක් වටා ගොනු වූ බලලෝභය මත පදනම් වූ එකතූන්ය. මේවා ඉතිහාසය පුරාම පක්ෂ ලෙස පැවතී ඇත්තේ, රාජ්‍ය බලය දරන අවස්ථාවලය. එවිට පක්ෂ යාන්ත්‍රණය රාජ්‍ය යාන්ත්‍රණය මගින් ක්‍රියාත්මක කරන අතර බලයට කෑදරකම හා බිය නිසා සියල්ලෝ නායකයාට අවනතව වහල්ලු මෙන් සිටිති. එහෙත් බලය අහිමිවූ වහාම සංවිධාන යාන්ත්‍රණය අහිමිකර ගන්නා එය ඇමීබාවන් සේ බෙදී යාමට ලක්වෙති.

1977 ජයවර්ධන බලයට පත්වූ විට ශ්‍රීල.නි.ප.ය බිඳීගිය අතර සිරිමා බණ්ඩාරනායක හා මෛත්‍රීපාල සේනානායක කේන්ද්‍ර කරගනිමින් ශ්‍රීල.නි.ප.ය දෙකට බෙදුණි. සිරිමා පිල, මෛත්‍රී පිල, අනුර පිල ආදී පිල් රැසක් ඇතිවිය. පසුගිය කාලයේ එ.ජා.ප.යද පැවතුණේ බෙදීමට ලක්වය. රනිල් පිල, සජිත් පිල, කරු පිල, ආදී ලෙස පිල් බෙදුණි. දැන් බලය ගත් වහාම එම පිල් යටගොස් ආණ්ඩු යාන්ත්‍රණය තුළ එකට ක්‍රියාත්මක වේ. මෙය පොදු ස්වභාවය වී තිබේ. මේවා පක්ෂ නොව බලලෝභීන්ගේ රංචු ගැසීම් වන්නේ ඒ නිසාය.

අතීතයේ පැවති සිරිමා-මෛත්‍රී (සේනානායක) දෙපිල වෙනුවට දැන් මහින්ද-මෛත්‍රී (සිරිසේන) පිල් දෙකක් ශ්‍රීල.නි.ප.ය තුළ නිර්මාණය වී තිබේ. මෙහි විශේෂය වන්නේ, මෙවර බෙදීම වඩාත් ගැඹුරු හා පුළුල් වන අතර මෛත්‍රී රාජ්‍ය බලය සහිතවද, මහින්ද බිමේ පාක්ෂික බලය සහිතවද සටනට එළඹ තිබීමය. ඒ නිසා තවමත් 'විසිල් මිස බල්ටි නැති' තත්වයෙන් තිබුණද මෙම ගැටුම උත්සන්න වීමේ ලකුණු තිබේ.

මෙම ගැටුම ශ්‍රීල.නි.ප. අභ්‍යන්තර ගැටුමක් ලෙස සලකා පසෙක තැබිය නොහැකිය. ඒ මෙය ලංකාවේ දේශපාලන ගමන්මඟටත් ජනතාවටත් බලපාන නිසාය. පසුගිය වසර දෙස විමසිල්ලෙන් බැලූවිට පෙනී යන්නේ කුමක්ද? ඒ, මහින්දගේ කල්ලියත් මෛත්‍රීගේ කණ්ඩායමත් කටයුතු කර ඇත්තේ, රටේ හෝ ජනතාවගේ වුවමනාවන් සඳහා නොව තම බල වුවමනාවන් සඳහා බවය. මහින්ද කල්ලිය පන්සල් ගියේද, පොල් ගැසුවේද, පාගමන් ගියේද, පාර්ලිමේන්තුවේ ජෝගි නැටුවේද ජනතා ප්‍රශ්න වෙනුවෙන් නොව රාජපක්ෂවරුන්ගේ ආරක්ෂාව හා බලය වෙනුවෙනුත් මෛත්‍රී පිලට එරෙහිවීම සඳහාත්ය. මහින්ද කල්ලියේ පා ගමනේ සටන්පාඨ බොහොමයක් මෛත්‍රීපාල ජනාධිපතිවරයාට එරෙහිව තිබූ අතර ඔවුහු ශ්‍රීල.නි.ප. මූලස්ථානයට හූ කීමද කළෝය. ඒ, මෛත්‍රීට හූ කීම සඳහාය.

මේ අතර මෛත්‍රීපාල ජනාධිපතිවරයාද හවුල් ආණ්ඩුවේ වසර දෙකක කාලය වසර 05 දක්වා දිගුකළේත් ඇමති මණ්ඩලය ප්‍රමාණය ඉක්මවා වැඩිකරගනු ලැබුවේත් අලුත් ඡන්ද ක්‍රම හැදීමට උනන්දු වූයේත් ප්‍රාදේශීය සභා විසුරුවා හැර විශේෂ කොමසාරිස්වරුන් පත් කර ඒවා කල් දැමූයේත් ජනතාව සඳහා නොව පක්ෂය තුළ මහින්දගේ බලය දුර්වල කිරීමටත් තමන්ගේ බලය තහවුරු කර ගැනීමටත්ය.

වත්මන් හවුල් ආණ්ඩුව අතරමඟ නොවැටෙන බවත් එය වසර 05ම ශක්තිමත්ව ඉදිරියට යන බවත් රනිල් වික්‍රමසිංහටත් එහා ගොස් මෛත්‍රීපාල මහතා සහතික දෙන්නේ ඇයි? ඒ ආණ්ඩුව දිගට පවත්වාගෙන යාමෙන් තොරව එහි බලයේ පංගුවක් නියෝජනය කිරීමෙන් තොරව ශ්‍රීල.නි.ප. නායකත්වය තමන් වෙත තබා ගැනීමටවත් දැනට තමන් වටා සිටින පිරිස තමන් වෙතම තබා ගැනීමටත් නොහැකි බව ඔහු දන්නා නිසාය. මහින්ද කල්ලිය දුර්වල කිරීමේදී මෛත්‍රීපාල මහතා සතුව ඇති එකම 'අවිය' වී ඇත්තේ රාජ්‍ය බලයය. දැන් ඉන් නතර නොවී ආණ්ඩුවේ පළමු වසර පහෙන් පසුව තවදුරටත් ඉදිරියට යාම පිළිබඳ ඉඟිද මෛත්‍රීපාල මහතා පළකරමින් සිටී. මෛත්‍රීගේ රාජපක්ෂ විරෝධය කොතරම්ද යත් එ.ජා.ප.ය සමඟ වන හවුල් දීගය පළමු වසර 05න් පසුවද පවත්වාගෙන යාමට සිතීමට තරම් ප්‍රබල වී තිබේ.



ඒ අතර තම බලය සඳහා රාජපක්ෂ කල්ලියද බිමේ පාක්ෂික බලය එකතු කරමින් සිටී. පළාත් සභා, ප්‍රාදේශීය සභා මට්ටමේ පිරිස ඔහු වටා එකතුකර ගනිමින් සිටී. ශ්‍රීල.නි.ප. සමුළුව වර්ජනය කිරීමට සූදානමින් සිටී. මෛත්‍රී ඊට දුන් ප්‍රතිප්‍රහාරය වූයේ මහින්ද හිතවාදී දිස්ත්‍රික් හා ආසන සංවිධායකයින් ඉවත් කොට තමන්ට හිතවත් අය පත්කර ගැනීමය. මේ අතර රාජ්‍ය බලය ලබා ගැනීමේ කෙටි කාලීන ඉලක්කයෙන් තොරව තමා වටා සිටිනා පිරිස දිගටම තබාගත නොහැකි බව මහින්ද දනී. මේ ආණ්ඩුව ඉක්මනින් පෙරළා දමන බවට අතාර්කික වහසිබස් දොඩවන්නේ ඒ වෙනුවෙනි. පසුගිය දිනවල පවිත්‍රා වන්නිආරච්චි කියා තිබුණේ වසරකින් මේ ආණ්ඩුව පෙරළා මහින්දගේ නායකත්වයෙන් ආණ්ඩුවක් හදන බවය. මෙවැනි ප්‍රකාශ නිතර නිතර කීමෙන් පැහැදිලි වන්නේ, එවැනි සිහිනයක් නැතිව ඔවුනට පැවතිය නොහැකි බවය. ඔවුන් ඡායා කැබිනෙට්ටුවක් හැදුවේද එම සිහිනයට උදව් වීමටය.

වසරකින් වත්මන් ආණ්ඩුව පෙරළා මහින්දගේ නායක්වයෙන් ආණ්ඩුවක් හදන බව කීමෙන් පවිත්‍රා, ගීතා කුමාරසිංහගේ තත්වයටම වැටී තිබේ. ගීතාට රටේ ජනගහනය පිළිබඳ වැටහීමක් නැතිවාක් මෙන්ම නීතිඥ පවිත්‍රාටද රටේ ව්‍යවස්ථාව ගැන වැටහීමක් නැති බව පෙනේ. වත්මන් ව්‍යවස්ථාවට එක්කළ 19වැනි සංශෝධනයට අනුව වත්මන් පාර්ලමේන්තුව එහි නිල කාලය අවසන්වීමට පෙර විසුරුවා හැරීමට නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයකින් ඒ පිළිබඳ යෝජනාවක් සම්මත විය යුතුය. පාර්ලිමේන්තුව අතරමඟ විසුරුවා හැරීමට එ.ජා.ප.ය මෙන්ම ශ්‍රීල.නි.ප. මෛත්‍රී පිල සූදානම් නැත. එවිට මහින්ද රාජපක්ෂට ඒ සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක් සෙවීම කිසිසේත්ම කළ නොහැකි දෙයක් වනු ඇත. පාර්ලිමේන්තුව තුළම බලය ගැනීමටත් ඔවුනට 13ක් අවශ්‍යය. එවැනි බලයක් මහින්දට නැත. එබැවින් වසර දෙකකින් මහින්දගේ ආණ්ඩුවක් යනු හිත හදාගැනීමේ ප්‍රකාශයක් පමණක් වනු ඇත.

එය එසේ නොවේ නම් මහපාරට බැස ආණ්ඩුව පෙරළීමට තරම් ජන බලයක් මහින්දට තිබිය යුතුය. තමන්ගේ පක්ෂයේ බලය පවා අඩකින් අඩුවී තිබෙන මහින්දට එවැන්නක් සිතා බැලීමටවත් නොහැක. මින් සිදුවිය හැක්කේ වසරකින් ආණ්ඩුවක් හදා තනතුරු ඇමති ධුර ලබාගැනීටමත් හිරේ විලංගුවේ වැටීමෙන් මිදීමටත් සිහින දකිමින් සිටින පිරිස තම සිහිනය බිඳ වැටීම සමඟ මහින්ද අතහැර තම ආරක්ෂාව හා බලය වෙනුවෙන් පැති මාරු කිරීමට පටන් ගැනීමය.

1951දී බලය පිළිබඳ ප්‍රශ්නයක් නිසා එ.ජා.ප.යෙන් ඉවත්ව බණ්ඩාරනායකගේ නායකත්වයෙන් පිහිටුවාගත් ශ්‍රීල.නි.ප.ය ඉන් වසර 65කට පසු බලය පිළිබඳ ප්‍රශ්නය නිසාම යළි එ.ජා.ප.ය සමඟ එක්ව කටයුතු කිරීම ඉතිහාසයේ සරදමක් වී තිබේ. එම තත්වය විසින් ශ්‍රීල.නි.ප.ය කුමක්ද යන්නත් එහි අරමුණු මොනවාද යන්නත් එය විසින් රටට තහවුරු කර තිබේ. මෙම තත්වය රටට ජනතාවට බලපාන්නේ කෙසේද? අපට වැදගත් වන්නේ එයයි. ශ්‍රීල.නි.ප.ය බල අරගලය නිසා මෛත්‍රී කණ්ඩායමට හවුල් ආණ්ඩුව තුළම සිටීමට සිදුවන අතර සමහර විට ඉදිරි පළාත් පාලන හා පළාත් සභා මැතිවරණ හවුලේ තරඟවැදීමටද සිදුවෙනු ඇත. එවිට මෙම හවුල් ආණ්ඩුව එහි ප්‍රකාශිත අරමුණු වූ යහපාලනය ප්‍රජාතන්ත්‍රවාදය ආදිය වෙනුවට එහි සැබෑ අරමුණ වූ බලය වෙනුවෙන් කටයුතු කිරීම හොඳින් ප්‍රදර්ශනය කරනු ඇත. එහිදී සමහර හොරු අල්ලන අතර සමහර හොරුන්ට රැකවරණ හා වරප්‍රසාද ලැබෙනු ඇත. ආර්ථික අර්බුදයේ බර තව තවත් වැඩිවන අතර එම බර ජනතාව මතම පැටවෙනු ඇත; සහන කැපීම, පෞද්ගලීකරණය, ණය ගැතිබව, තව තවත් වැඩිවෙනු ඇත; ජනතාව පීඩාවට පත්වෙනු ඇත.

විධායක ක්‍රමය අහෝසි කිරීමේ පොරොන්දු සිහින බවට පත්වෙන අතර තමන්ගේ බලයට වාසි ලෙස ව්‍යවස්ථා වෙනස්කම් සිදුවෙනු ඇත. අවසන මේ හවුල් ආණ්ඩුව ජනතාවට එපාම වෙනු ඇත. එවැනි තත්වයක් තුළ ආණ්ඩු විරෝධී ජනතාවගේ වගකීම කුමක්ද? ශ්‍රීල.නි.ප. නායකයින් පාක්ෂිකයා ගැන හෝ පක්ෂය ගැන නොව තම තමන්ගේ බලය ගැන පමණක් සිතන අය යන්න දැන්වත් ශ්‍රීල.නි.ප. බිමේ පාක්ෂිකයා,

15 වැනි පිටුවට

" මහපාරට බැස ආණ්ඩුව පෙරළීමට තරම් ජන බලයක් මහින්දට තිබිය යුතුය. තමන්ගේ පක්ෂයේ බලය පවා අඩකින් අඩුවී තිබෙන මහින්දට එවැන්නක් සිතා බැලීමටවත් නොහැක. මින් සිදුවිය හැක්කේ වසරකින් ආණ්ඩුවක් හදා තනතුරු ඇමති ධුර ලබාගැනීටමත් හිරේ විලංගුවේ වැටීමෙන් මිදීමටත් සිහින දකිමින් සිටින පිරිස තම සිහිනය බිඳ වැටීම සමඟ මහින්ද අතහැර තම ආරක්ෂාව හා බලය වෙනුවෙන් පැති මාරු කිරීමට පටන් ගැනීමය."



"පවත්නා තත්වයේ හරය අනුව පෙනෙන්නේ, රාජ්‍ය බලය දරා සිටින මෙම අලුත් බලවතුන් පරාජය කළ හැක්කේ විප්ලවවාදී පොදු ජනතාව විසින් පමණක් බවත්, එම ජනතාව ක්‍රියාකාරීත්වයට ගෙන ඒම සඳහා නිර්ධන පංති නායකත්වය ඔවුන්ට ලැබෙන්නට සැලැස්වීම පමණක් නොව, විප්ලවයේ සත් ව්‍යාපාරය පාවාදුන් සමාජවාදී-විප්ලවවාදී සහ මෙන්ෂෙවික් පක්ෂ ජනතා පිටුපෑමට බඳුන් වීමද අවශ්‍ය බවත් වේ."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**5වැනි වෙළුම,**
**183 පිට**

# ජනතාව සමඟ සංවාදයකට මුල පුරමින්



කුරුළපනටද, ගාල්ලටද, අපට පසුගිය අප්‍රේල් මාසය පුරා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි ප්‍රමුඛ ප්‍රවෘත්තිය වූයේ එයයි. ඒ බිඳී ගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද සහ මෛත්‍රී පාර්ශවයන් මැයි දින රැලි පවත්වන ස්ථාන සහ එයට සහභාගි වන්නන් පිළිබඳ සංවාදයයි. පසුගිය අගෝස්තු මාසයේ අග භාගයේදීද මාධ්‍යන්හි ප්‍රමුඛ ප්‍රවෘත්තිය වූයේ කුරුණෑගලට යන්නේද? නොයන්නේද? පිළිබඳ සංවාදයයි. ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 65 වන සමුළුව පදනම් කර ගනිමිනි.

රාජපක්ෂ පාලනය තුළ මෙන්ම යහපාලනය තුළද රට ආර්ථික වශයෙන් මෙන්ම සාමාජීය වශයෙන්ද ගැඹුරු අගාධයක් කරා ඇදවැටෙමින් පවතිද්දී, දිනපතාම රට තුළ පවතින ක්‍රමයට එරෙහි සටන් මෝදු වෙමින් පැමිණෙද්දී රටේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යය ජාලයන් එවැනි මාතෘකා යට ගසමින් කුරුණෑගලට යන්නේද? නොයන්නේද වැනි නිෂ්ඵල සංවාද ජනතාව මත පටවමින් සිටී.

මෙවන් වටපිටාවක් තුළ ජනතා විමුක්ති පෙරමුණ රට මුහුණදී සිටින සැබෑ තත්වය සහ එයට විසඳුම් සම්බන්ධයෙන් ජනතාව සමග පුළුල් සංවාදයක් ඇති කර ගැනීමේ වුවමනාවෙන් පසු ගිය අගෝස්තු මාසයේදී ගෙන්ගෙට යාමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී.

මෙම වැඩපිළිවෙලේ පියවරක් ලෙස පසුගිය අගොස්තු 28 වෙනිදා කොළොන්නාව ආසනයේ කොහිලවත්ත ප්‍රදේශයේදී බස්නාහිර පළාත් සභා මන්ත්‍රී සුනිල් වටගල සහෝදරයාගේ මූලිකත්වයෙන් ගෙන් ගෙට ගොස් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණි.

# විශ්වවිද්‍යාල ආදි විද්‍යාර්ථීන් මුණගැසී



රටේ ජනතාව හෙම්බත් වී සිටී. රාජපක්ෂ එළවා දැමීමෙන් පසු ජනතාව බලාපොරොත්තු වූ දේ යහපාලනයෙන් ඉටු නොවන බව ජනතාව තේරුම් ගෙන හමාරය. 'මහින්දගේ කඩේ බඩු කල්පැන ඇති බවටත් සිරිසේනගේ කඩේ බඩු ෂුවර් නැති' බවටත් එදා ජ.වි.පෙ. පවසද්දී බොහෝ දෙනා එයට එකඟ වූයේ නැත. එහෙත් ජ.වි.පෙ. එදා කී දෙයෙහි සත්‍යතාවය අද වන විට වඩාත් තහවුරු වෙමින් තිබේ.

රාජපක්ෂ බලයෙන් පහ කිරීමේ කාර්යය සඳහා මෙරට සිවිල් සංවිධාන මෙන්ම විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, විවිධ ක්ෂේත්‍රයන්හි වෘත්තිකයන්, වෛද්‍යවරුන්, නීතීඥයන් ආදීහුද ප්‍රමුඛ කාර්ය භාර්යයක් ඉටු කළහ. ඔවුන් පාලන වෙනසකින් බලාපොරොත්තු වූ ප්‍රධානතම කරුණක් වූයේ, වංචාකරුවන්ට, දූෂකයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කර වීමයි. නමුත් යහපාලන ආණ්ඩුවෙන් සිදු නොවන්නේද එම කාරණයයි. ආණ්ඩුවේ මේ නොහැකියාව සහ හිතාමතාම දූෂකයන්ට නිදල්ලේ තබන දේශපාලනය සඟවා නීති ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු සිදුකරන ආයතන සහ එම නිලධාරීන්ගේ වරදක් ලෙස හුවා දැක්වීමට ආණ්ඩුවේ ආධාර ලබන ඇතැම් සිවිල් සංවිධාන ක්‍රියාකාරීහු පෙළ ගැසී සිටිති.

මෙවෙනි තත්වයක් තුළ ජ.වි.පෙ. රටේ දේශපාලනය පිළිබඳ සැබෑ තතු ජනතාවට පැහැදිලි කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කර ඇත. ඒ හා සමගාමීව දැනට විවිධ ක්ෂේත්‍රයන්හි රැකියාවල නියුතු විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපනය ලැබූ ආදි විද්‍යාර්ථීන් සමඟ සංවාදයක් ඇති කර ගැනීමේ වැඩපිළිවෙළක්ද ජ.වි.පෙ. විසින් ආරම්භ කරන ලදී. ඒක් එක් විශ්වවිද්‍යාල මට්ටමින් මෙය ක්‍රියාත්මක වීම ආරම්භ කර ඇති අතර පසුගිය අගොස්තු මස 21වැනිදා රුහුණු විශ්වවිද්‍යාලයේ ආදී විද්‍යාර්ථීන්ගේ එම හමුව මාතර පාලටුව එන්.එච්.කේ. උත්සව ශාලාවේදී පැවැත්විණි.

ජ.වි.පෙ. නායක අනුර දිසානායක,ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් මෙය පැවැත්වුණු අතර මෙහිදී පැමිණි සිටි පිරිස සමග වඩා සජීවී දේශපාලන සංවාදයක් ගොඩ නගා ගැනීමට ජ.වි.පෙ.ට හැකි විය.

# ETCA ට එරෙහිව

ETCA ගිවිසුම පිළිබඳ කථිකාව මේ වන විට යම් පමණකට යටපත් වී තිබේ. එයින් අදහස් කරනුයේ ඉන්දියාව තම අදහස අතහැර ඇති බව නොවේ. ඉන්දියාව මේ ආකාරයට දශක කිහිපයකට සිටම නොයෙක් ආකාරයේ ආර්ථික ගිවිසුම්වලට මෙරට හිර කිරීමේ උත්සාහයක නිරත වෙමින් සිටී. 1998 වසරේදී ඉන්දියාව විසින් නිදහස් වෙළඳ ගිවිසුමකට (FTA) මෙරට ඇදා ගන්නා ලදී. මේ ආකාරයට සැප් ගිවිසුමටද මෙරට ඇදා ගැනීමට උත්සාහ කළද ජනතා විරෝධය හමුවේ එයට අත්සන් කිරීමට මෙරට පාලකයන්ට නොහැකි විය. මේ තත්වය ඉන්දියාව තම උපක්‍රම සීරු මාරු කරමින් ETCA නමින් නව ගිවිසුමක් යහපාලන ආණ්ඩුවට ඉදිරිපත් කර ඇත.

මෙරට බොහෝ සංවිධාන ක්‍රියාකරනු ලබන්නේ උණුසුමත් සමගය. රැල්ල පැමිණි විට ඔවුන් ක්‍රියාත්මක වේ. ජ.වි.පෙ. සහ වෙනත් සංවිධානය අතර තිබෙන ප්‍රධාන වෙනසක් වන්නේත් එයයි. මේ වන විට ETCA පිළිබඳ කථිකාව සමාජය තුළ බොඳව ගියද ජ.වි.පෙ. එයට එරෙහිව හඬ නැගීම නවතා නොමැත. පසුගිය අගෝස්තු 03 වැනිදා ජ.වි.පෙ. වෘත්තිය සමිති ව්‍යාපාරයේ මෙහෙය වීමෙන් ETCA පැරදවීමේ වෘත්තිය සමිති නියෝජිත හමුවක් කොළඹ දුම්රිය මූලස්ථාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. රටේ ප්‍රධාන වෘත්තීය සමිති නියෝජනය කරමින් නියෝජිතයින් ගණනාවක් මෙයට සහභාගි වූ අතර ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල්කාන්ත, අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ, ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ යන සහෝදරවරුන් ප්‍රධානත්වයෙන් මෙය පැවැත්විණි.




# විගණන පනත බලාත්මක කරගැනීම වෙනුවෙන්



වංචාවට දූෂණයට එරෙහි සැබෑවට හඬ නගන්නේ, ජ.වි.පෙ. පමණක් බව මේ වන විට රටේ ජනතාව තේරුම් ගෙන අවසානය. එනිසාම රටේ බොහෝ දෙනා එවැනි සිදුවීම් පිළිබඳව දැනුම් දෙනු ලබන්නේ ජ.වි.පෙ.ටය. පසුගිය අගෝස්තු මස 06 වෙනිදා බත්තරමුල්ල, පැලවත්තේ පිහිටි ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලය වෙත විගණන දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ වෘත්තීය සමිති සම්මේලනයේ නියෝජිතයෝ පිරිසක් පැමිණියහ. ඒ ජාතික විගණන පනත ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා සමග සාකච්ඡා කිරීමටය.

2003 වසරෙදි පමණ මෙම විගණන පනත කෙටුම්පත් කර ඇති අතර 2015 මාර්තු 19වැනි දින මෙම පනත සම්මත කරන බවට දින සියයේ ආණ්ඩුව පොරොන්දු වී තිබුණි. මෙම සාකච්ඡාව පවත් වන විට විගණන සේවා කොමිසමද පිහිටුවා මාස 07ක් පමණ ඉක්ම ගොස් තිබිණ.

ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක වෙනුවට මෙම සාකච්ඡාව සඳහා ජ.වි.පෙ. තෝරාගැනීමට එම වෘත්තීය සමිති සම්මේලනයේ නියෝජිතයින්ට බල කරනු ලැබුවේ මේ මොහොත වන විට වංචාවට සහ දූෂණයට එරෙහිව පාර්ලිමේන්තුව තුළත් එයින් පිටතත් ජ.වි.පෙ. නගන හඬ විය හැක. මෙම සාකච්ඡාව සඳහා වෘත්තීය සමිති සම්මේලනයේ කැඳවුම්කරු ලලිත් අඹන්වෙල මහතා ඇතුළු නියෝජිතයෝ රැසක් සහභාගි වී සිටියහ.

දැනුම සමාජය හා චින්තනය 08

# දැනුම තුළ අසත්‍යය සමාජයට හානි කරන හැටි



මිනිසාගේ චින්තනය තුළ ප්‍රකෘතිය හා එහි නියාම නිවැරදිවත් අංග සම්පූර්ණවත් පරාවර්තනය නොවන්නේ නම් හා ඒ වෙනුවට ඔහුගේ චින්තනය තුළ පරාවර්තනය වන්නේ ප්‍රකෘතියේ විකෘති කරන ලද හා මනඃකල්පිත පිළිබිඹුවක් නම් එම දැනුම සත්‍ය නොවේ. එය අසත්‍යය වේ; මිථ්‍යාවක් වේ. එවැනි අසත්‍යයන්, මිථ්‍යාවන් විශ්වාස කිරීම නිසා සමාජයක් තුළ බරපතළ අර්බුදයක් හටගනී. එක් අතකින් එය විද්‍යාවේ වර්ධනයට, සමාජ සංවර්ධනයට, මානව වර්ගයාගේ ප්‍රගමනයට හානි කරන අතර අනෙක් අතින් මිනිසුන්ගේ එදිනෙදා පෞද්ගලික ජීවිතයේදීත් සමාජ ජීවිතයේදීත් පුද්ගලයන්ට මෙන්ම සමාජයටද හානි කරයි.

**හානියේ තරම**

පුද්ගල විඥානය තුළ මෙන්ම සමාජ විඥානය තුළ පවතින මිථ්‍යාවන් පුද්ගලයන්ටත් සමාජයටත් සිදුකර ඇති හානියත් තවමත් සිදුකරමින් සිටින හානියත් සුළුපටු නොවේ. මෙම හානි හා අනතුරු සිදුවන්නේ විද්‍යාව නොමැති යුගයක නම් එහි කිසියම් සාධාරණත්වයක් තිබේ. එහෙත් විද්‍යාවේ දැවැන්ත වර්ධනය අභිමුව සිට සත්‍යය දැක දැක මිථ්‍යාව වැළඳගෙන තමන්ටත් තම ඥාති හිතවතුන්ටත් සමාජයටත් හානි කරන අය බොහෝය. ඒ පිළිබඳ උදාහරණද බොහෝය. මිථ්‍යාව නිසා එක් එක් පුද්ගලයන්ට සිදුවූ හානි පිළිබඳ උදාහරණ කිහිපයක් අප මීට පෙර සඳහන් කළෙමු. එකී පුද්ගල හානිවලට වඩා ප්‍රබල වන්නේ මිථ්‍යාව නිසා සමාජයට සිදුවන හානියයි. එය මිනිය නොහැක. ලොව පුරා පැතිරයන ඒඩ්ස් රෝගය සමාජ ඛේදවාචයක් වී තිබේ. මෙම රෝගය පැතිර යන්නේ ලිංගික ක්‍රියාකාරකම් හෝ රුධිරය මගින් හෝ මවගෙන් දරුවන්ට ආදී වශයෙනි. විද්‍යාව මෙතරම් දියුණුව තිබියදීත් ධනවාදී ලෝකය මේ සඳහා ඖෂධ සොයාගැනීමට දක්වන උනන්දුව ප්‍රමාණවත් නැත. එය පසෙක තැබුවත් මෙම රෝගය වැඩිපුරම බෝවන්නේ අප්‍රිකාව, ලතින් ඇමරිකාව, ආසියාව වැනි දිළිඳු හා නූගත්කම වැඩිපුර ඇති රටවලය. දුප්පත්කම මෙන්ම ප්‍රජනන පද්ධතිය පිළිබඳ මිනිසුන්ගේ ඇති නොදැනුවත්කම් හා රෝගය පිළිබඳ නොදන්නාකම, නොසැලකිල්ල මෙම රෝගය ව්‍යාප්ත වීමට හේතුවන බව පැහැදිලිය. මිනිසා තුළ වන අවිද්‍යාව සමාජ ව්‍යසනය දක්වා ගමන් කරන්නේ එසේය.

එසේම ඈත අතීතයේ සිටම ශරීරයේ ඉන්ද්‍රියන්ගේ ක්‍රියාකාරිත්වය ගැන මිනිසාට නිවැරදි දැනුමක් තිබුණේ නැත. අතීතයේදී මිනිසුන් කල්පනා කළේ සිතුවිලි හා අදහස් එන්නේ හදවතින් බවය. එය අවිඥානිකව අද පවා තිබේ. එහෙත් සිතිවිලි හා හදවත අතර කිසිදු සම්බන්ධයක් නොමැති අතර සිතිවිලි හා චින්තය මිනිස් මොළයේ ගුණයකි. මෙහිදී මිනිසුන්ගේ දැනුමින් වඩාත් දුරස්තර වූයේ ප්‍රජනන පද්ධතිය පිළිබඳ දැනුමයි. සදාචාරමය හේතු මත ඒ පිළිබඳ කථා නොකරන ලදී. එබැවින් එහි විද්‍යාව වෙනුවට මිථ්‍යාවන් රජවිය. මේ පිළිබඳව තිබූ මිථ්‍යාවන් නිසා පවුල තුළ කාන්තාවන් බොහෝ පීඩාවට පත්වූහ. පැරණි කෘෂිකාර්මික ආර්ථිකය මත පැවති සමාජයේදී පවුලකට දරුවන් රැසක් අවශ්‍යවූ අතර ඉන් වැඩි වටිනාකම තිබුණේ පිරිමි දරුවන්ටය. රජකම දුන්නේද පිරිමි දරුවෙකුටය. ආර්ථිකයේදීද පිරිමි ශ්‍රමය අත්‍යාවශ්‍ය වූ අතර ගැහැණු දරුවන් පවුලකට 'බරක්' ලෙස සලකන ලදී. ඒ විවාහයේදී දෑවැදි දීමට සිදුවීම, ආරක්ෂා කිරීමේ වගකීම ආදිය නිසාය. මේ නිසා අතීතයේ පවුලකට පිරිමි දරුවන් සිටීම වාසියක් හා වාසනාවක් ලෙස සලකන ලදී. අද පවා මෙම අදහස තිබේ. මෙහිදී ගැහැණු දරුවන් පමණක් ලැබීම හා පිරිමි දරුවන් නොලැබීම පිළිබඳ වගකීම මුළුමනින්ම පැවරුණේ කාන්තාවටය. තමන්ට පිරිමි දරුවෙකු ලබාදීමට නොහැකිවීම නිසා කාන්තාවන් පවුල තුළ අවමානයට, අඩම්තේට්ටම්වලට ලක්වූ අතර පුරුෂයා විසින් ඇය අත්හැර දැමීම හෝ දික්කසාද කිරීමද සිදුවුණි. රජවරුද පුත් කුමරෙක් නොමැති නිසා අගබිසව ඉවත්කර ඒ වෙනුවට වෙනත් කුමරියක් සරණපාවා ගත් අවස්ථා ඉතිහාසයේ ඇත. කාන්තාව මේ සියලු ගැහැටවලට ලක්වූයේ එක් මිථ්‍යාවක් නිසාය. ඒ දරුවන්ගේ ගැහැණු පිරිමි බව තීරණය වන්නේ, කාන්තාව මත යයි තිබූ වැරදි විශ්වාසයය. එහෙත් විද්‍යාව ඔප්පුකර ඇත්තේ, එහි ප්‍රතිවිරෝධයයි. උපදින දරුවාගේ ගැහැණු පිරිමි බව තීරණය වන්නේ ස්ත්‍රිය මත නොව පුරුෂයා මතය යන්න එම සත්‍යයයි. එම සත්‍යය නොදැන සිටීම නිසා ස්ත්‍රිය සමාජයක් තුළ ඉතිහාසයක් පුරා මුහුණ දුන් ඛේදජනක අත්දැකීම විශාලය. වඳබව පිළිබඳවූ සමාජ මතයද මෙලෙසම වැරදිය.

> යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම්, ආගමික විශ්වාස, කේන්ද්‍ර ආදියේ සිට ජාතිවාදය වර්ගවාදය දක්වා සියලු මිථ්‍යාවන් අවසානයේ සේවය කරමින් සිටින්නේ කාටද? ඒ මානව වර්ගයාට හෝ මානව සමාජයට නොවේ; එය සේවය කරන්නේ වත්මන් ලෝක ධනවාදයට හා ප්‍රතිගාමීත්වයටය. එය සමාජ සංවර්ධනයට, සමාජ ප්‍රගතියට බාධා බවට, විලංගු බවට පත්ව තිබේ.

**ම්ලේච්ඡත්වය කරා...**

දැනුම තුළ අසත්‍යය පැවතීම නිසා සිදුවන විශාලතම සමාජමය හානිය වන්නේ එය සමාජ සංවර්ධනයට බාධා කිරීමයි. ජනතාවගේ සමගියට, විශේෂයෙන් පංතියේ සමගියට බාධා කිරීමයි. මේ නිසා සමාජය අනාගතයට, ප්‍රගතිය වෙත යනවා වෙනුවට අතීතයට ම්ලේච්ඡත්වයට ආපසු යාමට පටන්ගෙන තිබේ. එක් මිනිස් කණ්ඩායමක් තවත් මිනිස් කණ්ඩායමකට වඩා උසස් යයි සැලකීම මෙහි බරපතළම ප්‍රශ්නය වී තිබේ. ජාතිවාදය උපත ලබන්නේ සමාජ පීඩනය හා අසමානතාවය තුළ වුවත් ජාතිවාදී ගැටුම්වලට අවශ්‍ය මතවාදය සකසන්නේ ඉහත මිථ්‍යාවය. මානව වර්ගයා ලොව පුරා විවිධත්වයක් තුළ ජීවත් වුවද සියලුම ජනතාවන් එක් මූලයකින් එනම් හෝමෝ සේපියන් නම් මානව විශේෂයෙන් පැතිරී ගිය බවට වන සත්‍යය තහවුරු නොවීමත් විශ්වාස නොකිරීමත් නිසා මිනිසුන් එකිනෙකා හා සටන්කොට කොතරම් දේපළ හා මිනිස් ජීවිත ප්‍රමාණයක් විනාශකර තිබේද? තවමත් එම විනාශය සිදුවෙමින් තිබේ.

මිහිතලය මත මිනිසුන් කෝටි 05ක් මරා දැමූ දෙවන ලෝක යුද්ධය බිහිවීමේ සැබෑ හේතුව අධිරාජ්‍යවාදීන් අතර ලෝකය බෙදා ගැනීම සඳහා වූ තරගය වුවත් එම යුද්ධය ආරම්භ කිරීමට හිට්ලර් යොදාගනු ලැබුවේ ජර්මන්වරු (ආර්යයන්) උතුම් ජන කොටසක්ය යන මතය හා ලොව පාලනය කළ යුත්තේ ඔවුන් විසින්ය යන මතයය. එම මිථ්‍යාව ජර්මානුවෝ විශ්වාස කළෝය. එම මහා විනාශය කිරීමට හිට්ලර්ට හැකිවූයේ ඒනිසාය. එවන් නාසිවාදීහු යුරෝපයේ තවමත් සිටිති.

**සුදු-කළු භේදයේ මිථ්‍යාව**

ලොව ජාතිවාදය තරම්ම සුදු කළු භේදයද විශාලය. එය තවමත් පවතී. මේ නිසා ලොව තුළ කළු මිනිසුන් විඳි දුක් කරදර අප්‍රමාණය. ඒ පිටුපස පවතින්නේද කළු මිනිසුන්ට වඩා සුදු මිනිසා උතුම්ය යන මිථ්‍යාවයි. පරිණාමයේදීම සුදු මිනිසා වඩා දියුණු අවධියකත් කළු මිනිසා වඩා නොදියුණු අවධියකත් සිටින්නේය යන්න ඔප්පු කිරීමට සුදු මිනිසුන් විසින් කළු ජාතික වහලුන් විවිධ පරීක්ෂණයන්ට පවා භාජනය කරනු ලැබුවේ විද්‍යාගාර මීයන් සේ සලකාය. දකුණු අප්‍රිකාව තුළ වර්ණභේදවාදී පාලනයන් පවත්වාගෙන ගිය අතීතයක් ලොව තුළ තිබිණි. අප්‍රිකාව තුළ විවිධ ගෝත්‍ර අතර පවතින සටන් තුළ ඇත්තේද මෙවැනිම මිථ්‍යාවන්ය. ආගම වෙනුවෙන් සටන්කර මියැදෙන්නා එවේලේම ස්වර්ගය වෙත, දෙවියන් වෙත යන්නේය යන මිථ්‍යා විශ්වාසය නිසා කුරුස යුද්ධවල සිට දැනට සිදුකරන අයි.එස්.අයි.එස්. ත්‍රස්තවාදීන්ගේ ඝාතන දක්වා කොතරම් මිනිසුන් එකිනෙකා මරාගෙන ඇත්ද? යටත්විජිතවාදීන් භූමිය අත්පත්කරගැනීමේ තම අවශ්‍යතාවය සඳහා වූ ආවරණයත් උත්තේජනයත් ලබා ගත්තේ මෙම මතය මගිනි. මේ අනුව මිථ්‍යාවන් සමාජය රැගෙන යමින් තිබෙන්නේ ම්ලේච්ඡත්වය කරාය. නූතන අධිරාජ්‍යවාදය ලෝකය බෙදා පාලනය කිරීම සඳහාත් ලොව ජාතීන් දුර්වල කොට පාගාගෙන එම රටවල සම්පත් කොල්ලකෑම සඳහාත් පන්ති අසමග ිය ඇතිකිරීම සඳහාත් මෙම වාර්ගික, ආගමික මිථ්‍යාවන් හොඳින්ම ප්‍රයෝජනයට ගනිති. සැබැවින්ම ජාතිය, ආගම, කුලය, වර්ගය ආදිය පිළිබඳ වන මිථ්‍යාවන් සේවය කර තිබෙන්නේ මිනිසාට නොව අධිරාජ්‍යවාදීන්ටය; පාලක පංතීන්ටය.

මිනිසුන් විවිධ ස්ථරවලට බෙදා යටත්කර ගැනීම අතීතයේ සිට පැවත එන්නකි. ඉන්දියාවේ බ්‍රහ්ම මැවීම තුළ මෙය සාධාරණය කරගැනිණි. ඒ අනුව පුරාණ ඉන්දියාවේ ජනතාව ප්‍රධාන ස්ථර 04කට බෙදන ලදී. ඒ බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, හා ශුද්‍ර ලෙසය. ඊට ආගමික මුහුණුවරක්ද දෙන ලදී. ඒ අනුව මිනිසුන් මවනු ලැබුවේ මහා බ්‍රහ්මයා විසින් බව පවසන ලදී. එහිදී ඔහු සිය සිරසෙන් (හිසෙන්) බ්‍රාහ්මණයින්ද, උරහිස ප්‍රදේශයෙන් ක්ෂත්‍රීයන්ද උකුල ප්‍රදේශයෙන් වෛශ්‍යයන්ද දෙපතුළෙන් ශුද්‍රයන්ද මැවූ බව පවසා ශුද්‍රයන් පීඩාවට පත්කරන ලදී. නවීන විද්‍යාව සමග මෙම මැවුම්වාදයන් බිඳවැටී ඇතත් තවමත් ඉන්දියාවේත් ආසියානු රටවලත් මීට සමාන ලෙසින් මිනිසුන් වර්ග කොට පීඩාවට ලක්කරමින් සිටිති. ඒ නිසා සමාජයේ ඇති මිථ්‍යාවන් වෙනුවෙන් මානව සමාජය ගෙවා ඇති වන්දිය විශාලය.

**සමාජ සංවර්ධනයට බාධාවක්ව**

යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම්, ආගමික විශ්වාස, කේන්ද්‍ර ආදියේ සිට ජාතිවාදය වර්ගවාදය දක්වා සියලු මිථ්‍යාවන්

15වැනි පිටුවට



"ඉගෙන ගැනීම ලෙහෙසි කාරණයක් නොවන අතර, යමෙක් ඉගෙන ගත් දේ ක්‍රියාවට නැගීම ඊටත් වඩා දුෂ්කරය. පංති කාමරයක් තුළදී හෝ පොත්පත්වලින් යුද විද්‍යාව ගැන කථා කිරීමේදී බොහොම දෙනෙක් චමත්කාරජනකය. එහෙත් ඇත්තටම සටන් කිරීමට පැමිණි විට, සමහරු සටන් දිනති. අනිත් අය පරදිති. යුද්ධය පිළිබඳ ඉතිහාසයෙන්ද අපේම අත්දැකීමෙන්ද යන දෙකෙන්ම මෙම කාරණය ඔප්පුකර තිබේ."

**මාඕ සේ තුං**
**තෝරාගත් කෘති,**
**1 වෙළුම,**
**206 පිටුව**

# ආසියානු කලාපය: ලෝක දේශපාලනයේ ප්‍රතිවිරෝධතාවන්ට මැදිවී

මෑද පෙරදිග, අප්‍රිකාව, යුරෝපය මෙන්ම ආසියාව තුළද ලෝක දේශපාලනයේ ප්‍රතිවිරෝධතා පෙරට වඩා තීව්‍ර ලෙස පෙන්නුම් කරන්නට පටන් ගෙන තිබේ. එය මැදපෙරදිග තරමටම උණුසුම් නැතත් එවැනි තත්වයකට පවා වර්ධනය විය හැකි සිදුවීම් පෙළක් ආසියාව තුළ සිදු වෙමින් තිබේ. මේ වන විට ලෝක බල තුලනය හා සම්බන්ධ ගිනි ඇවිලෙන සුළු ප්‍රධාන ප්‍රශ්න තුනක් ආසියානු කලාපය තුළ අපට දක ගත හැකිය. මෙම ප්‍රශ්න තුනකට එක් අතකින් චීනයත් අනෙක් අතින් එක්සත් ජනපදයක් සම්බන්ධය. එම ප්‍රශ්න තුන සරලව දක්වන්නේ නම් මෙසේය.

- දකුණු කොරියාව එක්සත් ජනපදය සමඟ එක්ව උතුරු කොරියානු පහරදීමකදී මුහුණදීම සඳහා මිසයිල ආරක්‍ෂණ පද්ධතියක් ගොඩනැගීමට සූදානම් වීම
- දකුණු චීන මුහුදේ ඇති දූපත් පිළිබඳ වියට්නාමය, පිලිපීනය සහ චීනය අතර ගොඩනැගී ඇති ගැටලු
- ජපානයේ නව ආරක්‍ෂක ධවල පත්‍රිකාව සහ ජපානය සහ චීනය අතර ඇති මතභේද

### THAAD මිසයිල ආරක්‍ෂක පද්ධතිය

එක්සත් ජනපදය පසුගිය ජූලි 08 වෙනිදා නිවේදනය කළේ තමන් දකුණු කොරියාව සමඟ එක්ව THAAD මිසයිල ආරක්‍ෂක පද්ධතිය ගොඩ නැගීම ආරම්භ කරන බවයි. මෙම මිසයිල ආරක්‍ෂක පද්ධතිය 2017 වසරේ අග සිට ක්‍රියාත්මක වේ. මෙලෙස මිසයිල ආරක්‍ෂක පද්ධතියක් දකුණු කොරියාව තුළ ස්ථාන ගත කිරීමට හේතු වශයෙන් දක්වන්නේ උතුරු කොරියාවේ න්‍යෂ්ටික වැඩපිළිවෙළත් විශේෂයෙන්ම බැලස්ටික් අන්තර් මහද්වීපික මිසයිලවලින් ආරක්‍ෂා වීම සඳහා මෙවැන්නක් ගොඩනගන බවයි.




මෙම THAAD මිසයිල ආරක්‍ෂක පද්ධතිය සකසා ඇත්තේ සාපේක්‍ෂව ඉහළ මට්ටමින් එන අන්තර් මහාද්වීපික බැලස්ටික් මිසයිල අතරමගදී විනාශ කර දැමීම සඳහාය. එහෙත් දකුණු කොරියාවට පහරදීම සඳහා උතුරු කොරියාවට අවශ්‍ය වන්නේ කෙටි දුර රොකට් සහ සාම්ප්‍රදායික අවිය. එබැවින් උතුරු කොරියාවෙන් සිදු කරන පහරදීමකදී මෙම මිසයිල ආරක්‍ෂක පද්ධතියේ ප්‍රයෝජනය අවම වනු ඇත. තවද මෙම මිසයිල ආරක්‍ෂක පද්ධතියට 200kmක පමණ දුරකදී මිසයිල විනාශ කර දැමිය හැකිය. එක්සත් ජනපදය මෙම මිසයිල ආරක්‍ෂක පද්ධතිය ස්ථාපිත කිරීමට සූදානම් වන්නේ දකුණු කොරියාවේ සෝල් නගරයට 300kmක් ගිනිකොණ දිගට වන්නටය. එනම්, දකුණු කොරියානු දේශ සීමාවෙන් බොහෝ ඈත ස්ථානයකය. ඉන් අදහස් වන්නේ එමගින් රටේ වැඩිම ජනගහණයක් වෙසෙන ප්‍රධානතම ප්‍රදේශයකට ඉන් ආරක්‍ෂාව නොසැලසෙන බවයි. අනෙක් අතට මෙම මිසයිල ආරක්‍ෂක පද්ධතියට 2000kmක පමණ ඉදිරි නිරීක්‍ෂණ පරාසයක් ඇත. එනම් එක්සත් ජනපදයට මෙමගින් චීනයේ හා රුසියාවේ තොරතුරු ද දැනගැනීමට අවස්ථාව උදාවේ.

THAAD මිසයිල ආරක්‍ෂක පද්ධතිය ස්ථාපනය කරන බවට එක්සත් ජනපදය නිවේදනය කිරීමත් සමඟ කලාපයේ ආරක්‍ෂාව පිළිබඳව සහ මතුවෙමින් පවතින තත්වය පිළිබඳ චීනය හා රුසියාව අතර සාකච්ඡා ඇරඹුණි. එහි හතරවන වටයේ සාකච්ඡාවලින් පසු එනම් ජූලි 29 වැනිදා චීනයත් රුසියාවත් ඒකාබද්ධ ප්‍රකාශයක් කරමින් කියා සිටියේ යෝජිත මිසයිල ආරක්‍ෂක පද්ධතිය ආසියානු කලාපයේ අසල්වැසි රටවල උපක්‍රමික ආරක්‍ෂාවට බරපතළ තර්ජනයක් බවයි. මේ තත්වය තුළ රුසියාව සහ චීනය අතර ලෝක උපක්‍රමික ස්ථායීතාව සම්බන්ධයෙන් සහයෝගිතා එකඟතාවක් ඇති වූ බවත් ඒ අනුව දෙරට මින් ඉදිරියට ඔවුන් එකිනෙකාගේ ජාතික වුවමනාවන් රැක ගැනීම වෙනුවෙන් ඔවුන්ගේ හමුදා අතර සම්බන්ධීකරණයක් සහ සහයෝගිතාවක් ගොඩනගන බවයි. ඒ අනුව මේ සැප්තැම්බරයේදී ඔවුන් දකුණු චීන මුහුදේ ඒකාබද්ධ යුධ අභ්‍යාසයක් ආරම්භ කරන බවයි.

### දකුණු චීන මුහුදේ අර්බුදය

ඉතිහාසයේ ප්‍රථම වතාවට චීනය ජාත්‍යන්තර අධිකරණයක් වෙතට ගෙන ගියේ පිලිපීනය විසිනි. ඒ දකුණු චීන මුහුදේ දූපත්වල අයිතිය සම්බන්ධයෙනි. චීනය පවසන අන්දමට මෙම දූපත් 1970ට පෙර චීනය සතු වූ අතර 1970දී පමණ ඒවායේ තෙල් හා ගෑස් නිධි සොයා ගැනීමත් සමඟ වියට්නාමයත් පිලිපීනයත් එකී දූපත්වලට අයිතිවාසිකම් කියන්නට පටන්ගත්තේය.

පිලිපීනය එකී දූපත්වල අයිතිය සම්බන්ධයෙන් හේග් නුවර ජාත්‍යන්තර අධිකරණය ඉදිරියේ නඩු පැවරීය. ආරම්භයේදීම චීනය ඊට විරෝධය පළ කළ අතර නඩු විභාගය සිදුවූයේ ඒක පාර්ශවිකවය. නඩුව වෙනුවෙන් පෙනී සිටියේ ෆෝලි හෝග් නම් එක්සත් ජනපද නීති ආයතනයේ නීතිඥයකු වන පෝල් එස්.රිච්ලර්ය. චීනය පවසන අන්දමට නඩුව පිලිපීනයේ වුවමනාවක් නොව එක්සත් ජනපදයේ වුවමනාවකි. ආසියාව තුළ චීනය ප්‍රමුඛයා වීම වැළැක්වීමේ එක්සත් ජනපද වුවමනාව එය පිටුපස ඇත. වසර ගණනාවක නඩු විභාගයකින් පසු පසුගිය ජූලි මාසයේදී එකී අධිකරණය තීන්දුව ප්‍රකාශයට පත් කළේ දකුණු චීන මුහුදේ දූපත්වලට චින අයිතිය නැති බව පවසමිනි. එහෙත් එකී අධිකරණ තීන්දුව ප්‍රතික්ෂේප කරන චීනය පවසන්නේ උක්ත අධිකරණය එක්සත් ජාතීන්ගේ අධිකරණ පද්ධතියට අයිති නොවන බවත් එහි බලතල අනුව එවැනි නඩුවක් විභාග කිරීමට හෝ එවැනි තීන්දුවක් ප්‍රකාශයට පත් කිරීම කළ නොහැකි බවත්ය.

චීනය පිලිපීනයේ ප්‍රධාන වෙළඳ සහකරුවෙකි. පිලිපීනයේ අපනයනවලින් 26%ක්ද ආනයනවලින් 19%ක්ද චීනය සමඟ සිදු කෙරේ. එක්සත් ජනපදය සමඟ සිදු කරන වෙළඳ ගනුදෙනුවලදී පිලිපීනය අපනයනය කරන්නේ 12%ක් සහ ආනයනය කරන්නේ 9%ක් පමණි. මේ නිසා කලාපීය වශයෙන් බැලූ විට චීනය අමනාප කර ගැනීම පිලිපීනයට වාසි සහගත නොවනු ඇත. ඒ අනුව මෙම ක්‍රියාමාර්ගය නිසැකයෙන්ම පිලිපීනයේ වුවමනාවක් නොව එක්සත් ජනපදයේ වුවමනාව අනුව සිදු වූවක් බව කිව හැකිය.

### ජපානයේ ආරක්‍ෂක ධවල පත්‍රිකාව

මේ අතර පසුගිය අගෝස්තු 02 වන දා ජපානයේ ආරක්‍ෂක අමාත්‍යාංශය වාර්ෂිකව නිකුත් කරනු ලබන ආරක්‍ෂක ධවල පත්‍රිකාව 'ජපානයේ ආරක්‍ෂාව 2016' නමින් එළිදැක්වීය. ජපානය එහි පළමු ආරක්‍ෂක ධවල පත්‍රිකාව නිකුත් කළේ 1970දීය. 1976 සිට එය වාර්ෂිකව නිකුත් කරනු ලබයි. මෙවර ආරක්‍ෂක ධවල පත්‍රිකාව පිටු 488 ක ලියවිල්ලක් වන අතර එහි පිටු 30ක් පුරා විස්තර කර ඇත්තේ, චීනයෙන් ඇති වන ආරක්‍ෂක තර්ජනය පිළිබඳවය. පිටු 50ක් පුරා සඳහන් කර ඇත්තේ ජපානය සහ එක්සත් ජනපදය අතර ඇති ආරක්‍ෂක සබඳතා පිළිබඳවය.

මෙම ධවල පත්‍රිකාවේ ප්‍රධාන වශයෙන් සඳහන් කර ඇත්තේ වර්ධනය වන චින ආරක්‍ෂක හැකියාව සහ චීනයෙන්, උතුරු කොරියාවෙන් සහ රුසියාවෙන් තම රටට එල්ල වන ආරක්‍ෂක තර්ජන පිළිබඳවයි. මේ තත්වය තුළ ජපානයේ ආරක්‍ෂාව තහවුරු කිරීම වෙනුවෙන් ගත යුතු පියවරද මෙහි සඳහන් කොට ඇත. කෙසේ වෙතත් චීනය මේ පිළිබඳව සිය බලවත් විරෝධය ප්‍රකාශ කර ඇත. චීනය පවසන්නේ ජපානය මේ සූදානම් වන්නේ ජපානයේ යුදමය ප්‍රතිපත්තියේ දැවැන්ත පරිමාණයේ වෙනස්කම් සිදු කිරීමටත් යුධ ආයුධ වැඩිකිරීමටත් දැනට පවතින ජපන් සාම ව්‍යවස්ථාව වෙනස් කිරීමටත් බවය.

කෙසේ වෙතත් චීනය සතුරු රාජ්‍යයන්ගෙන් වට කිරීමේ එක්සත් ජනපද ප්‍රයත්නය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරන චීනය පසුගියදා ලොව ප්‍රථම කොන්ටම් චන්ද්‍රිකාව ගුවන්ගත කිරීමට සමත් විය. එය අභ්‍යවකාශ ගත කරනු ලැබුවේ වයඹදිග චීනයේ ගැන්සු පළාතේ ජිඋගුවාන් චන්ද්‍රිකා මධ්‍යස්ථානයෙන්ය. මෙම චන්ද්‍රිකාව මගින් තවත් පාර්ශවයකට සොරා ගත නොහැකි ආකාරයෙන් අභ්‍යවකාශය හා පෘථිවිය අතර සන්නිවේදන සබඳතා පැවැත්වීමේ හැකියාව චීනයට ලැබේ. කොන්ටම් පෝටෝනය වෙන් කිරීමට හෝ ඊට සමාන පෝටෝනයක් නිපදවීමට හෝ නොහැකි නිසා තවත් අයෙකුට තොරතුරු සොයා ගැනීමට හෝ බාධා කිරීමට හෝ නොහැකි වේ.

චීනය පවසන්නේ මෙම නව සොයාගැනීමත් සමඟ තොරතුරු තාක්‍ෂණික ක්ෂේත්‍රයේ චීනය නව අදියරකට ළඟාවූ බවයි. එනම් සොයාගත් තාක්‍ෂණය ක්‍රියාත්මක කරන තත්වයේ සිට එම ක්ෂේත්‍රයේ නව සොයාගැනීම් සිදු කරන රටක් බවට පත්ව තිබීමයි.

## ලතින් ඇමරිකාවේ වමේ එකතුවක්

ලතින් ඇමරිකාවේ වාමාංශික පක්‍ෂ 20ක් පමණ පසුගිය අගෝස්තු 26වැනි දා පීරුහි ලීමා නගරයට රැස්වී ඔවුන්ගේ අත්දැකීම් විවරණය කළ අතර ප්‍රගතිශීලී ආණ්ඩුවලට එරෙහිව නව ලිබරල්වාදී ප්‍රහාරයන් පිළිබඳවත් වාමාංශික පක්‍ෂවලට පොදු න්‍යාය පත්‍රයක් සාදා ගැනීම පිළිබඳවත් සාකච්ඡා කළහ. මෙම හමුව හැඳින්වූයේ 'ලතින් ඇමරිකාවේ කොමියුනිස්ට් සහ විප්ලවවාදී පක්‍ෂ හමුව' ලෙසයි. එය සංවිධානය කරනු ලැබුයේ පෙරුවියානු පැට්‍රියා රෝජා කොමියුනිස්ට් පක්‍ෂය විසිනි. මෙම අවස්ථාවට කියුබානු කොමියුනිස්ට් පක්‍ෂයේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ අංශයේ ප්‍රධානී ජොසේ රැමොන්බලාගුවර් ද, වෙනිසියුලාවේ හිටපු ආර්ථික ඇමති රොද්‍රිගු කබ්සාස්ද, පෙරුවියානු කොමියුනිස්ට් පක්‍ෂයද සහභාගී විය.




## Brexit සූදානම

බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීමේ ක්‍රියාවලිය පමා කිරීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ගන්නා උත්සාහය නොසලකා යුරෝපා සංගමයෙන් ඉවත්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට නව බ්‍රිතාන්‍ය අගමැතිනි තෙරේසා මේ සූදානම් වන බව වාර්තා වේ. මේ සඳහා 'ආර්ටිකල් 50' නැමති පනත ක්‍රියාත්මක කළ යුතුය. ඒකපාර්ශ්විකව හා ස්වේච්ඡාවෙන් ඉවත්වීම ප්‍රකාශයට පත් කර අවුඃ 02ක් ඇතුලත යුරෝපා සංගමයෙන් ඉවත්වීමට ඒ අනුව ඉඩ ලැබේ.

ජූනි මස 23වැනි දින පැවැත්වූ ජනමත විචාරණය මගින් යුරෝපා සංගමයෙන් ඉවත්වීම අනුමත කළද බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව තුළදී එය පරාජයට පත් විය. මේ නිසා ඉහත සඳහන් කළ පනත පාර්ලිමේන්තුවේදී සම්මත කර ගත නොහැකිය. ''ආර්ටිකල් 50''යනු බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයට ඇතුලත්වීම සඳහා අත්සන් කළ ලිස්බන් ගිවිසුමේ කොටසකි. කිසියම් රටක් ඒකපාක්ෂිකව යුරෝපා සංගමයෙන් ඉවත් වීමට තීරණය කළ හොත් එය කෙසේ සිදුවිය යුතුද යන්න එහි සඳහන් කොට තිබේ.




## අසාන්ජේගෙන් තවත් හෙළිදරව් කිරීම්

නොවැම්බර් 08 දින පැවැත්වීමට නියමිතව ඇති එක්සත් ජනපද ජනාධිපතිවරණයට පෙර ඒ සම්බන්ධයෙන් හුවමාරු වූ තවත් රහසිගත ලියවිලි ප්‍රමාණයක් මාධ්‍ය වෙත නිකුත් කිරීමට බලාපොරොත්තු වන බව ජූලියන් අසන්ජේ අගෝස්තු 26 වන දා පුවත්පත් සාකච්ඡාවක් කරමින් ප්‍රකාශ කළේය. මෙම ලියවිලිවල ඇති තොරතුරු ඩිමොක්‍රටික් පක්‍ෂ අපේක්‍ෂක හිලරි ක්ලින්ටන්ට ප්‍රබල බලපෑමක් ඇති කරනු ඇති බව පැවසූ ඔහු ඇතැම් තොරතුරු ඉතා රසවත් මෙන්ම සිනහ උපදවන සුළු වනු ඇතැයි ද පැවසීය.

ජූලියන් අසන්ගේ 'විකිලීක්ස්' හි නිර්මාතෘවරයා වන අතර ඔහු එක්සත් ජනපදයේ රහසිගත තොරතුරු හෙළිදරව් කිරීම නිසා එක්සත් ජනපදයේ උදහසට ලක්ව 2012 වසරේ සිට දේශපාලන රැකවරණ මත ලන්ඩනයේ ඉක්වදෝර තානාපති කාර්යාලය තුළ ජීවත් වේ.

මෙවර එක්සත් ජනපද ජනාධිපතිවරණයට අදාලවත් විකිලීක්ස් වෙබ් අඩවිය විසින් තොරතුරු සොරා ගන්නන් විසින් සකස් කරන ලද හිලරි ක්ලින්ටන්ගේ පක්‍ෂයේ නායකයන්ගේ විද්‍යුත් තැපැල් ලියවිලි 20,000ක් පමණ මාධ්‍යයට නිකුත් කරනු ලැබීය. එමගින් ඇතැම් නිලධාරීන් හිටපු එක්සත් ජනපද ලේකම් බර්නි සැන්ඩර්ස් පරාජය කිරීම සඳහා කටයුතු කර ආකාරය හෙළිදරව් කර තිබිණි. මේ නිසා පක්‍ෂයේ සභාපතිනියට ඉල්ලා අස්වීමට පවා සිදුවිය.



# "යහ පාලනය" 'රහ පාලනයට' යට කළ ජාතික විගණන පනත

වර්තමාන "යහපාලන" පාලනය, පැවැති රාජපක්ෂ පාලනයෙන් තමන් වෙනස් බව පෙන්වීමට උත්සාහ දරන්නේ තමන් හොරු පාලනය කරන්නේය යන මිත්‍යාව විසිනි. වර්තමානයේ හොරකම් නොකරන බවත් හොරු ඇල්ලීමට ක්‍රියාත්මක ආණ්ඩුවක් පවතින බවත් ආණ්ඩුවේ මාධ්‍ය විසින් වරින් වර පෙන්වා දෙන්නේ, හවුල් ආණ්ඩු පාලනය 'යහපාලනයක්' බවට වන මතයක් මිනිසුන්ට කැවීමට උත්සාහ දැරීමෙනි. ජනාධිපතිවරණයේදී ගුවන්තොටුපළ වසා දමා හොරුන්ට රටින් පිටවීම වළක්වා දඬුවම් දෙන බවට ජනතාවට පොරොන්දු වූ ආණ්ඩුව අද ගුවන්තොටුපාළ වසා දැමීම කෙසේ වෙතත් ගුවන් සේවයත් තුට්ටු දෙකට විකිණීමට කෙනෙක් සොයනු දැකිය හැකිය.

රාජපක්ෂ ජනාධිපතිවරයා වුවත්, මෛත්‍රීපාල ජනාධිපති වුවත් ධනපති රාජ්‍ය පාලනයකට කළ හැක්කේ හොරුන්ට, දූෂිතයන්ට දඬුවම් දීම නොව ඔවුන් ආරක්ෂා කිරීම බව වත්මන් පාලකයෝද මනාව ඔප්පු කරමින් සිටිති. ඇස් පනාපිටම සිදුව ඇති මහ බැංකු බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව සියල්ල කණපිට ගැසීමටත් එම ගනුදෙනුව හරහා තම බෑනාට වාසි අත්පත්කරදුන් අධිපතිවරයා රැකීමටත් පාර්ලිමේන්තුවේ අගමැති රනිල් වික්‍රමසිංහ ඇතුළු එ.ජා.ප. මන්ත්‍රී කණ්ඩායමම කටයුතු කරයි. එ.ජා.ප.ය රජයට පාඩුකරන නිලධාරීන් හඳුනා ගන්නා පක්ෂයක් වෙනුවට ඔවුන් ආරක්ෂා කර, වැරදිකරුවන් නිවැරදිකරුවන් ලෙස ඔප්පු කරන්නට අසාර්ථක උත්සාහයක්ද සිදුකරයි.

පසුගිය රාජපක්ෂ පාලනයේ හෙජිං ගනුදෙනුව, ග්‍රීක බැඳුම්කර ගනුදෙනුව, ගුවන් තොටුපොළ ඉදිකිරීම, සූරියවැව ක්‍රීඩාංගණය ඉදිකිරීම, ඇවන්ගාඩ් ගනුදෙනු, ලංකාපුත්‍ර බැංකුවේ ණය දීම, ආදී නොඑක් ගනුදෙනු බොහොමයක් යට ගැසී ඇති අතර වර්තමානයේදී ඊනියා යහපාලනය යටතේද එවැනි ගනුදෙනු බොහොමයක් සිදුවෙමින් පවතී. ජාවාරම්කාර ගනුදෙනුවලට ඇමතිවරුන්, ඇමතිවරුන්ගේ අනුදැනුම යටතේ නිලධාරින් සම්බන්ධ වන සිදුවීම් දිනපතා වර්තාවෙයි.

ඉහත යථාර්ථය යටතේ යෝජිත ජාතික විගණන පනත ක්‍රියාවට නොනගා යටපත් කරන බවට බරපතළ චෝදනාවක්ද ආණ්ඩුවට එල්ල වී ඇත. ආණ්ඩුව මෙම යෝජිත ජාතික විගණන පනත ක්‍රියාවට නැගීමට බිය වන්නේ ඇයි.? එවැනි පනතකින් ආණ්ඩුවේ නාස්තිය-දූෂණය මැඩ පැවැත්වීමට ඇති හැකියාව කුමක්ද? නීති පැනවීවීමෙන් පමණක්, නව අණපනත් මගින් පමණක් දූෂණ වැළැක්විය හැකි වන්නේද? ආණ්ඩුව ක්‍රියාවන්ට නැගීමට බියට පත්වී ඇති මෙම විගණන පනත කුමක්දැයි වටහා ගැනීම මගින් අපට එම ගැටලුවලට විසඳුමක් සෙවිය හැකිය.

### මූල්‍යමය පාලන පාර්ලිමේන්තු බලය

ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන වගන්තිය අනුව රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ සම්පූර්ණ බලය ඇත්තේ පාර්ලිමේන්තුවටය. අයවැය මගින් සම්මත කරන රජයේ ආදායම්, රාජ්‍ය වියදම් පිළිබඳ වගවීම (Accountability) පරීක්ෂා කර බලා පාර්ලිමේන්තුවට විගණකාධිපතිවරයා විසින් වාර්තා කරනු ලබන අතර, පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර (කෝප්) කාරක සභාව එම වාර්තා විමර්ශනය කර නිර්දේශ නිකුත් කරීමත්, පාර්ලිමේන්තුවට වාර්තා කිරීමත් සිදු කරනු ලබයි.

මූල්‍ය පාලනය පිළිබඳ පාර්ලිමේන්තුව සතු පාලන බලය ක්‍රියාවට නගනු ලබන්නේ විගණකාධිපතිවරයා විසිනි. ඒ නිසාම විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුව ඒ පාර්ලිමේන්තුව සතු බලය (ව්‍යවස්ථානුකූල බලය) ක්‍රියාවට නැගීම තරමේ ස්වාධීනත්වයක් හිමිව සිටී. මෙසේ පාර්ලිමේන්තුව සතු බලය අනුව කටයුතු කිරීම සඳහා බලතල විගණකාධිපතිවරයාට ලබාදී ඇත්තේ ඇමතිවරයෙකුගේ හෝ ආණ්ඩුවේ අනුකම්පාව නිසා නොවේ; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154වන ව්‍යවස්ථා වගන්තිය මගිනි.

විගණකාධිපති විගණනය කරනු ලබන්නේ ඔහුගේ පෞද්ගලික දැනගැනීමක් සඳහා නොව පාර්ලිමේන්තුව වෙනුවෙනි. විගණකාධිපතිගේ බලය ශක්තිමත් කිරීම යනු රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳව පාර්ලිමේන්තු බලය (මහජන බලය) ශක්තිමත් කිරීමයි.

### යෝජිත විගණන පනත

විගණකාධිපතිවරයාට මූල්‍ය පාලනය පිළිබඳව ව්‍යවස්ථානුකූලව පවරා ඇති බලය බොහෝ විදෙස් රටවල්වලදී වෙනම විගණන පනතක් පාර්ලිමේන්තුවේ සම්මත කිරීම මගින් විස්තරාත්මකව අර්ථ දක්වා පැහැදිලි කර දී ඇත. ලංකාවේ මෙතෙක් එවැනි පැහැදිලි කිරීමක් පනතක් මගින් ක්‍රියාවට නංවා නොමැත. ඒ නිසා විගණකාධිපති දෙපාර්තමේන්තුව පිහිටුවන ලද 1799 සිට අද දක්වාම

> දැන් "යහපාලනයේ" "රහ පාලනය" පෙන්වන (වසරක් ඉක්මගිය පසු) කාලය ආරම්භ කර ඇත. දැන් වරාය ඉතිරි ටික විකිණිය යුතුව ඇත! පසුගිය රාජපක්ෂ පාලනය සිදුකළ මූල්‍යමය පාඩු සොයා බැලීම නතරකර ඒ වෙනුවට අලුත් පාලනයද හොරකම් කළ යුතුව ඇත! ඒ සඳහා විගණන පනත පාර්ලිමේන්තු සොයා බැලීම-කෝප් කමිටු යහපාලනයට බාධක ලෙස මතුවී තිබේ.

විගණකාධිපතිවරයාට ක්‍රියා කිරීමට සිදුව ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති 154 වගන්තිය අනුව පමණි.

පැවති එම අඩුපාඩු සකස් කිරීමෙන් විගණකාධිපතිගේ බලතල පාර්ලිමේන්තුගත කිරීමට පනතක් සකස් කිරීම 1983දී ආරම්භ කළ අතර එය අවසන් කරන ලද්දේ 2003 වසරේදීය. 1997දී ඇතිකරගත් ලීමා ප්‍රඥප්තිය 2007දී ඇතිවූ මෙක්සිකෝ ප්‍රඥප්තිය, 2011දී එක්සත් ජාතීන්ගේ සංවිධානය ලබාදුන් පිළිගැනීම ආදියේ පදනම වූයේ මෙම පනත හැදීමට අනුවය. නමුත් 2003දී එවකට පැවති රනිල් වික්‍රමසිංහ පාලනය විසින් මෙම පනත ක්‍රියාවට නැගීම නතර කළාක් මෙන්ම, 2016දී පවතින වර්තමාන වික්‍රමසිංහ-මෛත්‍රීපාල හවුල් පාලනයද මේ වනතුරු ජාතික විගණන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම වළක්වා ඇත. 2015දී බලයට පත් වත්මන් පාලනය 2015 මාර්තු වනවිට මෙම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත්කරන බවට ජනතාවගේ ඡන්දය හමුවේ පොරොන්දු වුවද එම පොරොන්දුව සිදුකර මාස 17ක් ඉක්මවුවද අදටත් විගණන පනත බාලගිරි දෝෂයට ලක්ව ඇත.

රාජ්‍ය මූල්‍ය පාලනය ශක්තිමත් වීම පාලකයින්ට කොතරම් අමිහිරිද, ඔවුන් කොතරම් අකැමැතිද යන්න තේරුම් ගැනීමට හොඳම නිදසුනක් වන්නේ 2003 සිට 2015 දක්වා මෙම පනත සම්මත කිරීමට කැබිනට් මණ්ඩලයට ඉදිරිපත්වූ සෑම වස්ථාවකම වැඩිදුර සාකච්ඡා කිරීමට යැයි පවසමින් කැබිනට් හෝ වෙනත් අනු කමිටු වෙත මාරු කර යැවූ වාර ගණන බොහෝ වීමය.

### අධිභාර භීතිය

මෙවරද සුපරුදු ලෙසම ආණ්ඩුව විසින් ජාතික විගණන පනත සරත් අමුණුගම අමාත්‍යවරයා සභාපතිවරයා දරන අනු කමිටුවකට යොමු කර ඇත. මෙසේ නැවත මෙම පනත ඇමති අනුකමිටුවකින් නිරීක්ෂණය කිරීමට බලපා ඇති ප්‍රධාන හේතුව මෙහි 21වන වගන්තියේ ඇති අධිභාර පැනවීම පිළිබඳව වන කරුණයි. අධිභාරයට බියවී ඇත්තේ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු ඉහළ වගකිව යුතු නිලධාරීන් සහ ඔවුනට නියෝග නිකුත් කරන "යහපාලන" ඇමතිවරුන්ය. ඇමතිවරුන්ගේ නියෝගවලට නිලධාරීන්ට අධිභාර පැනවෙන්නේ නම් ඒ ඒ පිළිබඳ රුදාවක් ඇමතිවරුන්ට ඇත්තේ නැත. රජයේ පහළ නිලධාරීන් කරන වැරදි ආණ්ඩුවලට වැරදිය. ඇමතිවරුන්ගේ-පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන මන්ත්‍රීවරුන් (ප්‍රාදේශීය සභා, පළාත් සභා) කරන වැරදිද වැරදිය.

නමුත් ලොකු ඇමතිවරුන්-ලොකු නිලධාරීනුත් කරන වැරදි වැරදි නොවේය. නැතිනම් වැරදිකරුවනුත් ඒවාට දඬුවම අදාළ නොවේය. අධිභාරයට බයවී සිටන්නේද ඒ ප්‍රතිපත්තියේ පිහිටෙනි. සාමාන්‍ය අධිභාරය යනු, හානියට/පාඩුවට අනුපාත ලෙස 25%ක් අයකර ගැනීමකි. නමුත් විගණන කෙටුම්පතකින් සඳහන් කර ඇත්තේ එවැනි අධිභාරයක් ගැන නොවේ. මේ සඳහන් වන්නේ වැඩිපුර මුදලක් දඩ ගැසීමක් නොව රජයේ නීතිරීතිවලින් බරිබාහිරව කටයුතු කිරීමෙන් යම් පුද්ගයෙකු රජයට අලාභයක් පාඩුවක් කර ඇත්තේ නම් එසේ ගෙවා ඇති මුදල නැවත අයකර ගැනීම පමණි. මෙම අධිභාරයට හුඹස් බියක් පෙන්වා මුළු විගණන පනතම ක්‍රියාවට නැගීම අඩපණ කිරීම පිටුපස ඇත්තේ අවංකවම අධිභාර බිය නොව යහපාලනය-හක්කේ බුදුරැස් බොක්කේ දඩමස් ක්‍රමයක් නිසාය.

දැන් "යහපාලනයේ" "රහ පාලනය" පෙන්වන (වසරක් ඉක්මගිය පසු) කාලය ආරම්භ කර ඇත. දැන් වරාය ඉතිරි ටික විකිණිය යුතුව ඇත! පසුගිය රාජපක්ෂ පාලනය සිදුකළ මූල්‍යමය පාඩු සොයා බැලීම නතරකර ඒ වෙනුවට අලුත් පාලනයද හොරකම් කළ යුතුව ඇත! ඒ සඳහා විගණන පනත පාර්ලිමේන්තු සොයා බැලීම-කෝප් කමිටු යහපාලනයට බාධක ලෙස මතුවී තිබේ. යහ පාලනය රහ පාලනය කර ගන්නා විට පාලකයින් සුපුරුදු දුරාචාර ක්‍රීඩාවට බසිනු ඇත. සිහිබුද්ධිය සහිත ජනතාවද තමන්ගේ බලය පෙන්වීමට සූදානම් විය යුතුව ඇත්තේ මේ තත්වය තුළය.





"විවිධ රටවල ධනපති ක්‍රමය සංවර්ධනය වන්නේ ඉතාමත් අසමාන ආකාරයෙනි. වෙළඳ භාණ්ඩ නිශ්පාදනය යටතේ එය වෙනත් ආකාරයකට සිදුවිය නොහැකිය. සමාජවාදය සියලුම රටවල එක වර ජයග්‍රහණයට පත් විය නොහැකි බව මෙයින් ඒකාන්ත වශයෙන් නිගමනය වේ. එය ප්‍රථමයෙන් එක් රටක හෝ රටවල් කීපයක ජයග්‍රහණයට පත් වනු ඇති අතර, අනිකුත් රටවල් කලක් ගතවන තෙක් ධනපති හෝ පූර්ව ධනපති තත්වයේ පවතිනු ඇත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**04වැනි වෙළුම,**
**177 පිටුව**

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස්
වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2016 අගෝස්තු 10

# ග්‍රෑම් 100 පඩියේ හොරකමට වඩා මහා පරිමාණ හොරකම් ඇස් පනා පිට සිද්ධ වෙලා තිබෙනවා

## පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා

**(ඒකක, ප්‍රමිති හා සේවා පනතට පිළිබඳ විවාදයට එක්වෙමින්)**



අප මීට වසර දහස් ගණනකට පෙර සිට මෙවැනි මිනුම් ඒකක ක්‍රමයක් පවත්වාගෙන ආ රටක්. බදුල්ල නගරය තුළ සෙනරත් පරණවිතාන අනුස්මරණ පුස්තකාලය තිබෙනවා. ඒ පුස්තකාලය අසල අඩි 08ක් පමණ උස ශිලා ලේඛනයක් තිබෙනවා. ඒ කුලුනේ පේළි 203කින් ඉතාම කුඩා අක්ෂර 2,000කින් පමණ මේ මිනුම් ඒකක පිළිබඳ සඳහන් වෙනවා. ක්‍රිස්තු වර්ෂ 950දී පමණ අනුරාධපුර රාජධානියේ අවසාන කාලයේදී රජකම් කරන ලද හතරවන උදය රජතුමා සොරබොර ප්‍රදේශයට - දැන් 'මහියංගණය' කියා හඳුන්වන ප්‍රදේශයට - ආපු වෙලාවක ඒ ප්‍රදේශයේ ජනතාව යම් පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා. සොරබොර ආශ්‍රිතව ඒ කාලයේ වෙළෙඳ මධ්‍යස්ථානයක් තිබිලා තියෙනවා. ඒ වෙළෙඳ මධ්‍යස්ථානය භාරව හිටපු රජයේ නිලධාරීන් වෙළෙඳාමේදී සිදු කරන ලද යම් අකටයුතුකම්, වංචා හා දූෂණ පිළිබඳව ඒ ජනතාව රජතුමාට පැමිණිලි කළාට පස්සේ, රජතුමා යම් නියෝග ප්‍රමාණයක් නිකුත් කර තිබෙනවා. ඒ වෙළෙඳාම සාධාරණව කිරීම සඳහා. ඒ අනුව ක්‍රිස්තු වර්ෂ 950දී පමණ පිහිටුවන ලද සොරබොර ටැම් ලිපියෙනුත් මේ මිනුම් ඒකකවල ඉතිහාසය අපට බලා ගන්න පුළුවන්.

මට කලින් කථා කළ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයා සඳහන් කළා. "තව සතියක්, දෙකක් ගියාට පස්සේ යහපාලන ආණ්ඩුවට අවුරුද්දක් පිරෙනවා" කියලා. ජනතාව යහ පාලනය වෙනුවෙන් ඡන්දය දුන්නේ, විශේෂයෙන්ම හොරකම්, වංචා හා දූෂණ අවම කරන්න; හොරු දූෂිතයන් හෙළිදරවු කරන්න; කොල්ලකන ලද රජයේ දේපළ නැවත පවරා ගෙන ඒවා ජනතා සුභසාධනය සඳහා යොදවන්න. කෙසේ නමුත්, වසරක් ගත වන කොටත් හොරකම්, වංචා හා දූෂණ සම්බන්ධයෙන් ආපස්සට හැරිලා බලන කොට, නටපු තොවිලයකුත් නැති - බෙරේ පළුවකුත් නැති තත්ත්වයට පත් වෙලායි තිබෙන්නේ. මහා පරිමාණ වංචා හා දූෂණ රටේ සිදු වෙලා තිබෙද්දී අද අපි සාකච්ඡා කරනවා, "ගමේ කඩේ වෙළෙන්දාගේ කිලෝ එකේ පඩියේ, ග්‍රෑම් 100 පඩියේ හොරකමක් වෙයිද, ඒක වළක්වන්නේ කොහොමද?" කියලා. ඊට වඩා මහා පරිමාණ වංචා හා දූෂණ ඇස් පනා පිට සිද්ධ වෙලා තිබෙනවා.

1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත යටතේ ජාතික මිනුම් පර්යේෂණාගාරයක් පිහිටුවලා තිබෙනවා. ඇත්තටම රටේ ජනතාව මේ ආයතනයේ කාර්යභාරය අර වෙළෙන්දාගේ පඩියට සීමා කළාට, එතැනින් එහාට ගියපු කර්මාන්ත, විද්‍යා, සෞඛ්‍ය, ආරක්ෂක හා පාරිසරික සුරක්ෂිතතාව කියන පුළුල් ක්ෂේත්‍රයක මේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පැවරී තිබෙනවා. ඒ නිසා, මෙය හුදෙක් වෙළෙඳාම හා සම්බන්ධ කාරණයක් විතරක් නොවෙයි. සමස්තයක් වශයෙන් සෞඛ්‍ය, ආරක්ෂාව, පරිසරය ඇතුළු ජනතාවගේ ජීවිතයට බලපාන සියලු කාරණාවලට අදාළ මැදිහත්වීමක් කළ හැකි ආයතනයක්. ඒ අදහස අනුව තමයි ජාතික මිනුම් පර්යේෂණාගාරය ආරම්භ කළේ. ඒ පර්යේෂණාගාරය තුළ ස්කන්ධ විද්‍යාගාරයක්, පරිමාණ මිනුම් විද්‍යාගාරයක්, විදුලි මිනුම් විද්‍යාගාරයක්, කාල හා සංඛ්‍යාත මිනුම් විද්‍යාගාරයක්, උෂ්ණත්ව මිතික මිනුම් විද්‍යාගාරයක්, දීපිත මාපක මිනුම් විද්‍යාගාරයක්, විකිරණ මාපක මිනුම් විද්‍යාගාරයක් වශයෙන් විද්‍යාගාර සේවාවන් පවත්වාගෙන යනවා. අපි හිතනවා, ඇත්තටම ඉදිරිය බලලා මෙවැනි සැලසුමක් සකස් කිරීම හොඳයි කියලා. සැලසුම සකස් කළාට ඒ සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා වුණු පුළුල් වපසරියක් 02වැනි පිටුවට

> "ඔවුන්ගේ උසස්වීම් පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. ඔවුන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. ඔවුන්ට ලැබෙන විදේශීය පුහුණුවීම් පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. ඔවුන්ට ලැබෙන ස්ථාන මාරු පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. මෙවැනි හේතු නිසා, ඉතා විශාල කාර්ය භාරයක් කළ හැකි නිලධාරීන් ප්‍රමාණයක් යම් කිසි ආකාරයකට මන්දෝත්සාහීව, තමන්ගේ රාජකාරිය හරි හැටි කර ගත නොහැකි වීමේ අර්බුදයකින් පීඩාවට පත්වී තිබෙනවා."

2016 අගෝස්තු 12

# විදෙස්ගත ශ්‍රමිකයන් ඩොලර් මිලියන 6,000ක් ලංකාවට උපයා දුන්නත් ඔවුන්ට සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නැහැ

**(විදේශගත ශ්‍රී ලාංකිකයන් මුහුණපාන ගැටලු පිළිබඳ කල් තැබීමේ විවාදයට එක්වෙමින්)**

## පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා



මේ යටත්විජිත යුගය නොවෙයි. යටත්විජිත යුගයේදී නම් අපේ රට යටත් කර ගෙන, අපේ රට යටත් කර ගත්ත අය අපේ රටෙන් වහලුන් හැටියට ඒ රටවලට මිනිසුන් අර ගෙන ගියා. එතකොට ඔවුන් ඒ අය මිනිසුන් හැටියට සැලකුවේ නැහැ. මිය ගියාට පසුව ඉවත් කරන උපකරණ හැටියට තමයි සැලකුවේ. අද එහෙම නොවෙයි. අද මේ විදේශගත වන ශ්‍රී ලාංකිකයින් යෙදෙන්නේ වහල් සේවයේ නොවෙයි. ඔවුන්ගේ පෞද්ගලික ජීවිතයේ අරමුණු වෙනුවෙන් තමයි, නීත්‍යානුකූලව විදේශගත වන්නේ. ඒ අරමුණු ඉතාම සාධාරණ අරමුණු. ජීවත් වෙන්න නිවාසයක් සාදා ගැනීම, තමන්ගේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීම, වාහනයක් මිලදී ගැනීම, නැවත ඉතා ඉක්මණින් ලංකාවට ඇවිල්ලා යහපත් ජීවිතයක් ගත කිරීම ආදිය තමයි ඔවුන්ගේ අරමුණු වන්නේ. ඔවුන් ඊට වඩා ලොකු දෙයක් ඉල්ලන්නේ නැහැ. ඔවුන් ඊට වඩා ලොකු දේවල් බලාපොරොත්තු වෙන්නේ නැහැ. හැම වර්ෂයකම ලංකාවෙන් රැකියා සඳහා විදේශගත වෙන පිරිස ලක්ෂ තුනක් පමණ වෙනවා. තවම ගණන් හදලා නැති වුණත් එසේ විදේශගත වී සිටින, ආසන්න වශයෙන් විසි ලක්ෂයක් පමණ වන පිරිසෙන් සියයට 99ක්ම නැවත ලංකාවට එන්න කැමැතියි. අපි ඒ ගැන දන්නවා. ඔවුන්ගේ මව්බිම මේ ශ්‍රී ලංකාවයි.

අපි අසන ප්‍රශ්නය මෙයයි. ලංකාවත් එක්ක ඒ තරම් සජීවී බැඳීමක් තිබෙන, මේ මාතෘභූමියට ඒ තරම් ආදරයක්, ඇල්මක්, කැමැත්තක් තිබෙන ඒ මිනිසුන් වෙනුවෙන් රජයක් හැටියට, රටක් හැටියට, ආණ්ඩුවක් හැටියට අප ඉටු කරන යුතුකම ගැන අප සෑහීමකට පත් වෙනවාද? අපි රටක් හැටියට ඉටු කරන යුතුකම් පිළිබඳව විදේශ සේවා නියුක්ති කාර්යාංශය, කැබිනට් මණ්ඩලය සෑහීමකට පත් වෙනවාද? ශ්‍රී ලංකාව භාණ්ඩ අපනයනයෙන් ඩොලර් මිලියන 10,000ක් ලබනකොට, විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ඩොලර් මිලියන 6,000ක් ලංකාවට උපයා දෙනවා. විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ දායකත්වය නැත්නම් අද වෙළෙඳ ශේෂ පරතරය, භාණ්ඩාගාර අර්බුද කියන මේ ඔක්කෝටම මොකද වෙන්නේ? අද ඒ දායකත්වයට සාධාරණයක් ඉෂ්ට වෙනවාද? එසේ ලබා දෙන දායකත්වය සඳහා අනික් පැත්තට ඔවුන්ට සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නැහැ.

### අවම වැටුප් ගිවිසුම් නොමැතිවීම

එහි ප්‍රධාන ගැටලුවක් තමයි එම රටවල් සමග අප ඇති කරගෙන තිබෙන අවම වැටුප් ගිවිසුම්. දැනටමත් අපේ ශ්‍රමිකයන් විදේශගතවී සිටින රටවල් සමඟ ඇති කර ගත් අවම වැටුප් ගිවිසුම් තිබෙනවා. ලංකාවක් හැටියට අපි එම රටවල් සමඟ ඇති කර ගෙන තිබෙන ඒ අවම වැටුප් ගිවිසුම්වලින් කොපමණ සංඛ්‍යාවක් අලුත් කරගෙන තිබෙනවාද?

2015 අවුරුද්දේ එකඟ වුණු වැටුප් agreement කඩපු අවස්ථා කොපමණ තිබෙනවාද කියා. එසේ වැටුප් ගෙවන්න එකඟ වුණු ගිවිසුම් කඩපු අවස්ථා 1,005ක් තිබෙනවා. ඒකෙන් 595ක්ම housemaidsලා සම්බන්ධවයි තිබෙන්නේ. 2016 අවුරුද්දේ ජනවාරි මාසයේ සිට ජූලි මාසය වෙනකොට එසේ වැටුප් ගිවිසුම් කඩපු අවස්ථා 641ක් තිබෙනවා. එයින් 367ක් housemaidsලා සම්බන්ධවයි තිබෙන්නේ. අනික් අවුරුදුවල සිදු වෙලා තිබෙන්නේත් එහෙම තමයි.

2013 අවුරුද්දේ වැටුප් ගිවිසුම් කඩපු අවස්ථා 2,014ක් තිබෙන කොට එයින් 1,425ක් තිබෙන්නේ housemaidsලා සම්බන්ධවයි. ඒ අයට වැටුප් ගෙවනවා කියලා එකඟ වුණු වැටුප් ගිවිසුම් උල්ලංඝනය කරලා තිබෙනවා. ඒ උල්ලංඝනය කිරීම් වෙනුවෙන් අපේ මැදිහත් වීමක් අවශ්‍යයි. රටක් වශයෙන් අපේ මැදිහත්වීමක් අවශ්‍යයි. අවම වැටුප් වැඩි කර ගැනීම වෙනුවෙන් මැදිහත් වීමක් අවශ්‍යයි. ඒක සිද්ධ වෙන්නේ නැහැ.

> "2013 අවුරුද්දේ වැටුප් ගිවිසුම් කඩපු අවස්ථා 2,014ක් තිබෙන කොට එයින් 1,425ක් තිබෙන්නේ housemaidsලා සම්බන්ධවයි. ඒ අයට වැටුප් ගෙවනවා කියලා එකඟ වුණු වැටුප් ගිවිසුම් උල්ලංඝනය කරලා තිබෙනවා. ඒ උල්ලංඝනය කිරීම් වෙනුවෙන් රටක් වශයෙන් අපේ මැදිහත්වීමක් අවශ්‍යයි."

### දායක අරමුදල් ලබාගැනීමට නොහැකිවීම

ඊළඟට, ඒ අය මුහුණ දෙන ප්‍රධානතම ප්‍රශ්නයක් තිබෙනවා. යුරෝපයේත් මේ ප්‍රශ්නය තිබෙනවා. මම මීට කලින් මේ පාර්ලිමේන්තුවේදීත් මේ ප්‍රශ්නය ගැන කියලා තිබෙනවා. සයිප්‍රස්වලත් මේ ප්‍රශ්නය තිබෙනවා. ප්‍රංශයට අදාළව මේ ප්‍රශ්නය තිබෙනවා. ඒ රටවල යම් අරමුදල් තිබෙනවා. ශ්‍රී ලාංකිකයන් ඒ අරමුදල්වලට දායක වෙලා තිබෙනවා. සේවාදායකයින් විසින්, සේවායෝජකයන් විසින් දායක වුණු අරමුදල් තිබෙනවා. ඒ අරමුදල්වල ඔවුන්ට අයිති මුදල ඒ අය ලංකාවට එන විට ලබා ගන්න අයිතියක් තිබෙන්න ඕනෑ.

කොරියාව වාගේ රටක අපේ විදේශගත ශ්‍රී ලාංකිකයන් ගත කරන්නේ සැපවත් ජීවිත නොවෙයි. ඊයේ - පෙරේදා අපි දැක්කා. කොරියාවේ රැකියාවලට එන්න අයදුම්පත් එවන්න කියලා කිව්වාට පස්සේ අයදුම්පතක් ගන්න ගේට්ටු කඩාගෙන එල්ලෙන හැටි. හැබැයි, කොරියාවේ රැකියාවලට යන අපේ අයට සැම්සුන් ආයතනයේ රැකියා හම්බ වෙන්නේ නැහැ. වෙනත් මහා පරිමාණ බහුජාතික සමාගම්වල රැකියා හම්බ වෙන්නේ නැහැ. කොරියාවේදී අපේ අයට මස් කපන රැකියා හම්බවෙනවා; අධික සීතලේ කුකුළන් මරන රැකියා හම්බවෙනවා; යකඩ කම්හල්වල රැකියා හම්බවෙනවා; ගැරාජ්වල රැකියා හම්බවෙනවා; රසායනික ද්‍රව්‍ය, ඩයි වර්ග පාවිච්චි කරන කර්මාන්තශාලාවල රැකියා හම්බවෙනවා.

විදේශගත ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් "එතෙර අපි" කියලා සංවිධානයක් අපි පවත්වා ගෙන යනවා. ඒ සංවිධානයේ සභාපතිවරයා හැටියටයි මමයි කටයුතු කරන්නේ. මේ ලේඛනයේ තිබෙන්නේ කටාර් රාජ්‍යයේ විතරක් මේ ප්‍රශ්නය පිළිබඳව 4,339 දෙනෙකුගේ අත්සන් සහිත පෙත්සමක්. මේ ආකාරයටම ඕමානය, අබුඩාබි, සවුදි අරාබිය, කුවේට් යන රටවල විතරක් නොවෙයි, යුරෝපීය රටවල්වල පවා සිටින අයගේ දුක්ගැනවිලි තිබෙනවා.

### සහෝදර දෑත්

මේ ගොල්ලන් පෞද්ගලික ජීවිත ගත කරන්න ඒ රටවලට ගියාට ලංකාවේ සිද්ධ වෙන අකරතැබ්බයකදී, සමාජ උවදුරකදී, කරදරයකදී ඒ වෙනුවෙන් මේ හැමෝම මැදිහත් වෙනවා. පසුගිය කාලයේ අරණායක ප්‍රදේශයේ නාය යෑම සිද්ධ වුණු අවස්ථාවේදී, ඒ වාගේම කඩුවෙල, කොලොන්නාව ප්‍රදේශ ගංවතුරෙන් යට වුණු අවස්ථාවේදී ඔවුන් උදවු කරන්න මැදිහත් වුණා. ඒ අය මෙහේ අනාථ වුණු අයගේ ගෙවල් හදාදෙන්න මැදිහත් වෙනවා. ඒ අයට උදවු කරන්න මැදිහත් වෙනවා. වකුගඩු රෝගීන්ට ආධාර කරන්න මැදිහත් වෙනවා. මේ අය තමන්ගේ රට ගැන පුදුමාකාර විධියේ සංවේදීතාවක් තිබෙන අයයි. ඒ, කවුරුවත් කියලා නොවෙයි. කවුරුවත් කථා කරලා නොවෙයි. අපේ රටේ යම් විපතකදී මේ හැම රටකම ඉන්න අය මැදිහත් වෙලා උදවු කරන්න ලැහැස්ති වෙනවා. ඔවුන් අවංකව ඒ කටයුතුවලට දායක වෙන්න සූදානමක් තිබෙන අයයි. ඒ නිසා තමයි අපි කියන්නේ මේ අය වෙනුවෙන් අපි යමක් කළ යුතුයි කියලා.



# විපතක් වූ සම්පත

"අපිට විතරයි මුදුනටම යන්න පුළුවන්. වෙන ඩ්‍රයිවර්ලට මෙහේ යන්න බැහැ. දැන් උස නිසා ට්‍රැක්ටරය පෙරලෙන්න බලනවා. අපි සෑහෙන්න කාලයක් මේ වැඩේ කරලා තිබෙන නිසා කොහොම හරි මුදුනට ගිහිල්ල කුණු ටික හළාගන්නවා."

ඉහත සඳහන්ව ඇත්තේ කොළඹ නගර සභාවේ කසළ රැගෙන යන ට්‍රැක්ටර් රියදුරෙකු මීතොටමුල්ල කුණු කන්දට කුණු දැමීමට යාමේදී තමන්ට මුහුණ පෑමට සිදුවන අපහසුතාවය සම්බන්ධයෙන් අප සමග කළ කථාබහක කොටසකි. රියදුරන් ලෙස ඔවුන් දරන අපහසුතාව පසෙක තැබූ විට ඔවුන්ගේ ප්‍රකාශ තුළ ඇති යටි අරුත වන්නේ තවදුරටත් කසළ දැමිය නොහැකි තත්වයට කුණු කන්ද පත්ව ඇති බවයි. මේ ආකාරයට රටේ නොයෙක් තැන්හි කුණු කඳු උස් කරමින්ද නොයෙක් පාරිසරික ගැටලු ඇතිකරමින්ද නව කෘත්‍රිම (කුණු) කඳු මතුවෙමින් පවතී. ප්‍රාදේශීය සහ ජාතික දේශපාලන අධිකාරිත්වයන් තමන් දෙසට එන බෝලය එහාට මෙහාට දමමින් සිටිනවා විනා කසළ අර්බුදයට ඔවුනට ස්ථිර සාර විසඳුමක් පෙනෙන සීමාවකවත් නොමැත.

මේ තත්වය තුළ මෙවර ලිපි පෙළ මගින් ගවේෂණයට භාජනය වන්නේ, වටිනාකමක් නොදන්නා නිසාම අර්බුදයක් බවට පත් වූ කැලි කසළ පිළිබඳවයි.

මිනිස් පරිභෝජනයෙන් පසු ඉවත දමන දෑ කැලි කසළ වශයෙන් සරල අර්ථ දැක්වීමකට යා හැක. මෙයද ප්‍රධාන වශයෙන් දිරාපත් වන සහ දිරාපත් නොවන වශයෙන් කොටස් දෙකකට වෙන්කළ හැක. අප රට සැලකූ විට මීට දශක කිහිපයකට පෙර ඉවතලන කැලි කසළවලින් 80%ක් පමණ දිරාපත් වන ද්‍රව්‍ය වූ අතර අද වන විට කසළ තුළ දිරාපත් වන ද්‍රව්‍ය ප්‍රතිශතය අඩු වී දිරාපත් නොවන ද්‍රව්‍ය ප්‍රතිශතය ඉහළ ගොස් තිබේ.

**නිවසින් ඉවතට**

සාමාන්‍යයෙන් අප රටේ මිනිසුන් සිතන පතන ආකාරයට ඔවුනට කැලි කසළ ප්‍රශ්නය අදාළ වන්නේ ඒවා නිවෙස් තුළ තිබෙන තාක් පමණි. නිවෙසින් ඉවතට, අවම වශයෙන් අල්ලපු වත්තට හෝ තල්ලු කරගත් පසු ඔවුනට ඒ ප්‍රශ්නය අදාළ නොවේ. මෙරට පොදු ජනයාගේ මනෝභාවය සැකසී ඇත්තේ එලෙසය.

එනිසා ජනතාව විසින් තම කැලි කසළ ප්‍රශ්නය විසඳා ගැනීමට නොයෙක් ක්‍රම භාවිතා කරනු ලබයි. එක් ක්‍රමයක් නම් නගර සභාවෙන් එන ලොරියට හෝ ට්‍රැක්ටරයට කුණු ටික පටවා දැමීමයි. කසළ ගැටලුවක් වන්නේ නියමිත පරිදි කුණු රැගෙන යාමට එන රථය නොපැමිණියොත් පමණි. එසේ නොපැමිණියොත් හෝ ඇතැම් අපද්‍රව්‍ය බාර නොගතහොත් අනුගමනය කරන ලබන අනෙක් ක්‍රියා මාර්ගය වන්නේ, මඟ දෙපස හෝ ජන ශූන්‍ය පෙදෙසක එම එම කැලි කසළ අතහැර දමා පැමිණීමයි. නැතහොත් නාගරික නොවන පෙදෙස්වල සිදු කරනු ලබන්නේ ගිනි තැබීමයි.

එහෙත් ඒ සෑම ආකාරයකටම සිදුව ඇත්තේ, කැලි කසළ ප්‍රශ්නය විසඳීම නොව ප්‍රශ්නයෙන් පලා යෑම පමණි. අදාළ පළාත් පාලන ආයතනය නිවෙස්වලින් කසළ එකතු කර ගත්තා යැයි සිතමු. ඔවුන්ද ඒ කසළ දමන්නේ රජයේ හෝ පෞද්ගලික හිස් ඉඩමකටය; නැතහොත් කැළෑබද පෙදෙසකයටය. එහි ප්‍රතිඵලය වන්නේ බ්ලූමැන්ඩල්, කොලොන්නාව වැනි කුණු කඳු ගොඩනැගීමයි. අනෙක් පැත්තෙන් ඔවුන් විසින් කුණු රැගෙන නොගියේ යැයි සිතමු. එවිට සිදුවන්නේ, කුණු කඳු විමධ්‍යගත වීමය; මඟ දෙපස කුඩා කුණු කඳු නිර්මාණය වීමය. කසළ රැගෙන ගියත් අර්බුදයකි; නොගියත් අර්බුදයකි. මෙය උභතෝකෝටිකයකි. මෙහි වරද කාගේ වුවද දෙකෙහිම ප්‍රතිඵලය සමස්ත සමාජයටම ලැබෙන්නකි.

**කුණු අයිතිය**

අප රටේ ජනයාට නගර සභාව කිවූ පමණින් මනසේ මැවෙන්නේ කුණු අදින්නට තිබෙන ආයතනය ලෙසයි. එමගින් වෙනත් රාජකාරී කටයුතු බොහොමයක් සිදුවුවත් ජනතාවට දැනෙන ප්‍රධානතම කටයුත්ත එයය. අනෙක් අතට නිත්‍යානුකූලවද එම අයිතිය ඇත්තේද මෙම ආයතනවලටය. ඒ අනුව මෙරට මහ නගර සභා 22ක්, නගර සභා 42ක් සහ ප්‍රාදේශීය සභා 275ක් පිහිටුවා ඇත. ඒ කෙසේ වුවත් පොදුවේ ගත් විට රට තුළ කැලි කසළ පිළිබඳ ගැටලුව පළාත් පාලන ආයතන ගැටලුවකින් ඔබ්බට ඔඩු දුවා ඇති බව තවදුරටත් රහසක් නොවේ.

**කොහෙත් මෙහෙමද?**

අපේ රටට කැලි කසළ අර්බුදයක් බවට පත්වෙද්දී ලෝකයේ ඇතැම් රටවලට මෙය ඉතා වටිනා සම්පතක් බවට පත් තිබේ. ඒ, ඔවුන් නිසි පරිදි කසළ කළමනාකරණය කර ගනිමින් තිබෙන හෙයිනි. එහෙයින් ඒ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ විද්‍යාත්මක පසුබිම දෙස මදක් අවධානය යොමු කරමු. එහි එක සංකල්පයක් වන්නේ, මූලාශයේදී වෙන් කිරීම (Separation at the source) යන්නයි. එනම් කැලි කසළ නිපදවන ස්ථානයේදීම ඒවා වර්ගීකරණයකට ලක් කිරීමයි. නිදසුනක් ලෙස ගතහොත් නිවසකදී හෝ රාජකාරී ආයතනයකදී සියලු කුණු එක මල්ලකට නොදමා කඩදාසි, යකඩ, ප්ලාස්ටික්, පොලිතින්, වීදුරු හා දිරාපත්වන ඉඳුල් වැනි ද්‍රව්‍ය වෙන වෙනම මළු තුළ බහා තැබීමයි. මේ තත්වය යටතේ ඒවා වෙන් වෙන් වශයෙන් අදාල කටයුතු සඳහා යොමු කිරීමට අවස්ථාව සැලසේ. මෙමෙ ද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් එකතු කිරීමට වැඩපිළිවෙළක් තිබෙන ස්ථානයක මෙම ආරම්භක වෙන් කිරීම ඉතා ප්‍රයෝජනවත් වේ.

> "කසළ මෙවැනි ආදායම් උපදවාගත හැකි ද්‍රව්‍යයක් බවට පත් කරගෙන ඇත්තේ රාජ්‍ය මැදිහත් වීම මගිනි. එම රටවල දේශපාලන අධිකාරීත්වය විසින් අදාල නිලධාරි ඊට අදාළ යාන්ත්‍රණය නිසි පරිදි මෙහෙයවා ගැනීම තුළ මේ තත්වයන් අත් පත් කර ගැනීමට හැකිව තිබේ. "

තවත් කසල කළමණාකරණ සංකල්පයක් වන්නේ 3R System යන්නයි මෙහි reduce, reuse, recycle යන වචන අන්තර්ගත වේ. එනම් reduce යනු නිපදවන කුණු ප්‍රමාණය අවම කර ගැනීමයි. එය මෙසේ තේරුම් ගත හැක. අප ෆුඩ් සිටි වෙළඳ සලකින් කිසියම් භාණ්ඩ කිහිපයක් මිලදී ගන්නවා යැයි සිතමු. එවිට ඔවුන් එම භාණ්ඩ අපට ලබාදෙනු ලබන්නේ සෑම භාණ්ඩයක්ම වෙන වෙනම ෂොපින් මලු තුළ අසුරා ඒ සියල්ලම නැවත එක ෂොපින් මල්ලක බහාය. එවිට මිලදී ගත් භාණ්ඩ ප්‍රමාණයට වඩා ෂොපින් මලු ප්‍රමාණයක් අප විසින් නිවෙස වෙත රැගෙන එනු ලබයි. නමුත් එම ෂොපින් මලු වෙන වෙනම ලබාග ැනීම ප්‍රතික්ෂේප කර එම භාණ්ඩ එක මල්ලක දමාගෙන පැමිණියේ නම් අප නිපදවන කුණු ප්‍රමාණය අවම කර ගත හැක. reuse යනු නැවත භාවිතා කිරීමයි. නැවත නැවත භාවිතයට ගත හැකි බෑග් වර්ග භාවිතා කිරීම මෙයට නිදසුන් ලෙස ගත හැක. ඉහත ක්‍රම දෙකම භාවිතා කිරිමෙන් නිපදවන කුණු ප්‍රමාණය අවම කර ගත හැක. recycle යනු ප්‍රතිචක්‍රීකරණයයි මෙය අවසාන පියවර වන අතර මේ සඳහා කිසියම් වියදමක් දැරීමට සිදුවන අතර එකිනෙකාට පෞද්ගලිකව සිදු කළ නොහැක. භාවිතයෙන් ඉවත් කරන දිරාපත් නොවන අපද්‍රව්‍ය නැවත පරිභෝජනයට ගත හැකි ආකාරයේ ද්‍රව්‍ය බවට පත් කිරීම මේ ක්‍රමය තුළින් සිදු කරනු ලබයි.

**කසළ වටිනාකම**

ඉහත සංකල්ප අනුගමනය කරමින් කටයුතු කළහොත් කසළ සඳහා වටිනාකමක් මෙන්ම පරිසරය දූෂණයද යම් පමණකට අවම කර ගත හැක. ඒ මන්ද ලෝකයේ දියුණුයැයි සම්මත ඇතැම් රටවල් මේ ක්‍රම තුළින් ආදායම් උපදනවා මෙන්ම පරිසරයද ආරක්ෂා කරගනු ලබයි. එම රටවල කසළ වර්ගීකරණ ක්‍රියාවලියක් එවා නිපදවන ස්ථානයේදීම සිදුවන බැවින් (Separation at the source) බොහෝ විට සිදුවන්නේ කඩදාසි, ප්ලාස්ටික්, වීදුරු වැනි දිරාපත් නොවන ද්‍රව්‍ය යොදාගනිමින් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය මගින් නොයෙක් භාණ්ඩ නිපදවා වෙළඳපොළට එවීමයි. එසේම දිරාපත් වන අපද්‍රව්‍ය යොදාගනිමින් ජීව වායුව මෙන්ම විදුලිය නිපදවීම වැනි කටයුතුද සිදු කරනු ලබයි. එසේම අප වැනි රටවල වතු පිටි එළිපෙහෙළි කිරීම්වලදී කපා ඉවත් කරන ගස් මෙන්ම අතු රිකිලිද බොහෝ විට සිදු කරනු ලබන්නේ පුළුස්සා දැමීමයි. නමුත් ඇතැම් රටවල එම ඉවත් කරන ගස් ආදිය කුඩා කොටස්වලට වෙන් කරමින් කුඩු බවට පත් කර පොහොර ආදිය නිපදවීමට යොදා ගනී. එසේම ගොඩනැගිලි කඩා ඉවත් කරනු ලබන ද්‍රව්‍ය කොහේට හෝ තල්ලු කර දමනවා වෙනුවට ඒවා කුඩු කර එම කුඩු තාර සමග මිශ්‍ර කර නැවත ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගනු ලැබේ. මීට අමතරව තවත් විවිධ භාණ්ඩ නිපදවීම සඳහාද මේවා යොදා ගනු ලබයි. ඉහතින් සඳහන් කරනු ලැබුවේ කසළවලින් ආදායම් උපදවන ආකාර කිහිපයක් පමණි.

ඉහත සඳහන් කළ ආකාරයේ රටවල කසළ මෙවැනි ආදායම් උපදවාගත හැකි ද්‍රව්‍යයක් බවට පත් කරගෙන ඇත්තේ රාජ්‍ය මැදිහත් වීම මගිනි. එම රටවල දේශපාලන අධිකාරීත්වය විසින් අදාල නිලධාරි ඊට අදාළ යාන්ත්‍රණය නිසි පරිදි මෙහෙයවා ගැනීම තුළ මේ තත්වයන් අත් පත් කර ගැනීමට හැකිව තිබේ. ඔවුන් මේ කැලි කසළ කළමනාකරණය ආරම්භ කරනු ලබන්නේ, නිවසින් එළියට දැමුවාට පසුව නොව නිවස තුළ සිටමය. විශේෂයෙන් කුඩා ළමුන්ගේ සිට වැඩිහිටියන් දක්වා කසළ කළමනාකරණය සම්බන්ධයෙන් අවබෝධය ලබාදෙනු ලබයි. ජපානය වැනි රටවල පෙර පාසැල් අවධියේ සිට අපද්‍රව්‍ය වර්ගීකරණය සම්බන්ධයෙන් අදහසක් ළමුන් වෙත ලබාදේ. ඒ පංති කාමරය තුළ විවිධ වර්ණ සහිත බඳුන් තබා ඒ ඒ අපද්‍රව්‍ය සඳහා දැමීමට අදාල වර්ණ හඳුන්වාදීමෙනි. නිල් පැහැති බඳුනට කඩදාසි, තැඹිලි පැහැති බඳුනට ප්ලාස්ටික් යනාදී වශයෙනි. පසුව රට පුරාද මෙම වර්ණ සහිත බඳුන් ක්‍රමය ක්‍රියාත්මක වනු ලබයි. ජාත්‍යන්තරවද මෙම අපද්‍රව්‍ය වෙන් කිරීමේ වර්ණ කෝඩ් ක්‍රමයක් (International Colour Code) ක්‍රියාත්මක වේ. තවද ඒ රටවල මග තොටේ කසළ දැමීම දඩුවම් ලැබිය යුතු වරදක් ලෙස සැලකේ. සිංගප්පූරුව වැනි රටක ටොෆි කොළයක්, බස් ටිකට් එකක් පවා පාරට දැමීමද වරදකි.

පරිසර හානිය වළක්වා ගැනීමේ ක්‍රමයක් ලෙස කසළ දහනය කිරීමේ ක්‍රියාවලියක්ද 15වැනි පිටුවට



"මාක්ස් පොත්වල විශාලත්වය, කවරයේ ඝනකම හා ප්‍රමාණය අනුව ඒවා වර්ග නොකළේය. ඔහු ඒවා වර්ග කළේ මාතෘකා හා විෂයයන් අනුවය. ඔහුට පොත් අධ්‍යාත්මික ආහාර විය. 'පොත් මගේ වහලුන්ය. ඒවා මට ඕනෑ හැටියට සේවය කළ යුතුයැ'යි ඔහු කීවේය."

**මාක්ස් ගැන - පෝල් ලාපාර්ග්**

# අධ්‍යාපන පෞද්ගලීකරණයේ තවත් පියවරක්

# හෙද උපාධියත් මුදලට



අධ්‍යාපනය විකිණීම සම්බන්ධ කතිකාව කාලයක් පුරාවට සාකච්ඡාවට බඳුන් වෙමින් තිබේ. නිදහස් අධ්‍යාපනය අයිතියක් ලෙස තහවුරු කර ගැනීම සඳහා සරසවි සිසුන් මෙන්ම දෙමව්පියෝද සිවිල් සංවිධාන හා දේශපාලන පක්ෂද කලක පටන් අරගලවල නිරතව සිටිති. පාලකයෝ එකී අරගල හමුවේ විටෙක පසු බසිමින්ද විටෙක ඉදිරියට පැමිණෙමින්ද ඔවුන්ගේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා උත්සහ ගනිමින් සිටිති. මෑත කාලයේ මහත් ආන්දෝලනයට තුඩුදුන් වෛද්‍ය උපාධිය මුදලට විකුණන සයිටම් ආයතනය හා තවත් ආයතන ගණනාවක් ඉදිරියේ දී උපාධි මුදලට විකුණන ආයතන ලෙස ස්ථාපිත කිරීමට වත්මන් රනිල් මෛත්‍රී හවුල් ආණ්ඩුව කටයුතු සූදානම් කරමින් සිටී.

**විකිණීමේ සැලැස්ම**

අපේ රටේ සෞඛ්‍ය සේවාව තුළ විශේෂිත කණ්ඩායම වන්නේ වෛද්‍යවරුන් වුවද හෙද හෙදියන් රෝගී සත්කාර සේවාවේදී විශේෂ කාර්යයක් උසුලනු ලබයි. රෝගියාත් වෛද්‍යවරයාත් සහයක කාර්යමණ්ඩලයත් අතරමැද සම්බන්ධීකරණ කාර්යය සිදුකිරීමේ වගකීම පැවරෙන්නේ හෙදියටයි. ඒ නිසාම රෝගී සත්කාර සේවය අදාළ විධිමත් පුහුණුවක් හෙද හෙදියන්ට ලබාදීම සඳහා සැලසුම් සහගත වැඩපිළිවෙලක් සකස් කිරීමේ වගකීම ආණ්ඩුව බාරගත යුතුව ඇත. නමුත් පසුගිය ආණ්ඩු සේම වත්මන් ආණ්ඩුවද එම කාර්යයට මැදිහත්වනවා වෙනුවට මුදල් ගෙවා හෙද පුහුණුව ලබාගැනීම සඳහා 'උපාධි කඩයක්' විවෘත කිරීමට සැලසුම් සකස් කරමින් සිටී. රාජ්‍ය සේවය තුළ මේ වන විට හෙද හෙදියන් 31,000ක් පමණ සේවයේ නිරත වන අතර ඔවුන් සඳහා තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් හෙද විදුහල්වල පවත්වයි. එසේම වැඩිදුර අධ්‍යාපනය සඳහා රජයේ විශ්ව විද්‍යාලයක හෙද උපාධිය ලබාගැනීමට ඉඩකඩ විවෘතව ඇත. බඳවා ගන්නා ප්‍රමාණය පිළිබඳව සෑහීමකට පත්වීමට නොහැකි නමුත් දැනට රජයේ මැදිහත් වීමක් තිබේ. අවශ්‍ය වන්නේ, එය තවදුරටත් පුළුල් කරමින් හෙද උපාධිය සඳහා තව තවත් සිසු සිසුවියන් බඳවාගෙන රෝගී සත්කාර සේවාව වඩාත් විධිමත් කිරීමයි. නමුත් වත්මන් ආණ්ඩුව අධ්‍යාපනය වෙළඳ භාණ්ඩයක් කිරීමේ ප්‍රතිපත්තිමය ස්ථාවරයක සිටියි. ඒ අනුව අද වන විට හෙද විදුහල්වලින් ලබන හෙද ඩිප්ලෝමාවත් රජයේ විශ්වවිද්‍යාලවලින් ලබන හෙද උපාධියත් විවෘත වෙළඳපොළේ විකුණා දැමීමේ ආණ්ඩුවේ සූදානම හේතුවෙන් හෙද සේවාව මෙන්ම රෝගී සත්කාර සේවාවද අර්බුදයකට ගමන් කරමින් තිබේ.

මෙම 'උපාධි කඩවල' හෙද උපාධිය සඳහා බඳවාගැනීමේ සුදුසුකම් මොනවාද යන්න නිශ්චිත නැත. එසේම ඒ සඳහා අදාල ක්‍රමවේදය කුමක්ද යන්නද පැහැදිලි නැත. පැහැදිලි එකම කරුණ වන්නේ, මුදල් ගෙවා උපාධියක් ලබාගත හැකිය යන්න පමණි. මුදල් ගෙවීමෙන් ලබන උපාධිය අපේ රටේ නිදහස් අධ්‍යාපනය භුක්ති විඳින දරුවන්ට බරපතළ මරු පහරක් වනු ඇත. විශේෂයෙන් අධ්‍යාපනය වෙළඳ භාණ්ඩක් වූ විට එය මිලදී ගැනීමේ හැකියාව සහිත කණ්ඩායම පමණක් එය මිලදී ගනු ලබන අතර එවැනි හැකියාවක් නැති දරුවන්ට අධ්‍යාපනයේ අයිතිය අහිමි වනු නිසැකය. උසස්පෙළ සමත් දරුවන්ට ලකුණු මදිවීම නිසා තවදුරටත් ඉදිරියට ඉගෙන ගැනීමේ අවස්ථාව අහිමිවන විට මුදල් හැකියාව ඇති දරුවන්ට පමණක් තවදුරටත් ඉගෙනීමේ ඉඩකඩ විවරවීම කිසිසේත්ම සාධාරණ වන්නේ නැත.

**හෙද උපාධි කඩ**

මෙතෙක් කලක් අධ්‍යාපන පෞද්ගලීකරණයට අදාළ සාකච්ඡාව දෝලනය වූයේ හෙද හෙදියන් සම්බන්ධ කරගනිමින් නොවේ. විශේෂයෙන් වෛද්‍ය උපාධිය විකිණීමට අදාළ කාරණාවන් ප්‍රබලව මතුවන විටදී පවා හෙද හෙදියන් තමන්ට එවැනි අභියෝගයකට මුහුණ දීමට සිදුවනු ඇතැයි කිසිසේත්ම කල්පනා නොකළා විය යුතුය. නමුත් මේ වන විට ප්‍රශ්නය ප්‍රබල ලෙස දොරකඩ පාමුලටම පැමිණ තිබේ. හෙද උපාධි විකිණීම සඳහා උපාධි කඩ 05ක් රාජ්‍ය අනුග්‍රහය සහිතව ක්‍රියාත්මක වීම ආරම්භ කර ඇත. මැලේසියානු සමාගමක් වන IIIHS සමාගම මේ වන විට එක් උපාධි කඩයක් රට තුළ ආරම්භ කිරීම සඳහා සියලු කටයුතු අවසන් කර ඇත. එසේම ජපන් සමාගමක් වන KATSU සමාගමද කොරියානු සමාගමක් වන INJE සමාග මද බ්‍රිතාන්‍යයේ ක්‍රියාත්මක සමාගමක් වූ ICBTසමාගමද මාලඹේ සයිටම් ආයතනයද හෙද උපාධිය විකිණීම සඳහා ආණ්ඩුවේ අනුග්‍රහය අපේක්ෂා කරන පෞද්ගලික ආයතන වේ.

රු. ලක්ෂ 2 සිට ලක්ෂ 15 දක්වා හෙද උපාධිය විකිණීම සම්බන්ධ මුදල තීරණය කර ඇත. නමුත් මේ කිසිදු ආයතනයකට හෙද සභාවේ අනුමැතිය තවමත් ලබා ගැනීමට නොහැකි වී ඇත. එයින් පැහැදිලි වන්නේ මෙම ආයතනවල හඳුන්වා දී තිබෙන පාඨමාලා කිසිසේත්ම රෝගී සත්කාර සේවාවට අදාළ විධිමත් පාඨමාලා නොවන බවයි. විකිණීම අරමුණු කර ගනිමින් වෙළඳපොළට නිකුත් කරනු ලබන භාණ්ඩවල අපේක්ෂිත ව්‍යාපාරික අරමුණ වන්නේ ලාභය මිස අන් යමක් නොවේ. හෙද උපාධියද මෙම නියාමයෙන් ගලවාගත නොහැකිය.

ජපන් KATSU සමාගම මේ වන විට ආණ්ඩුව සමග ගිවිසුම් අත්සන් කර අවසන් කර තිබේ. විකිණීම තම ප්‍රතිපත්තිය නොවන බව ජනතාව හමුවේ දිවුරා ප්‍රකාශ කරනු ලැබූ රාජපක්ෂ පාලන සමයේදී මෙකී ජපන් KATSU සමාගමට අනුමැතිය ලබා දී ඇත. 2015/01/07 වන දින ලබාදී ඇති අනුමැතියට අනුව මෙම ජපන් සමාගම ඔවුන්ගේ වැඩ ආරම්භ කර ඇත. එනම්

> "මෙම 'උපාධි කඩවල' හෙද උපාධිය සඳහා බඳවාගැනීමේ සුදුසුකම් මොනවාද යන්න නිශ්චිත නැත. එසේම ඒ සඳහා අදාල ක්‍රමවේදය කුමක්ද යන්නද පැහැදිලි නැත. පැහැදිලි එකම කරුණ වන්නේ, මුදල් ගෙවා උපාධියක් ලබාගත හැකිය යන්න පමණි. මුදල් ගෙවීමෙන් ලබන උපාධිය අපේ රටේ නිදහස් අධ්‍යාපනය භුක්ති විඳින දරුවන්ට බරපතළ මරු පහරක් වනු ඇත."

රාජපක්ෂ පාලනය විසුරුවා හැරීමට දිනකට පෙර එම උපාධි විකුණන ආයතනයට නීත්‍යානුකූල අවසරය ලබාදීම මගින් ගම්‍ය වන්නේ නිසැක වශයෙන්ම සැලකිය යුතු මුදලක් හුවමාරු වූවා යන්නයි. එය එසේ නොවන්නේ නම් ආණ්ඩුව විසුරුවා හැරීමට දවසකට පෙර මෙවැනි උපාධි විකුණන ආයතනයකට අවසර දීම කිසිසේත්ම සිදු නොවනු ඇත.

කොරියානු සමාගමක් වන INJE සමාගමද මේ වන විට ගිවිසුම් අත්සන් කර ඇති නමුත් තවමත් ඒ පිළිබඳව තොරතුරු හෙළිදරව් කර නැත. වත්මන් උසස් අධ්‍යාපන ඇමතිවරයා සහ හෙද සංගම් වෘත්තීය සමිති නායකයෙකු ලෙස පෙනී සිටිමින් ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය තීරණයන්ට උපරිම සහය පළ කරමින් වෛද්‍ය උපාධිය විකිණීම සාධාරණීකරණය කිරීමට පසුගියදා මැදිහත් වූ තැනැත්තෙකුද මෙකී සමාගම සමග ගිවිසුම් අත්සන් කිරීමට දායක වී ඇතැයි තොරතුරු හෙළිදරව් වෙමින් තිබේ. මේ ආකාරයට අනෙකුත් ආයතන සමගද ගිවිසුම් අත්සන් කරමින් හෙද උපාධිය විකිණීම සඳහා කටයුතු එකින් එක සම්පූර්ණ කරමින් සිටී.

දැනට මෙම හෙද උපාධි ආයතන හෙද සභාව නීත්‍යාණුකුල ලෙස පිළිනොගැනීම නිසා එම ව්‍යාපාරිකයන් සහ ඔවුන්ට ආවතේව කරන ව්‍යාපාරික සහයකයන් ගැටලුවකට මුහුණ පා ඇති නමුත් ආණ්ඩුව සූදානම් වන්නේ එකී ගැටලුව නිරාකරණය කර දීමට බව පැහැදිලිය. ඒ සඳහා වන ආණ්ඩුවේ සැලැස්ම මේ වන විට හෙළිවෙමින් තිබේ. ඒ අනුව හෙද උපාධි විකිණීමට අදාළ ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය ලිහිල්භාවය නුදුරේම ප්‍රකාශයට පත්කරනු ඇත. අපේ රටේ සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය රැඳවා තබා ගැනීම සඳහා නිදහස් අධ්‍යාපන හිමිකමද එක් සාධකයක් ලෙස සැලකේ. ඒ නිසාම ලෝකයේ ඕනෑම රටක ශ්‍රී ලංකේය සෞඛ්‍ය සේවකයන්ට සුවිශේෂී වටිනාකමක් හිමිව තිබේ. නමුත් හෙද වෛද්‍ය හා තවත් සෞඛ්‍ය සේවාවන් වලට අදාළ ක්ෂේත්‍ර මුදලට විකිණීම සඳහා කටයුතු සිදුවන විට ජාත්‍යන්තර වශයෙන් එම ක්ෂේත්‍රයන්වලට හිමි වටිනාකම අහෝසි වනු නිසැකය.

**සටන පෙරට**

මෙතෙක් කලක් අපේ රටේ පෞද්ගලීකරණය සම්බන්ධ සාකච්ඡාව පැවතියේ රාජ්‍ය ආයතන හා සරසවි අධ්‍යාපනයට අදාළ තෝරාගත් නිශ්චිත විෂය කාණ්ඩයන් සඳහා පමණි. එහිදී වැඩිපුරම සාකච්ඡාවට භාජනය වූයේ වෛද්‍ය උපාධියයි. වෛද්‍ය උපාධිය මුදලට විකිණීම සම්බන්ධ සාකච්ඡාවේදී බොහෝ සෞඛ්‍ය සේවකයින් එය තමන්ට අදාළ කාරණාවක් සේ පිළිගැනීමට උනන්දු වූයේ නැත. නමුත් ප්‍රශ්නය මේවන විට පුළුල් පරාසයන් තුළට ගමන් කරමින් තිබේ. ඒ හමුවේ කිසිවෙකුටත් එයින් ගැලවීමක් නොමැති බව පැහැදිලිය. හෙට දවසේ දී එකී පෞද්ගලීකරණ ක්‍රියාවලිය සෑම ක්ෂේත්‍රයක්ම පසාරු කරගෙන ගමන් කරනු නිසැකය. එම නිසා පෞද්ගලීකරණයට එරෙහි සටන තවදුරටත් සරසවි සිසුවාට පමණක් අයත් සටනක් නොවේ. එසේම එය වෛද්‍ය සිසුවාට හෝ වෛද්‍යවරයාට අයත් සටනක් පමණක් නොවේ. එපමණක් නොව එය දේශපාලන පක්ෂයකට හෝ සිවිල් සංවිධානයකට හෝ දෙමාපියන්ට හෝ පමණක් සීමාවන සටනක් නොවේ. එය අපේ රටේ අනාගතය සම්බන්ධ සටනක් වනු නිසැකය. එම නිසාම රටේ අනාගතය පිළිබඳව සිතන කල්පනා කරන ඇදහස් ඇති සහ අදහස් දක්වන සෑම පුරවැසියෙකුගේම සටනක් බවට මෙය පත්කරගත යුතුව ඇත. එවැනි ආකාරයට මෙම සටන ඉදිරියට රැගෙන යාමට සමත් වන්නේ නම් පමණක් පෞද්ගලීකරණය සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නිසැක ලෙසම පරාජයට පත්කළ හැකිය.

මෙකී කරුණු සැලැකිල්ලට ලක් කරන විට අපේ රටේ උසස් අධ්‍යාපනය හදාරන දරුවන් සිටින දෙමාපියන් සේම රටේ අනාගතය පිළිබඳව යහපත් ආකරයට සිතන සෑම පුරවැසියෙකුම අධ්‍යාපන පෞද්ගලීකරණය එරෙහි සටනේ කොටස්කරුවෙකු විය යුතුව ඇත. ආණ්ඩුව ඔවුන්ගේ ආර්ථික උපායමාර්ගයට අනුව විකිණීම ප්‍රතිපත්තිය කරගනු ලබන්නේ තවදුරටත් සුභසාධන කාර්යයන් සඳහා මැදිහත්වීමට තරම් ආණ්ඩුවට හැකියාවක් නොමැති නිසා බව ඉතා පැහැදිලිය. සියල්ල මුදල් මත තීරණය කරන පාලක පැලැන්තියකින් නිදහස් අධ්‍යාපනයක් බලාපොරොත්තු විය නොහැකි නමුත් දැනට අඩුපාඩුකම් සහිතව නමුත් පවතින නිදහස් අධ්‍යාපන අයිතිය බේරා ගැනීම වෙනුවෙන් පෙනීසිටීමේ වුවමනාව වඩ වඩාත් වැඩියෙන් දැනෙමින් ඇත. ඒ සඳහා ක්‍රියාත්මක වීමේ වගකීම නිදහස් අධ්‍යාපනය අයිතියක් ලෙස පිළිගන්නා සියලු දෙනාට අත්හළ නොහැකි වගකීමකි.



# අලුත් සිතීමක් වෙනුවෙන්...

## වෙනස් වෙමු...!

දිනෙක එල දරන අටියෙන
අංකුර එකින් එක දළුලන
ඉඩෝරය සිඳලන
බලන් සැප්තැම්බරය පිබිදෙන

සල්පිල් තුළම මියයන
පුස්තක අතර හිනැහෙන
දාඩිය පුසුඹ හඳුනන
අකුරු ඇත ජීවිතය ගලපන

සහිත බව වැනසුන
පිටු තුළ අරුත් සැඟවුන
දහක් වැකි කුමටද
පෙළක් මිස නෙත් පාදන

මල කෑ අඟුල් බිඳලන
ගිලන් හිස් සුවපත්වෙන
කවිය අවියක් වන
අරුම විඳගමු සතුටින

නින්දෙන් සොරාගෙන
කාලය ඉතිරි කරගෙන
වෙනසක් කරනු රිසියෙන
වෙනස් වෙමු හොඳ පොතක් අරගෙන.

''හොඳම දේ දරුවන්ට'' මෙසේ පැවසූයේ විප්ලවීය නායක ලෙනින් සහෝදරයාය. සමාජවාදී රාජ්‍යයක් වන සෝවියට් දේශය නිර්මාණය කළ ලෙනින් ඇතුළු සමාජවාදී නායකයින් දරුවන් සඳහා හොඳ පෝෂණයක්, යහපත් සෞඛ්‍යයක්, හොඳ අධ්‍යාපනයක් ලබාදීම රජයක මූලික වගකීමක් සේ සලකා කටයුතු කරන ලදි. ඒ, රටක අනාගත පරපුර හැමවිටම සැඳුම්ලන්නේ දරුවන්ගෙන් වන බැවිනි.

සමාජවාදී රාජ්‍යයන් හොඳම දේ දරුවන්ට ලබාදීමට කටයුතු කරනුයේ රටට හොඳ පුරවැසියන් බිහි කිරීමේ අරමුණ ඇතිවය. සමාජ සංවර්ධනය උදෙසාත් සාධාරණ හා යුක්ති සහගත සමාජයක් ගොඩ නැගීම උදෙසාත් නිරෝගී, උගත්, බුද්ධිමත් පරපුරක අවශ්‍යතාවය ඔවුන් හොඳින් වටහාගෙන ඇත. එනිසා දරුවන් රටේ සම්පතක් සේ සලකා ඔවුන්ට අවශ්‍ය සියලු පහසුකම් සලසා දීමට සමාජවාදී පාලනයන් පියවර ගෙන ඇත.

එහෙත් අපේ රටේ පාලකයන් දරුවන් සම්බන්ධව දක්වන ආකල්පයන් වචනවලින් කෙසේ පිටකළද ඔවුන්ගේ ක්‍රියාකලාපයන් ඊට හාත්පසින්ම වෙනස් බව පෙනේ. පාලකයින් හැමවිටම පෙන්වා ඇත්තේ තමන්ගේ බලය තහවුරු කර ගැනීමට නැතහොත් තමන්ගේ බලය ගොඩනගා ගැනීමට දරුවන් යොදා ගත හැකි නම් ඔවුන් ඊටද පසුබට නොවන බවය. පසුගිය මහින්ද රාජපක්ෂ පාලන සමයේ මෙය වඩාත් හොඳින් කැපී පෙනිණි. එකල ආණ්ඩුවේ මාධ්‍ය මගින් නිතරම ප්‍රචාරය වූ මහින්ද රාජපක්ෂ වෙනුවෙන් නිර්මාණය කළ 'මහ රජානෝ' ගීතය ඊට හොඳ නිදසුනක් වන අතර එය ගායනා කිරීමට යොදා ගත්තේද පාසල් දරුවෙකි.

එසේම ඒකාබද්ධ විපක්ෂය යයි කියාගන්නා කණ්ඩායම විසින් මෑතදී සංවිධානය කළ පාගමනේදී කුඩා දරුවකු ලවා සටන් පාඨ කියවන අයුරු විවිධ මාධ්‍ය හරහා ප්‍රචාරය වුණි. එම දරුවාගේ මවද ඒ අසල හිඳිමින් දරුවාට ඒ සඳහා අනුබල දෙමින් සිටිනු දැකිය හැකි විය. එම පාගමන සඳහා සහභාගී වූ අපේ මව්වරුන් පළමු කොටම තේරුම් ගත යුත්තේ එම පාගමන සැලසුම් කර තිබුණේ කුමක් සඳහාද යන්නයි. රාජපක්ෂ පාලන සමයේ වංචා දූෂණ චෝදනාවන්ට ලක්වූවන් විසින් තමන්ට එරෙහිව කෙරෙනු ලබන පරීක්ෂණයන්ට යම් බලපෑමක් කරනු පිණිස එය සංවිධානය කරනු ලැබූ බව පැහැදිලිය. ඒ දුෂ්ට අරමුණ වටහා ගැනීමට එයට සහභාගි වූ මව්වරුන් සමත් වී ඇති බවක් නොපෙනේ. ඒ තුළ ඔවුන් නොදැනුවත්ම දූෂිතයින් ආරක්ෂා කිරීමටත් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමටත් කටයුතු කර ඇත.

සෑම අම්මා කෙනෙකුම උත්සාහ කරන්නේ හොඳම දේ තම දරුවන්ට ලබාදීමටය. එහෙත් ධනවාදී රාජ්‍යයන් තුළ එය තීරණය වන්නේ පවුලේ හැකියාව මතය. ඇතැම් විට දෙමාපියන්ගේ අවබෝධයේ තරම මතය. නිවැරදි අවබෝධයක්, නිවැරදි දැක්මක් නොමැතිකම විසින්, විශේෂයෙන් අපේ රටේ බහුතරයක් අම්මාවරුන් වඩාත් වැඩියෙන් රැවටීමට ලක්ව ඇත්තේ දේශපාලනය තුළය. යමක් නිවැරදිව අවබෝධ කරගැනීමේ ඇති දුර්වලතාවය විසින් තම දරුවන්ද වැරදි පාරවල් ඔස්සේ රැගෙන යාම ඉතා ඛේදනීය තත්වයක් නොවේද?

තම දරුවන්ද ඇතුළුව රටේ සෑම පුරවැසියෙකුම ලක්ෂ 5ක ණයකාරයෙක් බවට පත්කරනු ලැබූ, සෞඛ්‍යය, අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන මුදල් ප්‍රතිපාදන වසරින් වසර කප්පාදු කරනු ලැබූ, රාජ්‍ය දේපල තම පවුලේ සුඛ විහරණය වෙනුවෙන් යෙදවූ පරාජිත, දූෂිත පාලකයින් නැවත නැවතත් බලයට ගෙන ඒමට හා ඔවුන් වෙනුවෙන් පෙනී සිටින කාන්තාවන් තේරුම් ගත යුතු දෙයක් ඇත. ඒ තමන්ට නිවැරදි දැක්මක් නොමැතිකම හේතුවෙන් ඔවුන් වසර ගණනාවක් තිස්සේ රැවටීමට ලක්වෙමින් ඇති බවය; එසේ රැවටීමේ ප්‍රතිඵලයක් ලෙස තම කර මතින් අසාර්ථක, දූෂිත පාලකයින් බලයට නැවත නැවත ගෙන එමින් සිටින බවය; තම දරුවන්ද තමන් වැටුණු වළේම වැටීමට සලස්වමින් සිටින බවය; තම දරුවන්ගේ කර මතින් හිටපු පාලකයින්ගේ බේබිලා බලයට ගෙන ඒමට දරුවන් හුරු කරවමින් සිටින බවය. දැන්වත් මේ දුෂ්ට චක්‍රය වෙනස් විය යුතු නොවේද?

මව්වරුන් හා පියවරුන් දරුවන් හැදීම පමණක් ප්‍රමාණවත් නැත. ඔවුන්ට ඉගැන්වීමට, ඔවුන් තනි තනිව රැක ගැනීමට උත්සාහ දැරීම පමණක් ප්‍රමාණවත් නැත. දරුවන් සඳහා හොඳ සමාජයක්ද හැදිය යුතුය. දරුවන්ට හොඳම දේ දීමට හැකිවන්නේ එවිටය. ඒ සඳහා අලුත් කියවීමක්, අලුත් සිතීමක් අවශ්‍යය. මේ ඒ සඳහා කාලයයි.

## සිව්දෙසින්




### හිංසනයට එරෙහිව 50 000ක් වීදි බසී!

කාන්තා හිංසනයට හා ඒ සඳහා වූ අධිකරණ පද්ධතියේ උදාසීනත්වයට එරෙහිව අගෝස්තු 13 දින පීරූ හි අගනුවර හා වෙනත් නගර 8ක විරෝධතා උද්ඝෝෂණ පෙළපාලි පැවැත්වුණු අතර මෙහි දැක්වෙන්නේ ලීමා හි පැවැති උද්ඝෝෂණයේ අවස්ථාවකි.

මේ විරෝධතා පෙළපාලියට 50 000කට අධික පිරිසක් සහභාගි වූ අතර එය අවසන් වූයේ ලීමා නගරයේ අධිකරණ සංකීර්ණය ඉදිරිපිටිනි.

මෑත කාලයේ කාන්තාවන්ට එරෙහි හිංසනය සම්බන්ධ නඩු විභාග කිහිපයකදීම ඊට සම්බන්ධ අපරාධකරුවන්ට නියම කරනු ලැබූයේ පෙර නොවූ විරූ ආකාරයේ ඉතා මෘදු දඬුවම් බව එරට කාන්තා සංවිධාන පවසයි.

අගෝස්තු 13 දිනය එවැනි තීන්දුවක් දුන් ඉතිහාසගත දිනයක් වූ බවත් කාන්තාවන් පෙළන පීඩනය, විශේෂයෙන්ම හිංසනය නොවැදගත් කරුණක් සේ සලකන අලුත් යුගයක ආරම්භය සනිටුහන් කළ දිනයක් බවත් එම විරෝධතාවයට සහභාගි වූවන් පවසයි.

### ඉරාන තරුණියක් තනිව විරෝධතාවක...

රියෝ ඔලිම්පික් උළෙලේ බෙල්ජියම හා ඉරානය අතර පැවැති පිරිමි වොලිබෝල් මූලික තරගය අගෝස්තු 13 දින පැවැති අතර එහිදී ඉරාන තරුණියක් තරගය පැවැති ක්‍රීඩාංගණයට විරෝධතා බැනරයක් රැගෙන සිටි අයුරු මෙහි දැක්වේ.

'' ඉරාන කාන්තාවන්ට ඔවුන්ගේ ක්‍රීඩාංගණයන්ට ඇතුළුවීමට ඉඩදෙනු!'' යනුවෙන් එම බැනරයේ සඳහන්ව තිබූ අතර ඔලිම්පික් උළෙලේ ආරක්ෂකයින් එම බැනරය පහත දමන ලෙසත්, ඇයට එම ස්ථානයෙන් ඉවත් වන ලෙසත් ඉල්ලා සිටියද ඇය එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බව පැවසේ.




''මා සටන් කරනුයේ ඉරාන කාන්තාවන්ගේ මූලික අයිතියක් වෙනුවෙන්. මෙය සාමය හා මානව අයිතීන් පිළිබඳ පණිවිඩයක්.'' යැයි ඇය පවසා ඇති අතර බැනරය අල්ලාගෙන සිටීමෙන් තමාගේ දෑත් වෙව්ලුම් කෑවද තරගය අවසන් වනතුරු තමා එය අත් නොහැරියේ යැයිද පවසා ඇත.

ඉරානයේ කාන්තාවන්ට සියලුම පිරිමි තරග නැරඹීම තහනම් කර ඇත්තේ 1979 සිදු වූ ඉස්ලාමීය පෙරළියෙන් පසුවය.

නමින් සෆායි වන එම ඉරාන තරුණිය 1999 වසරේ ආණ්ඩු විරෝධී උද්ඝෝෂණවලට සහභාගිවීම හේතුවෙන් සිරබාරයටද පත් වූ අයෙකි. 2000 වසරේ සිට ඇය ජීවත් වන්නේ බෙල්ජියමේයි.

## කවුළුව හැර තබමි

# හොඳම එක!

පසුගියදා එක්තරා අන්තර්ජාල පර්යේෂණ ආයතනයක් විසින් විශේෂ වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනු අපි ජනමාධ්‍ය තුළ දුටිමු. එහි සඳහන් වූයේ ලංකාවේ පාර්ලිමේන්තුව තුළ හොඳම මැදිහත්වීම කරන්නේ, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී කණ්ඩායම බවයි. එහිදී ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා පළමු තැනටද හඳුන්නෙත්ති සහෝදරයා දෙවන තැනද පස්වැනි ස්ථානය නලින්ද සහෝදරයාටද පිළිවෙළින් අට හා දහය විජිත හා බිමල් සහෝදරවරුන්ටද විසි දෙක ගලප්පත්ති සහෝදරයාටද හිමිවී තිබිණි. එසේම නැගීඑන දක්ෂම තරුණ මන්ත්‍රීවරයා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා බව ප්‍රකාශකර තිබුණි. මේ සමීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රකාශ කළ පසු එ.ජා.ප. සමහර මන්ත්‍රීවරු එම සංවිධානයට දෝෂාරෝපණයද කර තිබූ බවටද වාර්තා විය. ජනතා විමුක්ති පෙරමුණ හැර ලංකාවේ දේශපාලන පක්ෂ දේශපාලනය හැර අන් හැම සෙප්පඩ විජ්ජාවක්ම කරනු ලැබේ. ඔවුන්ට දේශපාලනය යනු තමන්ගේ සහ තම පවුල්වල අයගේ සැපය සදන හුදු වාණිජ ව්‍යාපාරයක් පමණි.

ලංකාවේ දේශපාලනයේදී මෙතෙක් සිදුවී ඇත්තේ බලවත් පවුල් ඉස්මතුවීමය. එය පවුල් කේන්ද්‍රීය දේශපාලනයකි. ඒ වෙනුවට සමාජ කේන්ද්‍රීය දේශපාලනය ලංකාවට හඳුන්වා දුන්නේ ජනතා විමුක්ති පෙරමුණ යන්නට විවාදයක් නොමැත.

ලංකාවේ බලවත් පවුල් දේශපාලනයේදී ඉස්මතුවන්නේ නිෂ්පාදන ආර්ථිකයක් ලංකාව තුළ නොමැති නිසාය. පක්ෂය වෙනුවට පවුල වැදගත් වන නිසාය. ඊට වත්මනෙහි හොඳම නිදසුන රාජපක්ෂ පවුලය. මෙසේ බලවත් පවුල් මතුවන්නේ කුමන ආකෘතියකින්ද යන්න පිළිබඳ මූලික කතිකාවත සමාජයට රැගෙන



ආවේ ජනතා විමුක්ති පෙරමුණ විසිනි. එමෙන්ම එම තත්වය අභියෝගයට ලක්කළේද ඔවුන්මය. ඒ නිසාම එම පවුල් දේශපාලන කණ්ඩායම් වල බලවත් හතුරා බවට පත්වීමේ ගෞරවයටද ජවිපෙ අත්වී හමාරය. සතුරා හතර වටින් වටකොට ජ.වි.පෙ.ට පහර දුන්නද එය යළි යළිත් ඉදිරියටම පනින්නේ සමාජ කේන්ද්‍රීය දේශපාලනයක ජ.වි.පෙ. නිරතවන නිසාමය. ඉහත සමීක්ෂණයේ ප්‍රතිඵල කියාපාන්නේද එයයි.

ලංකාවේ අනෙක් දේශපාලන පක්ෂ පුද්ගල සහ පවුල් කේන්ද්‍රීය දේශපාලනය වටා භ්‍රමණය වනවිට ජ.වි.පෙ. සමාජ කේන්ද්‍රීය සාමූහික දේශපාලන සමාජ ව්‍යාපාරයක් ලෙස දිගටම ක්‍රියාත්මක වෙයි. මෙය ලාංකේය දූපත් දේශපාලනය තුළ ඉතා අසීරු කාර්යයක් විය. එහෙත් දැන් එම අසීරු කාර්යයේ වැඩවසම් බැමි එකිනෙක කඩා බිඳ වැටෙන්නට පටන් ගෙන තිබේ. එය ජනතා විමුක්ති පෙරමුණ සමාජ දේශපාලන ප්‍රහාරයේ ප්‍රතිඵලයකි. ඒ ගැන සියලු සතුරු පාර්ශව වියරු වැටෙමින් සිටියි. එහෙත් අපට කීමට සිදුවන්නේ, "උඹලාගේ ඔය මෝඩ ගල්වලින් ගසා" ජනතා විමුක්ති පෙරමුණ බිම දැමිය නොහැකි බව දිනෙන් දින තහවුරු වන බවයි.

# ප්‍රචණ්ඩත්වය පැවැත්මේ කොන්දේසියක් වූ කළ

යහපාලනය යනු ලංකාවේ ධනවාදය ඔතා තිබීමට රනිල් - මෛත්‍රී ආණ්ඩුව ලබා දුන් සුදු පිරුවයට කියන තවත් නමකි. අප වැනි පසුගාමී රටවල් තුළ ක්‍රියාත්මක වන නරුම ධනවාදය සිය පැවැත්ම තහවුරු කරගැනීමට යොදන ප්‍රබල උපකරණයකි භාෂාව. සුන්දර වචනවලින් යථාර්ථය වැසීම ධනවාදයේ උපන් ගතියකි.



යහපාලනය යනුද භාෂාමය ගොඩනැංවීමක් විය. එය කිසිසේත් පවතින ජඩ සමාජ ක්‍රමය දශමයකින්වත් වෙනසකට ලක්කරන ක්‍රියාන්විතයක් නොවේ. තමා විසින් තමාව රවටා ගැනීමත් තමා විසින් අනෙකාවද අනෙකා විසින් තමාවද රවටා ගැනීමත් හැර ධනවාදය විසින් මේ මොහොතේ අපට උරුමකරදී ඇත්තේ කුමක්ද?

මෙවැන්නක් අපට කීමට සිදුවුයේ මේ දිනවල ලංකාව පුරා හඹායන අපරාධ රැල්ල නිසාවෙනි. මෙය පොදුවේ "ප්‍රචණ්ඩත්වය" යන තනි වදනින් හඳුන්වනු ලබයි.

තමන්ගේ සතුටට බාධාකරන ඕනෑම දෙයක් විනාශකර දැමීමට මේ සමාජ ක්‍රමය තුළ මිනිසුන් දෙපාරක් හිතන්නේ නැත. කප්පම් ගැනීමට මිනිසුන් පැහැරගෙන ගොස් අමු අමුවේ මරා දැමීමේ සිට පාසැල් දරුවන්ගේ ගහමරා ගැනිල්ල දක්වා ප්‍රචණ්ඩත්වය දැන් සමාජය පුරා ඔඩුදුවා ඇත. ලංකාවේ දේශපාලන පක්ෂ ප්‍රචණ්ඩත්වයට විරුද්ධ වුවද ඉන් බොහෝ දේශපාලන පක්ෂවලට ප්‍රචණ්ඩත්වයෙන් තොර පැවැත්මක් නැත. ජනතා දේපොළ කොල්ලකා මිනීමරා වීරයන්සේ නිදහසේ හැසිරීමට ඉඩකඩ ලැබී තිබෙන ලංකාවේ ඊනියා පාලන තන්ත්‍රය තුළ ඉහළ එකාගේ සිට පහළ එකා දක්වා අපරාධ මානසිකත්වය වර්ධනය වීම අරුමයක් නොවේ.

දේශපාලන ප්‍රචණ්ඩත්වයේ සිට පෞද්ගලික ප්‍රචණ්ඩත්වය දක්වා ප්‍රචණ්ඩත්වය විහිදයාම සමාජ සබඳතා සමස්තයම අර්බුදයට යැවීමකි. ප්‍රචණ්ඩත්වය මේ යුගයේ පුද්ගලවාදයේ පැවැත්මේ කොන්දේසිය බවට පත්වී ඇත. ලාංකේය සමාජ ගැටලුවේ විවිධ ප්‍රකාශවීම් අතර ප්‍රචණ්ඩත්වය ඉස්මත්තට එමින් තිබේ. මේ සියල්ල සිදු වන්නේ හංදියක් හංදියක් ගානේ භාවනා පංති, අසපු, තුන්වේලාම බණ පිරිත්, පොලීසියේ ජීප්වල පවා මේ බුදුන්ගේ දේශයයි කියා ස්ටිකර්ද අලවා ඇති රටකය. මේ සියලු ව්‍යසනයන්වල මූලය හඳුනා ගෙන එය නසා දමනතුරු මොන වෘත රැක්කද ඵලක් නැත. එය කළ හැක්කේ දියුණු සමාජ ව්‍යාපාරයක මඟ පෙන්වීම යටතේම පමණි.

# ඔක්කොම කණපිට





නැවත බලයට ඒම සඳහා කෙටි මං සොයමින් සිටි රාජපක්ෂ කල්ලියේ ප්‍රයත්නයන් සියල්ල දැන් කණපිට හැරී තිබේ. බලය ගැනීම සඳහා "පන්සල් දේශපාලනයේ" දිගටම නියැලී සිටි ඒකාබද්ධ විපක්ෂය වශයෙන් නාමකරණය කර ගත් රාජපක්ෂ කල්ලිය හොඳටම නාගත්තේ පසුගියදා නුවර සිට කොළඹට ආ පාගමනේදීය. එහිදී රාජපක්ෂ නඩයේ "මෝඩ චූන්" දේශපාලනයේ හෙළුව මුළු රටටම ප්‍රදර්ශනය විය. ආණ්ඩුව පෙරළීමට යැයි කියමින් පුතා මහපාරේ "රිලා නැටුම්" නටන විට තාත්තා අඩි දහයක් පයින් ගොස් කිලෝමීරයක් අති සුඛෝපභෝගී වාහනයක නැගී ගමන් කළේය. අන්තිමේ "උද්ඝෝෂණ පාගමන්" යන්න තනිකරම කැරොල් කරත්තයක් කළේය. ලක්ෂ 20ක් කොළඹට ගේනවා යයි කියූ දේශපාලන ජෝකරයන්ගේ කටවල ඉබියතුරු වැටුනහ.

පවුල්වාදයත් ජාතිවාදයත් එකට කලතා පාර දිගේ නාගත් මේ උන්මත්තක කල්ලිය දැන් යන එන මං නැති තත්වයට පත්වී තිබේ.

මෛත්‍රී - රනිල් පාලනය විශේෂයෙන් රනිල්ගේ මැදිහත්වීම මගින් පාගමනට "බොරු" බාධක දමා එය යම් තරමකට හෝ උස්සා තැබීමට යටින් සපෝට් කළද අවසානයේ සිදු වුයේ රනිල් - මෛත්‍රී පාලනය තහවුරු කිරීමට රාජපක්ෂ කල්ලිය යටින් සපෝට් කිරීමය. පාගමනින් සිදු වූ එකම දෙය එයයි. මේ ආණ්ඩුව පෙරළා දමනතුරුම මහපාරේ සටන් කරන බවට පම්පෝරි ගැසූ රාජපක්ෂ නඩය දැන් ඒ ගැන වචනයක් කථා නොකරයි. මෙහිදී වඩාත්ම අසරණ වූයේ සහ විසුළුකාරී තත්වයකට පත්වූයේ රාජපක්ෂට සපෝට් කරන පරණ වමේ කල්ලියයි. කොහොමත් ඔවුන් දැන් තනිකරම ජෝකරයන් වී ඇති බව මුළු රටටම පෙනීගොස් හමාරය. මේ ජාතිවාදී උන්මත්තක නඩයේ අවසන් ගමනද එම පාගමන බවට සලකුණු තබමින් එය අවසන් විය. එය එක් පැත්තකින් රටට හිතකරය.

පාගමන අවසානයේ රාජපක්ෂ කල්ලියේ සියුමැලි යටිපතුල්වලට කිසිදු හානියක් සිදු නොවූවද රනිල් - මෛත්‍රී ආණ්ඩුව තහවුරු කිරීමට ඔවුන් දුන් සපොට් එක වෙනුවෙන් රනිල්ලා ප්‍රති උපකාර පුදනු ඇත.

# පොලිටිකල් පංතිය

"විනාසයි... විනාසයි..." පොලිටික්ක පංතියට ඇතුල් වුණේ යුරේකා... යුරේකා... කියාගෙන රජමාලිගේට දුවපු ආකිම්ඩීස් වගේ.

"ගුඩ් මෝනිං සර්" වසන්තිය විගහට කිවුවත් පොලිටික්කගෙන් රෙස්පොන්ස් නැතිවෙච්ච හින්දා අනුරුද්දිය බලපු බැල්මට වසන්තියට පොළොව පලාගෙන යන්න හිතුණ.

"මොකද්ද සර් විනාස වුණේ?" මංජුව ඇහුවෙ විනාශ වෙච්ච දේ හදල දෙන්න වගේ.

"විනාස වුණේද? විනාස වුණේ... හදවත." පොලිටික්ක පපුවට අත තියාගත්ත.

"ඇයි සර් බ්ලඩ් රිපෝට් එක අප්සෙට්ද?" කනියා ගෙදර කතාවකට ගලපන්න බැලුව.

"සුගර්ද කොලස්ටරෝල්ද?" චමිය කනියගෙ කතාව තව දුර ගෙනිච්ච.

"පිස්සුද ළමයිනේ මගෙ පපුව හොඳයි." පොලිටික්ක වීරය වගේ කිවුවට කටවහ වදී කියල බය හිතුණ. "නෑ මං කිවුවෙ... දැනට එහෙමට ලෙඩක් නෑ."

"එහෙනම් සර්, මොකද්ද විනාස?" අනුරුද්දිය බැලුවෙ මල්ල ලෙහන්න.

"ළමයිනේ විනාසයි කිවුවෙ හදවත... හදවත කියන්නෙ මව්බිම... මව්බිම කිවුවෙ රට බේරගත්ත රණවිරුවො" පොලිටික්ක චක්කරේ වගේ කියාගෙන ගියා.

"ඇයි සර් මොකද්ද කේස් එක?" කනියට අණ්ඩර දෙමළ.

"අතුරුදහන් වුණු අය ගැන හොයන්න ආණ්ඩුව පනතක් ගෙනැල්ල." පොලිටික්ක පාර්ලිමේන්තුවෙ ඉඳලා එන ගමන් වගේ. "ඒකෙන් හදන කාර්යාලෙට බලතල ගොඩයි... රණවිරුවො දං ගෙඩියට... අනේ අපොයි... රට ඉවරයි." පොලිටික්ක මාධ්‍ය සාකච්ඡාවල විසිවුණු කෑලි ඇහිඳිනව.

"ඉතින් සර්, රණවිරුවො මොන එහෙකටද බයවෙන්නෙ? අතුරුදහන් කරවපු අයයි, අනාගතේ අතුරුදහන් කරවන්න බලන් ඉන්න අයයිනෙ බය වෙන්න ඕනෙ." මංජුවත් යමක් අහල කියවල තිබුණ.

"මහින්ද මහත්තයලා කාවවත් අතුරුදහන් කළේ නැහැ. අතුරුදහන් කළේ යූඑන්පිය." පොලිටික්ක හිටපු මාධ්‍ය ප්‍රකාශක වගේ.

"අතුරුදහන් කළේ 71ද, 89ද, 2010ද කියල වැඩක් නැහැ. නිල් ජීප්වලින් ඇවිල්ලද, කොළ ජීප්වලින් ඇවිල්ලද, සුදු වෑන්වලින් ඇවිල්ලද දන්නෙ නෑ. ඒත් අරන් ගිය අයට මොකද වුණේ කියල අරන් ගිය අයගෙ අම්මල තාත්තල, අඹු දරුවො දැනගන්න එපායෑ." සමන යෝකර් එකක් දැම්ම.

"මේ පනතට මහින්ද මහත්තයල තදටම විරුද්ධයි." පොලිටික්ක ලේසියට ඩිෆෙන්ඩර් කබලකට මුවා වුණා.

"මහින්ද මහත්තයා විරුද්ධ වෙන්නෙ මොකටෙයි? අතුරුදහන් වෙච්චි අය ගැන කියන්න ජිනීවත් ගියා කිවුව නේද?" මංජුව අහපු මතකෙකට කිවුව.

"ඒක බොරුවක්. මහින්ද මහත්තය රණවිරුවො බිල්ලට දෙන කෙනෙක් නෙමෙයි." පොලිටික්ක දෙයියන්ට බුදුන්ට වගේ.

"ඇයි මහින්ද මහත්තයම නේද කිවුවෙ එයාට 88-89 අම්මලගෙ කඳුළු මතකයි කියල... ඒ ගැන කියන්න රට යනකොට බාධාත් වුණා කියල." මංජුවත් ඇරියෙ නෑ.

"ආ.. ඒ... ඒ කාලෙනෙ. මම හිතුවෙ පහුගිය කලෙ කියලා." පොලිටික්කගෙ කන් රතු වුණා.

"දැන් විරුද්ධ වෙන්නෙ වැඩේ මල්ලිට ගැස්සෙයි කියලනෙ. සුදු වෑන් හැදුවෙ ටොයෝටා. සුදු වෑන් සංස්කෘතිය හැදුවෙ ගෝටා." සමනගෙ කතාවට කට්ටියටම හිනා ගියා. "එදා අතුරුදහන් වෙච්චි අය ගැන හෙව්වෙ බලය වෙනුවෙන්. අද හොයන එකට විරුද්ධ වෙන්නෙත් බලය වෙනුවෙන්. හෙට හොයන එකට විරුද්ධත් බලය වෙනුවෙන්." සමනගෙ බලකතාව අතරේ පොලිටික්ක කලබලෙන් කැන්ටිමට ලෙස්සුව.

## දැනුම තුළ අසත්‍යය...

07 පිටුවෙන්

අවසානයේ සේවය කරමින් සිටින්නේ කාටද? ඒ මානව වර්ගයාට හෝ මානව සමාජයට නොවේ; එය සේවය කරන්නේ වත්මන් ලෝක ධනවාදයට හා ප්‍රතිගාමිත්වයටය. එය සමාජ සංවර්ධනයට, සමාජ ප්‍රගතියට බාධා බවට, විලංගු බවට පත්ව තිබේ. සමාජයක් තුළ පවතින අවිද්‍යාව, මිත්‍යාව, නොදැනුවත්කම සරල නොවන්නේ මේ නිසාය. සමාජයක් අවිද්‍යාවේ සිට විද්‍යාව වෙතත් මිත්‍යාවේ සිට සත්‍යය වෙතත් නොදැනුමේ සිට දැනුම වෙතත් ගෙනා යුත්තේ මේ නිසාය. සොබාදහම හොඳින්ම ජයගැනීමටත් මිනිස් අවශ්‍යතා සියල්ල සපුරාලීමටත් මිනිසාට වඩා හොඳ ජීවිතයක් සකස්කර දීමටත් නව සමාජයක් නිර්මාණය කිරීමටත් තරම් වන විද්‍යාවේ වර්ධනයක් දැනුමක් තිබියදීත් මිනිසා මිත්‍යාවන්ට යටවීම නිසා එම සියලු ජයග්‍රහණ අහිමිකරගෙන සිටී; තමන් විසින්ම හදාගත් හා පාලකයින් හා ආගමික සංස්ථාවන් විසින් පතුරුවන අවිද්‍යා අන්ධකාරයේ සිරවී දුක් විඳිමින් සිටී. මානව සංහතියත් මානව සමාජයත් මෙම අවිද්‍යාවේ අන්ධකාරයෙන් මුදවා විද්‍යාවේ, සත්‍යයේ ආලෝකය වෙත රැගෙන යාම අද දවසේ කාර්යය වී තිබේ. එය කළ හැකි වන්නේ දැනුම නැමති ක්‍රියාවලිය තුළිනි; දැනුම තුළ සත්‍ය පරාවර්තනය කිරීම මගිනි. අප සත්‍යය වෙනුවෙන් අරගල කළ යුත්තේ ඒ නිසාය.

අනාගත සමාජයක දැනුම තුළ සත්‍යය කෙසේ පරාවර්තනය වේද යන්න සමඟ මීළඟ කලාපයෙන් හමුවෙමු.

## දෙපලු වූ...

05 පිටුවෙන්

හිතවතා තේරුම් ගත යුතුය. නායකයින්ගේ බල පොරය වෙනුවෙන් තමන් බිලිවීම පසෙකලා ශ්‍රීල.නි.ප.ය තුළ සිටින ප්‍රගතිශීලීන් තමන්ගේ පංතියේ පිල වෙත පැමිණිය යුතුය.

ශ්‍රීල.නි.ප. බල අරගලයත් හවුල් ආණ්ඩුවේ පාලනයත් සංයමයක් සහිතව විපක්ෂයේ කාර්යභාරය නියෝජනය කරමින් දවසින් දවස ජනතා ප්‍රසාදය ලබන ජ.වි.පෙ. භාවිතයත් විසින් අනාගත දේශපාලනයේ බෙදුම් රේඛාව අලුතින් අඳිනු ලබනවා ඇත. මෙයට පෙර ආණ්ඩු මාරුවලදී බෙදුම් රේඛාව ඇඳුණේ පංති අර්ථයෙන් නොව පක්ෂ අර්ථයෙනි. එනම් ශ්‍රීල.නි.ප. ආණ්ඩුවට එරෙහිව එ.ජා.ප.ය හෝ එ.ජා.ප. ආණ්ඩුවට එරෙහිව ශ්‍රීල.නි.ප.ය ලෙසය. එහෙත් එය දැන් වෙනස් වී තිබේ. මින් ඉදිරියට ආණ්ඩු මාරු කිරීමේ බෙදුම් රේඛාව ඇඳෙනු ඇත්තේ පංතිමය අර්ථයෙනි. එනම් ධනපති හවුල් ආණ්ඩුවට එරෙහිව වමේ හා ප්‍රගතිශීලී ජනතා බලවේගය අතරය. රටට අවශ්‍ය, රට වෙනස් කිරීමට අවශ්‍ය බෙදුම් රේඛාව එයය. එහිදී තමන්ගේ පංතියේ පිලේ දෙපයින් සිට ගැනීමට පීඩාවට පත් ජනතාව සූදානම් විය යුතුය. දේශපාලනයේ ගමන්මඟ නිර්මාණය වෙමින් තිබෙන්නේ ඒ දෙසටය.

## විපතක් වූ...

11 පිටුවෙන්



ජපානය තුළ ක්‍රියාත්මක වේ. නමුත් ඒ දහනය කිරීමට ලක් කරන කසළ යනු මෙරට කසළ කන්දක එකතු වන ඒවා නොවේ. එම කසළ යනු වර්ගීකිරීම් ගණනාවකට පසු කිසිදු ප්‍රයෝජනයකට ගත නොහැකි අපද්‍රව්‍යම වේ. ඒවා දහනය කළ කසළ අළු විශේෂයෙන් සකසන ලද භූමියක වළලා දමනු ලබයි. ජපානයේ නරිටා ජාත්‍යන්තර ගුවන් තොටුපළද (Narita Intrenational Airport) ඉදිකර ඇත්තේ මුහුද ගොඩකිරීමෙන් වන අතර ඒ සඳහා මෙම කසළ අළු භාවිතා කළ බව පැවසේ.

කසල කළමනාකරණය සම්බන්ධයෙන් ජනතාවගේ ආකල්ප පෙර පාසැල් අවධියේ පටන් වැඩි දියුණු කරන අතරම ඒ සම්බන්ධයෙන් නීතියද නිසි පරිදි ක්‍රියාත්මක කරනු ලබයි. එසේම කසළ එකතු කිරීමේ ක්‍රියාවලියද නවීන තාක්ෂණය සහිත රථ වාහන යොදා ගනිමින් ක්‍රියාත්මක වේ. මෙවැනි වැඩපිළිවෙළක ප්‍රතිඵලයක් ලෙස පරිසරයටත් හානි කරමින් කොහේ මුල්ලකට තල්ලු වීමට තිබු කැලි කසළ ආදායම් උපදවන දෙයක් බවට පත්කර ගෙන තිබේ.

### කුණු පිළිබඳ අපේ අවුල

මෙම කැලි කසල අර්බුදයට හේතුව ලෙස විවිධ පුද්ගලයින් තමන්ගේ දැක්ම අනුව අදහස් ඉදිරිපත් කරනු ලබයි. ඇතැමුන්ට අනුව මෙය හුදු ජනතාවගේ ආකල්ප සහ ක්‍රියාකාරකම් පිළිබද ගැටලුවකි. මෙයට විසඳුමක් ලෙස ජනතාවට 3R System, Separation at the source ආදී සංකල්ප කියාදී ඒ සඳහා හුරු කළා යැයි මොහොතකට සිතමු. එවිට ඔවුන් යකඩ, කඩදාසි, විදුරු, ප්ලාස්ටික්, පොලිතීන් සහ ඉදුල් ආදිය වෙන් වෙන් භාජනවල දමා නගර සභාවට බාර දීමට සූදානමින් සිටිනු ඇත. නමුත් ගැටලුව ඇත්තේ සෑම මහ නගර සභාවකටම හෝ ප්‍රාදේශීය සභාවකට මේ සියලු දේ වෙන් වෙන් වශයෙන් බාරගැනීමේ වැඩපිළිවෙළක් නොමැති වීමයි. එවිට සිදුවන්නේ වෙන් වශයෙන් එකතු කළ යකඩ, කඩදාසි, විදුරු, ප්ලාස්ටික්, පොලිතීන් ආදී ද්‍රව්‍ය ඒවා එකතු කරන ස්ථාන කරා ගෙනයෑමට ජනතාවට අමතර වෙහෙසක් දැරීමට සිදු වීමයි. එවන් තත්වයක තුළ බොහෝවිට සිදු විය හැක්කේ කසළ වර්ගීකරණය පසෙක දමා පරණ පුරුදු ක්‍රමයටම එකම බඳුනක සියලු කසළ දමා නගර සභාවට බාර දීමට ජනතාව කටයුතු කිරීමයි. ඒ අනුව ජනතාගේ ආකල්ප සහ ක්‍රියාකාරකම් වෙනස් කිරීමෙන්ම පමණක් මෙයට විසඳුම් සෙවිය නොහැකි බව මෙයින් තහවුරු වෙයි. අනෙක් පැත්තෙන් ජනතාවට මේ සම්බන්ධයෙන් අවබෝධය ලබා නොදී නගර සභාවන්හි ක්‍රියාකාරීත්වය විධිමත් කළා යැයි සිතමු. එහෙත් ප්‍රතිඵලය මෙයමය.

එනිසා මේ ක්‍රියාවලි දෙක අතර අන්තර් සම්බන්ධයක් තිබිය යුතුමය. නමුත් ගැටලුව ඇත්තේද මෙතැනය. මෙරට රාජ්‍ය ආයතන කිසිවක් මධ්‍යගත සැලැස්මක් අනුව කටයුතු කරන ආයතන නොවේ. එකම අමාත්‍යාංශයක වුවත් ඒ ඒ ආයතන අතරද කිසිදු අන්තර් සම්බන්ධතාවයක් නොමැත. නිසා රටේ සංවර්ධන ක්‍රියාවලියට ඒවායේ දායකත්වය අල්ප වී තිබේ. කසළ කළමනාකරණය සම්බන්ධයෙන්ද උද්ගත වී ඇත්තේ, මේ ආනිසංසයමය. හුදකලාව මෙම ආයතනවල සිටින ඇතැම් පුද්ගලයින් මේ තත්වයන් වෙනස් කර නොයෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් කසළ කළමනාකරණය කිරීමට උත්සාහ කළද සිදුව ඇත්තේ, එම ව්‍යාපෘතිද කෙටි කාලයකට පසු නවතා දමා එම පුද්ගලයින්ට වෙනත් රාජකාරී හෝ වෙනත් ස්ථානවලට මාරුවීම් ලැබීමයි.

ලෝකයේ ඇතැම් රටවල් කසළ කළමනාකරණය මගින් තම පරිසරයද රැක ගනිමින් ආදායම් උපදවමින් සිටියදී මෙරට ආණ්ඩු සහ ඒ හා බැඳුණු නිලධාරි තන්ත්‍රය සිදුකරමින් සිටිනුයේ පරිසරයද විනාශ කරමින් මීතොටමුල්ල වැනි කුණු කඳු තවදුරටත් ඉහළ නැංවීම පමණි.

## ධීවරයින් වෙනුවෙන්...

03 පිටුවෙන්



***පොදුවේ රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම අපහසු කරුණක්. එහෙත් ඊටත් අමතරව ධීවරයින්ට රක්ෂණ ප්‍රතිලාභ ලබාගැනීම අතිශය අපහසු බවට චෝදනා නැගෙනවා. මේ පිළිබඳව සඳහන් කළොත්.***

***රත්න ගමගේ සහෝදරයා:-*** ධීවර රක්ෂණ වැඩපිළිවෙළ මහා ප්‍රෝඩාවක්. මෙයත් එක්තරා විදියකට ධීවරයාගේ මුදල් ගසාකෑමක්. රක්ෂණ වාරිකය හැම වර්ෂයේම එන්න එන්න වැඩි කරනවා. රක්ෂණය පෞද්ගලික ආයතනවලට භාරදී තිබෙනවා. රක්ෂණ සමාගම් තමන්ට පුරුදු පරිදි ස්වකීය කටයුතු සිදුකරනවා. ධීවරයින්ට මහා සුරංගනා ලෝකයක් මවා පෙන්නනවා. ප්‍රතිලාභ ලබාගන්න ගිය විට ධීවරයින්ට අන්ත අසරණ තත්වයට පත්වෙන්න සිද්ධ වෙනවා. උදාහරණයට බහුදින යාත්‍රා විශාල ප්‍රමාණයක් පෙන්නන්න පුළුවන්. මේ අය කියන්නේ රක්ෂණේත් එක්ක ගත්තම දූන් අලුත් කොන්දේසියක් ඇවිල්ලා තියෙනවා යාත්‍රාව කිසියම් ආකාරයක යන්ත්‍ර සූත්‍ර ක්‍රියාවිරහිත වුණොත් යාත්‍රාව කිසියම් ආකාරයක පෙර පැවති තත්වයට වඩා වෙනස් වුණොතින් මේ ප්‍රතිලාභය ගැනීමේදී වෙනම මැරුයින් ඉංජිනේරියන් කෙනෙක්ගේ වාර්තාවක් ගැනීමට අවශ්‍යයි. යාත්‍රාවල් අරගෙන අල්මාරියේ ඇතුළට දාලා තියන්නේ නැහැනේ. ලවණ සහිත මුහුදු ජලයත් එක්ක තියෙනකොට අනිවාර්යෙන්ම යාන්ත්‍රික වශයෙන් කිසියම් ආකාරයකට ක්ෂයවීමක් සිද්ධවෙනවා. මේ කටයුත්ත සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් දක්වන්නේ පුදුම කරුණු.

ඒ වගේම කුණාටුවක් නිසා කිසියම් හානියක් සිදුවුණොතින් රක්ෂණ සමාගම් බලන පළවෙනි දේ තමා යාත්‍රාව මහ මුහුදට දියත් කරන විට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු වාර්තාව. සමහර විට අපි දන්වා බහුදින ධීවර යාත්‍රා සතියක් දෙකක් මහ මුහුදේ තියෙනවා එතකොට අතරමැද දවසක කලගුණය අයහපත් කියලා යාත්‍රාව ගොඩට ගෙන්න බෑනේ. ඒ තත්වෙට මුහුණ දෙන්න සිද්ධවෙනවා. එවැනි අවස්ථාවලදී පවා අදාළ රක්ෂණ ආයතන ප්‍රතිලාභ ගෙවීම මගහැරලා තියෙනවා.

ඒක නිසා මේ රක්ෂණය අපි යෝජනා කරන්නේ රජයත් ධීවර අමාත්‍යාංශය මැදිහත්වෙලා රජයෙනුත් කොටසක් දරලා මේ සඳහා ධීවරයන්ගේ යාත්‍රාව, ධීවරයාගේ ජීවිතය ආරක්ෂා කරගන්නා තැනකට යන්න කියලා. අනෙක් අතින් ධීවර ජීවිතයක් සම්බන්ධව ගත්තොත් මහ මුහුදේම දියේ ගිලිලා මිය ගියහොත් තමා ඒ ප්‍රතිලාභය ගෙවන්නේ. හදිසි අපදාවක් වුණොත් තමන්ගේ යාත්‍රාවේ ආපදාවක් නිසා ධීවරයා මිය ගියහොත් ඒ සඳහා ප්‍රතිලාභ දෙන්නේ නැහැ. එතකොට මේ රක්ෂණය ධීවරයන් වෙනුවෙන් කරපු රක්ෂණයක් නෙමේ. රක්ෂණ ආයතන තර කිරීමට ගොඩනගපු රක්ෂණ ක්‍රමයක්.

***නියමුවා:-ඔබ මෑතදී උතුරේ ධීවරයින් මුණගැසුණා. උතුරේ ධීවරයින්ට පොදු ධීවර ගැටලු මෙන්ම ඔවුන්ට විශේෂිත වූ ඒවා තිබෙනවා. ඔවුන් මුහුණපාන ගැටලු මොනවාද?***

***රත්න ගමගේ සහෝදරයා:-*** පසුගිය 16,17,18 දින 03 තුළ සමස්ත ලංකා පොදු සේවක සම්මේලනයේ සභාපති අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති සහෝදරයා ඇතුළු අපි කණ්ඩායමක් උතුරු ප්‍රදේශයේ අපේ ධීවර සහෝදරයින් හමුවීමට ගියා. ඉතාමත් දුක්ඛිත තත්වයක් තමා උතුරේ ධීවරයින්ට මුහුණ දීමට සිදුවෙලා තියෙන්නේ. විශේෂයෙන් ධීවරයින් පනස්දාහක් පමණ උතුරු මුහුදේ මත්ස්‍ය කර්මාන්තය කරනවා. සාමාන්‍යයෙන් ලක්ෂ 02 කට ආසන්න ප්‍රමාණයක් යැපෙන්නන් ඉන්නවා. මාසයකට ඉන්දියානු ධීවර යාත්‍රා හයදාහක් පමණ උතුරු මුහුදට ඇවිත් උතුරු මුහුද වනසනවා. බොටම් සෝලන් ක්‍රමයට තමයි මත්ස්‍ය සම්පත නෙළාගෙන යන්නේ. ඒ විතරක් නෙමේ. ඔවුන් අපේ ධීවරයන්ට පහර දෙනවා. අපේ ධීවරයින්ගේ යාත්‍රා විනාශ කරනවා. සාගර සම්පත සම්පූර්ණයෙන් කෙළසලා යන්නේ.

අපි යෝජනා කරන්නෙ උතුරෙ ඉන්දියානු ධීවර යාත්‍රා ආක්‍රමණය නතර කිරීමට අපේ රටේ ජනාධිපතිතුමා, අගමැතිතුමා, ඒ වගේම ධීවර අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, නාවික හමුදාපතිතුමා, විදේශ කටයුතු අමාත්‍යාංශය මේ සියල්ලම ඒකාබද්ධ යාන්ත්‍රණයකින් මේ කටයුත්ත සඳහා විශේෂ වැඩ පිළිවෙලක් ගොඩනගන්න ඕනෑ.

උතුරේ ධීවර ප්‍රජාවට අවම පහසුකම් වත් ලැබිල නැහැ. අවම තරමේ තමන්ගේ ස්වකීය ධීවර යාත්‍රාව දියත් කිරීමට තොටුපළ වරායවල කිසිම පහසුකමක් නැහැ. පසුගිය ආණ්ඩුව සිලාවතුර, ගුරුනගර්, මයිලෙඩ්ඩි ධීවර වරායන් ස්ථාපිත කරන බව කීවා. නමුත් කිසිදු ස්ථාපිත කිරීමක් ඇත්තේම නැහැ. අඩුම ගණනෙ උතුරේ තොටුපළකට බීකන් ලාම්පුවක් වත් දීමට මේ කිසිදු ආණ්ඩුවකට හැකිවෙලා නැහැ. ඒනිසා ඔවුන්ගේ ජනජීවිතයම තියෙන්නේ බරපතළ තත්වයකයි. ඉරණතිව් දූපතේ ධීවරයන් විශේෂ ගැටලුවකට මුහුණ දීලා තියෙනවා. මයිලෙඩ්ඩි තවමත් ධීවර වරායක් කියල හැඳින්වූවාට ඒක ධීවර වරායක් නොවේ. පසුගිය වතාවෙ අපි ගිහිල්ලා ඒ ආසන්න ධීවර ගම්මානයක් එක්ක සාකච්ඡාවක් කළාම කිව්වේ විශාල ධීවර ගම්බිම් ප්‍රමාණයක් ඒ ස්ථානයෙන් අයින් කරලා. ආරක්ෂක ප්‍රශ්නයක් නම් ආරක්ෂක අමාත්‍යාංශයත් ධීවර අමාත්‍යාංශයත් කථා කරලා මේ ප්‍රශ්නය විසඳා ගන්න ඕන.

උතුරේ ධීවර ප්‍රජාවට තවමත් තිබෙන්නේ ඉතාමත් සම්ප්‍රදායික ඉතාමත් අඩු පහසුකම්. ගුරුනගර් ගත්තම එතන තත්වේ ඉතාමත් ශෝචනීයයි. අවුරුදු 100ට පෙර පමණ පෙර යෙදූ ගල්වැටියක් තමා තියෙන්නේ. ලන්දේසීන් කාලෙ ගොඩනැගිලි තාමත් තිබෙන්නේ. සිලාවතුරෙ ධීවරයින් වැලිකොට්ට ගසාගෙන ඉන්නේ. ඒ වගේම කුඩා කුඩා තොටුපලවල්වල කණගාටුදායක තත්වයක් තමයි තියෙන්නේ. මේ තත්වය තුළ උතුරේ ධීවර ජනතාවගේ ජනජීවිත ගොඩනැගීමට ආණ්ඩුව විශේෂ අවධානයක් යොමුකරන්න ඕන.

***නියමුවා:- ජාතිකත්ව සීමා ඉක්මවමින් ඔබ සමග සංවිධාන ගත වෙන්න ඔවුන් සූදානම්ද?***

***රත්න ගමගේ සහෝදරයා:-*** පසුගිය දිනවල අපි උතුරේ ගිය දිනවල විශාල සම්බන්ධයක් ඇති වුණා. ඒ උතුරේ ධීවර ප්‍රජාවගේ ගැටලුවලට සම්බන්ධව ප්‍රථම වතාවට පාර්ලිමේන්තුවේ හඬක් නැගුවේ පසුගිය වර්ෂයේ ඔක්තෝබර් මාසේ 09වැනිදා විජිත හේරත් මන්ත්‍රීතුමා කියලා අපට කීවා. හැම රැස්වීමකදීම වගේ ඔවුන් විජිත හේරත් සහෝදරයාට ස්තුතිය ප්‍රකාශ කළා. ඒ වගේම යෝජනාවේදී අදහස් දැක්වූ නිහාල් ගලප්පති සහෝදරයා වෙනුවෙන් ඒ අයගේ ප්‍රණාමය පුදකළා.

ඒ වගේම පසුගිය දවසේ ඉන්දීය විදේශ කටයුතු නියොජ්‍ය අමාත්‍ය සුස්මාන් ස්වරාජ් මැතිනිය ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේ සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනයේ අපිත් සමග එකතුවී කොළඹ නගරයේදී උද්ඝෝෂණයක් කළා. එසේම සම්මන්ත්‍රණයක් කොළඹදී කළා. දිගින් දිගටම අපේ ධීවර සම්මේලනය උතුරේ ධීවර අර්බුදය පිළිබඳව රටේ ප්‍රජාව දැනුවත් කිරීම ගැන, පාලකයින් දැනුවත් කිරීම ගැන එයාලා අප කෙරෙහි විශාල ප්‍රසාදයකින් කථා කළා. ඉන්දියාවේ තමිල්නාඩු මහ ඇමතිවරිය තමන්ගේ ධීවරයින්ගේ ප්‍රශ්න සම්බන්ධව ඉන්දීය අගමැතිවරයාත් සමග සාකච්ඡා කරන මොහොතක, උතුරේ දේශපාලන අධිකාරිය තමන්ගේ ආණ්ඩුවත් එක්ක මේ ප්‍රශ්නය කථා නොකරන අවස්ථාවක අපි මැදිහත්වුණා. ඒ වාගේම පසුගිය 15දා අපි උතුරු පළාතේ ධීවරයන් මුහුණදීල තියෙන මේ ප්‍රශ්නය සම්බන්ධව මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කළා. ඔවුන් විශේෂයෙන්ම කිව්වා අපිත් සමග එකතුවෙලා ප්‍රශ්න වෙනුවෙන් හඬනගන්න, සටන් කරන්න අරගල කරන්න සූදානම් කියන එක ඒ අයගේ සහෝදරාත්මක දෑත් අප වෙත දිගු කළා.

***නියමුවා:- පොදු ජනතාව මෙන්ම ධීවර ජනතාවද රැවටීම සඳහා ධනපති ආණ්ඩු විවිධ බොරු පොරොන්දු ලබාදී තිබෙනවා. මේ රැවටීම්වලට එරෙහිව ධීවර ජනතාව සංවිධානය කිරීමට සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනයේ සූදානම කවරේද? ඉලක්කය කුමක්ද?***

***රත්න ගමගේ සහෝදරයා:-*** අපි සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනයේ අපේ ශක්තිය වර්ධනය කිරීම වෙනුවෙන් ඉදිරි මාස 03 අපි සංවිධාන ප්‍රවර්ධන මාස ලෙස නම් කර තියෙනවා. ඒ අනුව රට පුරා අපේ ධීවර සමිති ගොඩනැගීම සමිති ප්‍රතිසංවිධානය කිරීම අපි වේගවත්ව කරගෙන යනවා. නැගෙනහිර පළාතෙත් ඒ කටයුත්ත කළා. උතුරු පළාතෙත් ඒකට අදාල මූලික පසුබිම සකස් කළා. ඉදිරියේදී අපි සමස්ත රටේම ධීවර ප්‍රජාව එක මිටකට සංවිධානය කර ලොකු උද්ඝෝෂණ පෙරමුණක් ධීවර ප්‍රජාවත් එක්ක ගොඩනගනවා. ඊට සාපේක්ෂව සාගර සම්පත සුරැකීම වෙනුවෙන් රටේ ඉන්න උගතුන්, වියතුන්, බුද්ධිමතුන් සමග අත්වැල් බැඳගෙන මේ රටේ සමස්ත සාගර සම්පත රැකගැනීමටත් ධීවර ප්‍රජාවගේ ජන ජීවිතය නගාසිටුවීමටත් වෙනුවෙන් සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනය ලෙස අපි ධනපති ආණ්ඩුත් එක්ක සටන් කළ හැකි සටන් මධ්‍යස්ථානයක් ගොඩනගන්න සැලසුම් සකස් කර තිබෙනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## සහෝදර හඬට සවන්දී - කිලිනොච්චිය



## ජනතාව සමඟ සංවාදයක - කොලොන්නාව



## දූෂණයට එරෙහි සටනට පණපොවමින්...



## මිහිමවට පෙම්බඳිමින් - සමාජවාදී තරුණ සංගමය



## එතෙර ශ්‍රමය අගයමින්...



## ජාත්‍යන්තර සමුළු නියෝජනයක - ඉන්දුනීසියාව



# අනාගත පරම්පරාව වෙනුවෙන් පෝට්සිටි නතර කළ යුතුයි

### ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා



රටක සංවර්ධනය වර්තමානයේ ජීවත් වන සුළු පිරිසකගේ සුඛ විහරණය සඳහා සිදුකරන දෙයක් නොවන බවත් එය අනාගතය වෙනුවෙන් සිදුකරන දෙයක් විය යුතු බවත් අවධාරණය කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, අනාගත පරම්පරාව වෙනුවෙන් පරිසරය ආරක්ෂා කරගැනීම සඳහා පෝට්සිටි ව්‍යාපෘතිය නතර කළ යුතුව ඇතැයි ප්‍රකාශ කළේය.

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ, පෝට්සිටි ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට ආණ්ඩුව ගත් තීරණය පිළිබඳව කරුණු දැක්වීම සඳහා පසුගිය 22වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. වැඩිදුරටත් අදහස් පළ කළ ඔහු මෙසේද පැවසීය.

"පරිසර විනාශය, මූල්‍යමය හානිය, ජාත්‍යන්තර දේශපාලනයේදී සිදුවන අවාසිය යන සියල්ලේ මූල්‍යමය වටිනාකමත් චීන සමාගම විසින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් කරන ආයෝජනය ඩොලර් මිලියන 133ක මුදලත් සංසන්දනය කර බැලුවාම අපට සිදුවන්නේ විශාල පාඩුවක්. එම ආයෝජන වෙනුවෙන් රටක් විදියට අපට දැවැන්ත වන්දියක් ගෙවන්න සිදුවෙනවා.

පාරිසරික වශයෙන් නීතිවලට පටහැණිව මූල්‍ය අලාභහානි සිදුකරමින් රටේ ස්වෛරීත්වයට හානි කරමින් ආරම්භ කිරීමට යන මෙම ව්‍යාපෘතිය වහාම නතර කළ යුතුයි."

# ඡන්දයෙන් පසුවත් ප්‍රතිපත්ති ගැන කථා කරන පක්ෂය ජ.වි.පෙ. පමණයි

### ජ.වි.පෙ. ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා



පහුගිය මැතිවරණය වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කළ ජාතික වැඩපිළිවෙළ තුළ යුද්ධයෙන් පීඩාවට පත්වූ ජනතාවට තම දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමටත් සහන ලබාදීමටත් සත්‍ය විමර්ශන කොමිසමක් පත්කිරීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇතැයි ප්‍රකාශ කළ ජ.වි.පෙ. ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා, අතුරුදහන් වූවන් පිළිබඳ තොරතුරු සෙවීම වෙනුවෙන් පෙනී සිටීම මගින් ඡන්දයෙන් පසුවත් ප්‍රතිපත්ති ප්‍රකාශය ගැන කථා කරන ප්‍රතිපත්තිගරුක පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ පමණක් බව පෙන්වා දී ඇතැයි කියා සිටියේය.

බිමල් රත්නායක සහෝදරයා මෙම අදහස් පළ කළේ අතුරුදහන් වූවන් පිළිබඳ සොයාබැලීමේ කාර්යාලයක් පිහිටුවීමේ පනත පිළිබඳ ජ.වි.පෙ. ස්ථාවරය පැහැදිලි කිරීම සඳහා පසුගිය 15වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ඔහු මෙසේද පැවසීය.

"අතුරුදහන් වූවන් පිළිබඳව කාර්යාලයක් අවශ්‍ය බව ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරයයි. 71 මිනී වළවල් කපපු අයට විරුද්ධව එ.ජා.ප.යේ කොමිසම්වලට අපි සාක්ෂි දුන්නා. එ.ජා.ප. පාලන කාලයේදී කපපු මිනී වළවල්වලට එරෙහිව ශ්‍රී.ල.නි.ප.ය පත්කළ කොමිසම්වලටත් අපි සාක්ෂි දුන්නා. අපිට ඩීල්එක තියෙන්නේ ජනතාව සමඟයි. රාජපක්ෂ පාලන කාලයේදී සිදුකළ එක්නැලිගොඩ අතුරුදන් කිරීම පිළිබඳව අඩුම තරමේ තුන්වැනි පාර්ශ්වයේවත් විධිමත් පරීක්ෂණයක් සිදුවුණේ නැහැ. ඒ වගේම මෙම පාලනය තුළදී අතුරුදන් වීම් සිදුවිය නොහැකියි කියලා අපිට කියන්න පුළුවන්කමක් නැහැ. එනිසා අනාගතයේ සිදුවන අතුරුදන් කිරීම්ද වළක්වාගත යුතුව තිබෙනවා."

# වාහන දෙන බව කියමින් ආණ්ඩුව කෝප් කමිටුව හෑල්ලු කරනවා

### කෝප් කමිටු සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා

කෝප් කමිටුව ලෙස කිසිදු වාහනයක් ඉල්ලා නොමැති තත්වයක් තුළ කෝප් කමිටුවට සහ ගිණුම් කාරක සභාවට කෝටි 09ක වාහන දෙකක් ලබාදෙන බවට ආණ්ඩුව විසින් ඉරිදා පුවත්පතක පුවතක් පළ කරනු ලැබීම කෝප් කමිටුව හෑල්ලු කිරීමේ ප්‍රයත්නයක් යැයි කොප් කමිටු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා ප්‍රකාශ කළේය.

ඔහු මෙසේ කියා සිටියේ පසුගිය 15වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවේදී අදහස් දක්වමිනි. මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් පළ කළ හඳුන්නෙත්ති සහෝදරයා මෙසේද කියා සිටියේය.

"අපිට වාහනයක් ලබාදෙනවා කියලා ලිඛිතව හෝ වාචිකව කෝප් කමිටුව දැනුවත්කර නැහැ. නමුත් කෝප් කමිටුවේ අඩුපාඩු සම්බන්ධයෙන් අපි ආණ්ඩුව දැනුවත් කළා. ඒ අතර දැනට සිටින කාර්යමණ්ඩලය 05 දෙනා වැඩිකරන ලෙස ඉල්ලා තිබෙනවා. භාෂා පරිවර්තකයින් ලබාදෙන්න කියලා ඉල්ලීමක් කර තිබෙනවා. කාර්යමණ්ඩලයට සහ කෝප් කමිටුවේ සාමාජිකයින්ට පුහුණුවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියා. අවශ්‍ය ප්‍රමාණයට පරිගණක උපකරණ ලබාදෙන ලෙස ඉල්ලීම් කළා. ලියකියවිලි ආරක්ෂා කිරීමට ගබඩා පහසුකම් ඉල්ලුවා. කෝප් කමිටු පරීක්ෂණ සඳහා අවශ්‍ය නීතිපති නිලධාරීන් අනුයුක්ත කරන ලෙස ඉල්ලුවා. මේ කිසිදු කරුණක් සම්බන්ධයෙන් අවධානය යොමු නොකරන ආණ්ඩුව අපිට වාහන දෙන්න හදනවා.

මට පාර්ලිමේන්තු යන්න වාහනයක් පක්ෂයෙන් දීලා තියෙනවා. පාර්ලිමේන්තුවට ගිහිල්ලා කෝප් කමිටුවට යන්න වෙනම වාහනයක් මොකටද? සල්ලි නැහැ කියලා කෙඳිරි ගාන ආණ්ඩුව වාහනවලට මේ තරම් මුදල් නාස්ති කරන්නේ මොකටද? අපි ඉල්ලපු නැති වාහන අපේ ඇඟේ ගහන්නේ මොකටද? මේ හදන්නේ කාරක සභා හෑල්ලු කිරීමටයි. පසුගිය 09 වැනිදා ආයතන 19ක් ගැන කෝප් වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කළා. ගිය සතියේ



ප්‍රධාන ප්‍රවෘත්තිය විය යුතුව තිබුණේ එයයි. ඇවන්ගාඩ් එක ගෙවිය යුතුව තිබූ කෝටි 25 මේ ආණ්ඩුවෙන් කපා හැරපු එක, ඖෂධ සංස්ථාවෙන් කෝටි ගාණක බෙහෙත් විනාශ කරපු එක, විදුලි බල මණ්ඩලයේ අර්බුද සම්බන්ධයෙන් කෝප් කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කර තිබුණා එම ප්‍රවෘත්තිය වාර්තා කරනවා වෙනුවට කෝප් කමිටුවට වාහන ගන්න යන බවට ප්‍රවෘත්තියක් නිර්මාණය කිරීම කණගාටුවට කරුණක්."

# මේ රටේ නැවත රාජපක්ෂ පාලනයක් නැහැ!

### ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා

රාජපක්ෂ කල්ලියට අන් සියලු දෙනා යටපත් කිරීමට හැකි වුවද ජනතා විමුක්ති පෙරමුණ යටපත් කරන්න නොහැකි බව ඔවුන් දන්නා බැවින් ජ.වි.පෙ.ට ප්‍රහාර එල්ල කිරීමටත් පරීක්ෂණ සිදුකරන රජයේ නිලධාරීන් බියවැද්දීමටත් උත්සාහ කරන නමුත් රාජපක්ෂ නැවත වරක් රටේ බලයට නොඑම ස්ථිර බව පෙන්වා දුන් ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, නොබියව එම පරීක්ෂණ සිදුකරන මෙන් නිලධාරීන් ගෙන් ඉල්ලා සිටියේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 03වැනිදා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදී මාධ්‍යවේදියෙකු රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා විසින් ජ.වි.පෙ. විවේචනය කිරීම පිළිබඳව නැගූ පැනයකට පිළිතුරු දෙමිනි.

"මහින්ද රාජපක්ෂගේ විනාඩි 14ක කථාව ඔබ අහලා බලන්න. ඔහුගේ ප්‍රධාන චෝදනාව තිබුණේ එෆ්.සී.අයි.ඩී.යට, සී.අයි.ඩී.යට අල්ලස් දූෂණ කොමිසමට සහ ජනතා විමුක්ති පෙරමුණටයි. ඒ හැර ඔහුට වෙනත් විවේචනයක් තිබුණේ නැහැ. රනිල් වික්‍රමසිංහට චෝදනා කරන්නේ නැහැ. මෛත්‍රීට චෝදනාවක් නැහැ. මොකද, ඔවුන් එක්ක කරන ඩීල් එකෙන් බේරෙන්න පුළුවන් කියලා රාජපක්ෂ කල්ලිය විශ්වාස කරනවා. නමුත් මේ සියලු දෙනාම යටපත් කරන්න පුළුවන් වුණත් ජනතා විමුක්ති පෙරමුණ යටපත් කරන්න බැරි බව ඔවුන් දන්නවා.




බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.



# රළ

ද්විමාසික කලා සංස්කෘතික සඟරාමය
අතිරේකය සමාජවාදී කලා සංගමයේ
ප්‍රකාශනයකි.
නව සංස්කරණය 2016 සැප්තැම්බර්
4 වන කලාපය

## කශේරුකාව බිඳවැට්ටූ සමාජයක සාහිත්‍ය භූමිකාව

අද්‍යතන ශ්‍රී ලාංකේය සමාජය ගමන් කරමින් ඇත්තේ කොතැනකට ද? ඒ පිළිබඳව තේරුම් ගැනීමට ඉවහල්වන සිදුවීම්, නිරන්තරයෙන් අපට අසන්නට ලැබෙයි. දරුවෝ තම වයසක දෙමව්පියන් නන්නාඳුනන ප්‍රදේශයක අතරමං කර හීන් සීරුවේ මාරුවෙති. සමහරෙක් තම දෙමව්පියන් එළිපිටම සිය නිවෙස්වලින් එළියට ඇද දමති. මව්වරු තම කුසෙන් උපන් බිළිඳුන් පණපිටින් වළලති. ජීවිතයට මුහුණදීමට නොහැකි මව්වරු සිය කිරිකැටි බිළිඳුන් ඇළදොළ ගංගාවලට විසි කරති. සමහරක් මව්වරු තම දරුවන්ට වස පොවා තමන්ද වස පානය කරති. පියවරු තම දියණියන් දූෂණය කරති. මව්වරු තම දියණියන් දූෂණය කිරීම සඳහා සිය අනියම් සැමියන්ට හෝ වෙනත් ප්‍රබලයින්ට අනුබල දෙති. මිනිස් ජාවාරම මෙන්ම මිනිස් අවයව විකිණීමේ ජාවාරමද අද එළිපිටම සිදු කෙරේ. කුවේට් රාජ්‍යයේදී වහලුන් ලෙස අනන්ත දුක්විඳි කාන්තාවන් පිරිසක් දිවයිනට පැමිණියේ නොබෝ දාය. මේ අද සමාජයෙන් අපට අසන්නට, දකින්නට ලැබෙන දෙයින් අතළොස්සකි. මෙවැනි සිදුවීම්වල සංඛ්‍යාත්මක ප්‍රමාණය මෙන්ම කෲරත්වයද දිනෙන්දිනම වැඩිවෙමින් පවතී. ඇත්තෙන් අද අප ජීවත්වෙමින් සිටින්නේ මිනිස් සමාජයකද? ලෝකයේ බහුතරයක් මෙන්ම ශ්‍රී ලාංකික සමාජයද, ම්ලේච්ඡත්වයෙන් ම්ලේච්ඡත්වයට ගමන් කරමින් තිබීම අද අප අත්විඳින සත්‍යයයි.

මෙම ඛේදනීය තත්ත්වය ආපස්සට හැරවීම සැබෑ මිනිසුන් හමුවේ ඇති වගකීමකි. එහෙත් පවතින තත්ත්වයට අභියෝග කිරීම තබා, පවතින තත්ත්වය ප්‍රශ්න කිරීමටවත් ඉදිරිපත්වන කෙනෙක් සොයා ගැනීමට නොහැකි තරමට, අද සමාජය නිද්‍රාශීලිවී තිබේ. වඩාත් නිවැරැදිව කිවහොත් පාලකයින් විසින් තමන්ට අවශ්‍ය පරිදි, අවශ්‍ය අන්දමට සමාජය නිදිගන්වනු ලැබ තිබේ. අද සෑම ක්ෂේත්‍රයකදීම අපට හමුවන්නේ කොඳුනාරටි කඩාගත් මිනිස්සුය. පොදු කරුණු කාරණාවලදී පමණක් නොව, තමන්ට පෞද්ගලිකව සිදුවන අසාධාරණයන්හිදී පවා ඔවුහු මුනිවත රැකීමට පුරුදුව සිටිති. ආදි මානවයා සිය අභියෝගයන් ජයගත්තේ ප්‍රශ්න කිරීම මාර්ගයෙනි. එදා ඔවුහු ස්වභාවධර්මය ප්‍රශ්න කළහ. අවට පරිසරයේ සිදු වන දේ පිළිබඳ ව ප්‍රශ්න කළහ. අති විශාල ජයග්‍රහණයන් ලබා ගනිමින් මානවයා පෙරට පැමිණියේද, සිය ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගත්තේද, එම අභියෝ ගකිරීම හේතුවෙනි. එහෙත් මානව ඉතිහාසයේ කෙටි කාලයක ආධිපත්‍ය තුළදී, මිනිස් සත්ත්වයා සම්පූර්ණයෙන්ම කණපිට හැරවීමට ධනේශ්වර සමාජ ක්‍රමය සමත් ව තිබේ.

ධනේශ්වර සමාජ ක්‍රමය තුළ ජීවත්වන මිනිසා, "ලාභය" නැමැති සංකල්පයෙන් පරාරෝපිතවූ මානසික රෝගියෙකි. පරාරෝපිත වූ මිනිසා තුළ "මිනිසත්කම" ස්ථාපිත කිරීමේ කර්තව්‍යයේ වැඩි ප්‍රතිශතයක් කලාකරුවන් වෙත පැවරී තිබේ. පළමුව කලාකරුවෝ අද සමාජයේ සිදුවන දේ පිළිබඳව කම්පනයට පත් විය යුත්තාහ. මන්ද ඔවුන් සමාජයක ජීවත්වන සංවේදීම පිරිස ලෙස හැඳින්වෙන බැවිනි. එහෙත් අද්‍යතන කලාකරුවන්ට තමන් ඉදිරියේ ඇති අභියෝගය පිළිබඳ හැඟීමක් තිබේද? අද බොහෝ කලාකරුවෝ සමාජයේ සිදුවෙමින් පවතින සමාජ ඛේදවාචකයන් පිළිබඳව තියුණු දැක්මකින් යුතුව සාකච්ඡා නොකරති. එම සිදුවීම් මානව හිතවාදී දැක්මකින් යුතුව ප්‍රශ්න නොකරති. තමන් එසේ කිරීම, පාලකයන්ට අභියෝයක් බව ඔවුහු හොඳාකරවම දනිති. අද්‍යතනයේ සම්මාන ලැබෙන්නේද, වෙනත් වරදාන, වරප්‍රසාද ලැබෙන්නේද කවර අන්දමේ කලාකරුවන්ට දැයි යන්නද, ඔවුහු දනිති. නූතනයේ බෙහෝ ශ්‍රී ලාංකික කලාකරුවෝ සිය කැමැත්තෙන්ම කශේරුකාවන් බිඳ ගත්තවුන් යැයි පැවසීමේ කිසිදු වරදක් නැත. වෙනකක් තබා මේ වන විට සෞන්දර්යය විෂයන්ට අදාළව සිදුකෙරෙන අන්තිම අසාධාරණ කප්පාදු කිරීම්, කෙනෙහිලිකම් හමුවේ පවා ඔවුහු මුණිවත රකිති. ධනේශ්වර සමාජ ක්‍රමය තුළ අනෙකුත් වෘත්තිකයන් මෙන්ම කලාකරුවෝද වැටුප් ලබන ශ්‍රමිකයන් බවට පත්ව තිබීම යථාර්ථයයි. වඩාත්ම ඛේදවාචකය වන්නේ, කලාකරුවන්ගෙන් බහුතරයක් උදාවී ඇති තත්ත්වය තමන්ට ලැබුණු වරප්‍රසාදයක් සේ සැලකීමය.

මිනිසා අද නැනෝ තාක්ෂණයට පිවිස සිටී. ඒ ඔස්සේ මිනිසා ඉදිරියේදී කුමන අන්දමේ ජයග්‍රහණ අතපත් කරගනී දැයි කිසිවෙක්ටත් අනාවැකි පළකළ නොහැකිය. තාක්ෂණිකව කුමන අන්දමේ ජයග්‍රහණ ලබා ගත්තද, සමාජය ගමන් කරන්නේ ම්ලේච්ඡත්වයට නම්, ඒ කිසිදු ජයග්‍රහණයකින් ඵලක් නොවේ. තාක්ෂණික ලෝකය ජයගත්තද, මෙතෙක් මිනිසාට ඉටුකර ගැනීමට නොහැකි වූ කර්තව්‍යයක් තිබේ. ඒ මිනිසත්කම රැකෙන, මිනිසත්කම වර්ධනය වන, මිනිස්කමට ගැලපෙන, සමාජ ආර්ථික ක්‍රමයක් සකසා ගැනීමය. මිනිසා විසින් ඉටුකර ගතයුතු වැදගත්ම කාර්යය එයයි. ඒ සඳහා සිදුවෙමින් පවතින අගතිගාමී සිදුවීම් ප්‍රශ්න කළ යුතුය. ඒවාට අභියෝග කළ යුතුය. එම සද්කාර්යයට අදාළ පෙරමුණු බල ඇණියේ වැදගත් කාර්යභාරයක් කලාකරුවන් වෙත පැවරී තිබේ. කොඳු නාරටියක් සහිතව එම කාර්යයට දායක වන ලෙස සියලු කලාකරුවන්ට ආයාචනා කර සිටිමු.



## මරණය නොමිලේ

හෘද සාක්ෂිය වනාහි කොන්දක් ඇති වෙනසක් බලාපොරොත්තු වන ඕනෑම පුද්ගලයකු සතු ගාමක බලවේග කට්ටලය වන්නේ ඒ තුළ තමන්ගේම සිතට එබී බැලීම නිසා ය. හෘද සාක්ෂිය අමතන හෘද සාක්ෂිය කෑ ගසා ඉල්ලන සමාජ ක්‍රමයක වෙනස පුද්ගල බද්ධ අත්දැකීමක් ලෙස වේදිකාවට ගෙන ඒමට සුසංග කඳවලආරච්චි නම් යොවුන් කලාකරුවා සමත් වෙයි. මෙය ඉන්දියානු පරිවර්තනයකි. හින්දි, මරාති සහ ඉංග්‍රීසි යන භාෂාවලින් මහේෂ් එල්. කුනිෂ්වාර් විසින් ඉන්දියාවේ බොහෝ රඟහල්වල රංගගත කොට ඇති ජන ප්‍රසාදයට ලක්වූ වේදිකා නාට්‍යයකි.

ලාංකේය ප්‍රේක්ෂකයන්ට දේශපාලනික සන්දර්භයක් සහිත පෙළක් රස විඳීමට මං පාදන මෙම නාට්‍යය තුළ තම ප්‍රතිබිම්බය අහිමිවූ නගරයට පැමිණි තරුණයකුගේ ජීවන අත්දැකීම් පොදිය ප්‍රබල රංග කාර්යයක් ලෙස ඉදිරිපත් කෙරේ. මෙම සමාජ ක්‍රියාවලියේ ඛේදනීය ඉරණම ලෙස අවසානයේ තම දිවි තොර කර ගැනීමට මෙම තරුණයා පෙළැඹෙයි. එය මෙම පෙළෙහි රචකයා ද, පරිවර්තකයා ද, අධ්‍යක්ෂවරයා ද යොදාගෙන ඇත්තේ, වෙන යම් මානයක් ඇති බවත්, හුදෙකලාව සටනට මුහුණ දෙනවාට වඩා සංවිධානගතව සමාජ ක්‍රමයේ වෙනසකට මුල පිරීම අවැසි බව දක්වමින් ය. මෙහි ප්‍රවීණ නළුනිළියන් කිහිප දෙනෙකු තම නිර්මාණ දායකත්වය ලබා දෙන අතර, ප්‍රතිබිම්බය නැතිවූ මිනිසකුගේ කතා පුවත 'මරණය නොමිලේ' යනුවෙන් දැනට දර්ශන වාර ගණනාවක් ලාංකේය වේදිකාව මත දිගහැරෙමින්, මෙරට ප්‍රේක්ෂකයා වෙත සමීප වෙමින් පවතින නාට්‍යයකි.

## කණට පාරක්

වත්මනේදී බොහෝ දෙනාට සිදුව ඇත්තේ අවිවේකී ජීවන රටාවකට මුහුණ දෙමින්, කැමැති වුවත්, නොවූවත් තමන් පිට පැටවෙන ඕනෑ දෙයක් භාර ගැනීමටයි. එසේ නොවන පිරිස්ද නැතුවාම නොවේ. ඇතත්, එම කොටස අල්පය. මේ නිසාම ජන සමාජය තුළ යම් යම් ක්‍රියාකාරකම්, වල් වැදුණු කාලසීමාවක සිටින ලාංකේය කලා භාවිතයක් තුළ විකල්ප ධාරාවේ නිර්මාණ ශක්‍යතාවයන් මතු වීමද, ඒ හරහා ජන විඥානයේ පුළුල් සීමාවකට මෙරට කාලා මාද්‍යයන්ගේ දොරටු විවර කර ගැනීමද අත්‍යවශ්‍ය වූ මොහොතක 'කණට පාරක්' නමින් ශ්‍රව්‍ය ගෝචර භාවිතාවක් මාලක දේවප්‍රිය නම්වූ සොඳුරු නිර්මාණකරුවා තුළින් බිහි විය.

රස වින්දනය පමණක් නොව අද්‍යතන සමාජ ක්‍රමය තුළ තාරුණ්‍යය හා සමගාමීව සමස්ත ජනයාගේ හැඟීම්ද අමු අමුවේ චින්තන ශක්තියද මොට කරමින්, කාල්පනිකව පහත අඩියකට ලා ඇත. විවිධ නාලිකා තුළින් 'රියැලිටි' වැඩසටහන් රැසක් ඉදිරිපත් කළ අතර, එමඟින් බිහිවූ තරුද අප්‍රමාණය. එම තරු කාලයක් යන විට වල්ගා තරු බවට පත්වූ කඩා වැටී යන අයුරු දැස් මානයේ තීව්‍ර ලෙස දෘශ්‍යමාන වේ. සමස්ත ක්‍රියාවලිය තුළම මෙම සිද්ධි දාමය අහඹුවක් නොවන්නේය. එය සමාජ ක්‍රමයේ පරිහානික භාවිතය තුළ උපන් තාවකාලික විසැඳුම්ය. මෙම අත්දැකීම් පොදියම අනුභූතියක් ලෙස පරිකල්පනය කොට 'තරුවක් සරණයි', 'ෆන්සලක්', 'ආලයක දමනය', 'නිහොන් සැප ලැබේවා' වැනි තේමාවන් යටතේ ශ්‍රව්‍යගෝචර අත්දැකීමක් මෙරට ප්‍රවීණ නළු නිළියන්ගේ සහභාගිත්වයෙන් ඉදිරිපත් කොට ඇත. මෙම අත්දැකීම් www.radioplay.lk වෙබ් අඩවියෙන් රස විඳිය හැක.

# සාහිත්‍ය ප්‍රබෝධය සමාජය තුළට ගෙනයෑමට නම් දේශපාලන තීන්දු තිබිය යුතුයි

## කැළණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ කථිකාචාර්ය චින්තක රණසිංහ



**රළ**: අපේ රටේ මානව ශාස්ත්‍ර කලාවන්හි විශාල කප්පාදුවක් දීර්ඝ කාලයක් තිස්සේ පවතින බවට විද්වතුන් තුළ කතාබහක් පවතිනවා විශ්වවිද්‍යාල ඇදුරකු ලෙස මානව ශාස්ත්‍ර කලාවන් පිළිබඳව ඔබගේ අධ්‍යයනය කෙබඳුද? ඒ පිළිබඳව ඔබට තිබෙන විග්‍රහය කුමක්ද?

**චින්තක**: මානව ශාස්ත්‍ර අධ්‍යයනය පිළිබඳ ගැඹුරු හා විවෘත අවංක කතාබහක අත්‍යවශ්‍යතාවය තිබෙනවා. යටත්විජිත යුගයේ එය ඇරැඹුණු අර්ථය යටත්විජිතයෙන් පසු යුගයේ වෙනස් මෙන්ම එම වෙනස තුළ මුල් අර්ථ ගිලිහී වෙනත් අර්ථ නිෂ්පාදනය වෙනවා. සරලව කිව්වොත්, ජෙනින්ග්ස් පේරාදෙණියේ මානව ශාස්ත්‍ර පීඨය හදන්නේ. බටහිර ලිබරල් අධ්‍යාපනය තුළ තිබෙන සංවාදශීලී අවකාශය ලංකාවට ගෙන ඒමට. එබඳු සංවාදශීලී ලිබරල් මධ්‍යම පන්තියක් ගොඩනැඟීමට. ඒ වන විට විද්‍යෝදය, විද්‍යාලංකාර පිරිවෙන්වලත් පෙරදිග සම්ප්‍රදායයට අනන්‍ය බුද්ධිමය කතිකාවක් නිර්මාණය වෙලා තිබුණා. ඒත්, 56 පෙරළියත් සමඟ මේ කතිකා දෙකම අර්බුදයට ගියා. මානව ශාස්ත්‍රවල විශිෂ්ට අර්ථ මතු කර ගැනීම වෙනුවට ග්‍රාමීය සුළු ධනේශ්වරයට අධිරාජ්‍යවාදයෙන් ලැබුණු පීඩාව හා කොන් කිරීම නැති කිරීමට මානව ශාස්ත්‍ර අධ්‍යාපනය යොදා ගත්තා. එයින් මානව ශාස්ත්‍ර අධ්‍යාපනයේ විශිෂ්ටත්වය බිඳ වැටුණා. අද මේ කප්පාදුවේ මූලය එතැන. මේ වැරැදි ප්‍රවේශය වම මෙන්ම දකුණත් කර ගහ ගත්ත සාපයක්.

**රළ**: පැනනැඟෙමින් ආ සාහිත්‍ය ප්‍රබෝධය මහනුවර යුගයෙන් පසු එක්තරා දුරකට නතරවූ බවයි, ඉතිහාස මතය. විශේෂයෙන් කවිය, නර්තනය, චිත්‍රය වැනි විෂයයන්ගේ විශාල ප්‍රබෝධයක් වර්ධනය වෙමින් පැවතුණා. උදාහරණ ලෙස චිත්‍ර කලාව අධි තාත්විකවාදී ලක්ෂණ පෙන්වමින්, රේඛීය චිත්‍ර කලාවක් දක්වා වර්ධනය වීම හඳුන්වා දෙන්න පුළුවන්. සාහිත්‍ය කලාවේ ඉතිහාසයත්, යටත්විජිත යුගය තුළ සාහිත්‍ය කලාවේ ගමන් මඟත් පිළිබඳ සංක්ෂිප්ත අදහසක් අපට කියන්න.

**චින්තක**: දිගු අසීරු ප්‍රශ්නයක්. ප්‍රශ්න ගොඩක්. ඉතාම සරලව ප්‍රවේශ වුණොත්, කෝට්ටේ යුගය කියන්නේ අපේ සාහිත්‍යය තුළ යම් ජාත්‍යන්තරකරණයක් ඇතිවූ යුගයක්. පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආ ගමන එක් අර්ථයකින් ප්‍රගතිශීලී ජාත්‍යන්තර බලපෑමක් සාහත්‍ය කලාව තුළට රැගෙන එනවා. නුවර යුගය තුළ එක් අතකින් ලෝකයට විවෘත කලාවක් මෙන්ම ඉතාමත් සරල ගැමි කලාවක් ලෙසද ධාරා දෙකක් නිර්මාණය වෙනවා. මාතර යුගය හා ඒ හා සබැඳි නිර්මාණ මෙම විවෘත, ජාත්‍යන්තරකරණය නියෝජනය කරන අතර, කන්ද උඩරට කේන්ද්‍රීය කලාව වඩාත් ස්වදේශීය ගතිලක්ෂණ පළ කරනවා. කඳුවලින් වටවූ කුඩා ගම, සරල ආර්ථිකය, නොදියුණු ඒකාධිපතිවාදී දේශපාලනය මෙහිදී එම ධාරාව නියෝජනය කරනවා. හැබැයි, ඒ ධාරාව තුළත් දෙමළ හා මුස්ලිම් සංකලනය තිබෙන බව අමතක නොකළ යුතුයි. සංක්ෂිප්තව කිවොත්, නුවර යුගයේ සාහිත්‍යය මාතර කොටස වෙනමත්, නුවර කොටස වෙනමත් වටහා ගත යුතුයි. අධිරාජ්‍යවාදී බලපෑම වැඩි ප්‍රදේශවල කලාව වඩා විවෘත, නිදහස් ලිබරල් ගමනක් ගියා කියන එකයි මගේ අදහස. ගජමන් නෝනා හොඳම උදාහරණයක්. උඩරටට ගජමන් කෙනෙකු නැහැ.

**රළ**: 1948දී යටත්විජිතවාදීන් අතින් බලය නාමික දේශීය ධනපති පන්තිය අතට හුවමාරු වෙනවා. දැන් වසර 68ක් ගෙවී අවසන්. ටෙලි-සිනමා වේදිකාව මෙන්ම සාහිත්‍ය කලා ක්ෂේත්‍රයන්ගේද අර්බුද රැසක් මතු වෙලා. ඒ පිළිබඳ ඔබගේ අදහස කෙබඳුද?

**චින්තක**: ඔය බලය හුවමාරුව සරලව ගැනීම මේ අර්බුදවලට එක් ප්‍රධාන හේතුවක්. නාමික දේශීය ධනපති පන්තිය ඇතුළේ සංරචක ගණනාවක් තිබුණා. එකක්, යම් සංස්කෘතික ප්‍රබුද්ධතාවයක් සහිත පන්තිය. අනෙක හුදු ධනයම ලැබූ ධනකාමී පන්තිය මේවා අතර යම් උප කණ්ඩායම්ද හිටියා. කොහොම නමුත්, 50-60 දශකවල අපට ලෝකයට ඇස ඇරුණු ප්‍රභූ සංස්කෘතියක පංතියක් හිටියා. 70 දශකයෙන් පස්සේ ඒ පන්තිය දියවෙලා ගියා. මෙයට වමත් බරපතළ විදියට වගකිව යුතුයි. එම දියවීම තුළ ආපු අර්බුදයක් තමයි. අද මේ හැම පැත්තෙන්ම එන්නේ.

සමගි පෙරමුණු ආණ්ඩුව ඇතුළේ ජනප්‍රිය කරපු ජනතාවාදය ගැමි තරුණ මනසට විශාල විනාශයක් කළා. එයින් පහර දුන්නේ පේරාදෙණියෙන් නිර්මාණය කළ ප්‍රභූ සංස්කෘතියට. මෙයින් අදහස් වෙන්නේ නෑ පේරාදෙණියේ සංස්කෘතිය සියල්ල නිවැරැදියි කියා. නමුත්, එතැන මුල් යුගයේ පැහැදිලි ප්‍රබුද්ධ පියවරක් ඇති වුණා. ඒත්, කොළඹ කවිය වැනි දේ වටහා ගැනීමට අසමත් වුණා.

ධනේශ්වර සංස්කෘතිය උරා ගැනීමටත්, ඒ සංස්කෘතික පදනමෙන් ශක්තිමත්ව කලාව කිරීමටත් නොහැකි පන්තියක් 80දී එළියට එනවා. මෙය වමට, දකුණට දෙකටම පොදු තත්ත්වයක් වන අතර, කලාව අර්බුදයට යන ප්‍රධාන තැන ඒකයි. දැන් අහයි, මානව ශාස්ත්‍ර වෙතට ගමන් කරපු 56 වැඩේ ප්‍රතිඵල එන්නේ ඇත්තටම 80 ගණන්වල. මොක? 60-70 වෙන කොටත් 56ට පෙර නිර්මාණය වුණු ප්‍රභූ පෙළැන්තිය මුළුමනින්ම නැතිවෙලා තිබුණේ නැහැ. ඒ වුණාට 80 වෙන කොට නැඟුණේ නියම 56. ඒ කියන්නේ අර ස්වභාෂා, පටු ජාතික චින්තනයෙන් උගත් මානව ශාස්ත්‍ර පීඨ තමයි, මේ අයගේ උපත හැදුවේ.

මේක තමයි, කලාවෙ නොවෙයි, රාජ්‍ය සේවයෙත් දේශපාලනෙත් පවුලෙත් හැම තැනම අර්බුදය. මේ පීඨවල හොඳ ඉගැන්වීමක් නැහැ, සිලබස් හොඳටම දුර්වලයි. බහුතරය ටියුෂන්කාරයෝ. පර්යේෂකයෝ නැහැ. පර්යේෂකයන්ට සල්ලි ගෙවන නිශ්චිත විධික්‍රමයක් නැහැ. පාසල් ගුරුවරුන්ට කිසිම ප්‍රබුද්ධ පුහුණුවක් නැහැ, මේ සියලු සාධක තුළ කලාව මහා පරිමාණයෙන් බිඳ වැටෙන පරපුරක් ඇති වුණා. වර්තමානයේ ගිරවු වගේ පශ්චාත් පාඨ කියවමින් ඇවිදින අය ගොඩනැගුණේ මේ විදියට.

**රළ**: අප ජීවත් වෙමින් සිටින්නේ මුදල මූලික කර ගත් සංකීර්ණ සමාජ අවධියක. තවදුරටත් කලාවේ ඇති වැදගත්කම මේ ආණ්ඩුවලට නැහැ. ඇත්තටම ආණ්ඩුවලට කලාව ඇලජික්ද?

**චින්තක**: මෙහෙමයි, සමාජ ක්‍රමයක් ලෙස මේ රටේ ධනවාදය හෝ සමාජවාදය නිර්මාණය වුණේ නැහැ. සරලව කීවොත්, ධනේශ්වර විප්ලවය මනාව සිදු වුණෙත් නැහැ. ඒ නිසා ධනවාදය තුළ කලාව ගොඩනැගුණු ආකාරය හා ලංකාව තුළ කලාව ගොනැගුණු ආකාරය වෙනස්. අපට ඇත්තේ අර්ධ වැඩවසම්, අර්ධ ධනවාදී ආකෘතිවලින් යුක්ත සමාජයක්. දිගුකාලීනව වාමාංශික බලයක් තිබුණු නිසා සමාජවාදී ආකෘතීන් මේ තුළ තිබෙනවා. අද වන විට ලෝක මට්ටමෙන් මේ සියලු ආකෘති පරයා ලිබරල් ධනවාදය ඉදිරියට ඇවිත්. ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය උදෙසා තමයි, වඩාත් ප්‍රමුඛ රටවල්වල අරගලය දියත් වෙන්නේ. ඒ අය කලාව යම් ආකාරයකින් පවත්වාගෙන යන්නේ ඒ ආකාරයෙන්.

ඒත්, අපේ රටේ එහෙම

# සාහිත්‍ය කප්පාදුව එදා සහ අද

ඕනෑම රටක් ගැන පළමුව අධ්‍යයනය කිරීමේදී හා සොයා බැලීමේදී එම රටේ ආර්ථික, සමාජයීය හා සංස්කෘතිකමය කාරණා ගැන මුලින්ම අධ්‍යයනයක් කෙරේ.

එහෙත්, ශ්‍රී ලංකාවේ සංස්කෘතික ක්ෂේත්‍රය අධ්‍යයනයකදී එහි ආණ්ඩුව විසින් වර්තමානයේ සංස්කෘතික අමාත්‍යාංශය පවා දෙකට කඩා අමාත්‍යවරුන් දෙදෙනකු යටතට බෙදා තිබේ. මේ මඟින් අදාළ සංස්කෘතික විෂයයට තබා ඇති බර තව තවත් අඩුවී තිබේ.

කෙසේ වෙතත්, සංස්කෘතික විෂයය යටතේ ඇති ප්‍රධානතම විෂය ක්ෂේත්‍රයන් වන කලාව සහ සාහිත්‍යය එදා සිට ක්‍රමක්‍රමයෙන් කප්පාදුවට ලක් වෙමින් පවතී. එහිදී අපට ආසන්නතම කරුණ වන්නේ ප්‍රාදේශීය සංස්කෘතික උත්සවවල තරග තුළින් කෙටිකතාව හා කවිය ඉවත් කර තිබීමය. අදාළ සාහිත්‍ය උලෙළවල් සංස්කෘතික අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පවත්වනු ලබන උත්සව වේ.

කෙටිකතාව සහ කවිය නොමැතිව පවත්වන සාහිත්‍ය තරග හා උත්සව යනු කවරෙක්දැයි අපට නම් ඇත්තේ ප්‍රශ්නාර්ථයකි. ධනපති පාලකයන් හට සාහිත්‍යයට වඩා රුපියන් ශත මඟින් උපයා ගත හැකි බදු සම්බන්ධයෙන් කල්පනා කිරීම ධනපති පාලකයන්ගේ පන්ති අර්ථයෙන් සාධාරණ වේ. සාහිත්‍ය කලාව හැදෑරීම වෙනුවට රටේ ජනයා රුපියල් ශත පසුපස දුවන පිරිසක් කර ගැනීම ඔවුන්ගේ පැවැත්මට හිතකර වේ.

සාහිත්‍යය ඇතුළත් වන ප්‍රධානම විෂයය වන මානව ශාස්ත්‍ර කලාවන් මඟින් මිනිසුන්ගේ මනෝභාවයන්ගේ ඇති වන සංවර්ධනය තුළින් සමාජයට සිදු වන බලපෑමට ධනපති පාලකයෝ බිය ගනිති.

එම සාහිත්‍ය කප්පාදුව දශක හතරකටත් එහා කාලයක සිට ක්‍රමක්‍රමයෙන් සිදුවෙමින් පවතියි. පාසල් විෂයමාලාව තුළින් සාහිත්‍යය විෂය ඉවත් කිරීම (පසුව එය ඇතුළත් කළද, ඒ එහි ඇති සාධනීය තත්ත්වයන් මඟහරිති. එමෙන්ම, සාහිත්‍ය කන්නට හැකිදැයි අප රටේ සිටි ජනාධිපතිවරයකුවූ ජේ. ආර්. ජයවර්ධන වරෙක ජනතාවගෙන් ඇසූ බව අපට මතකය.

විවෘත ආර්ථිකය මඟින් ජනතාව අධි පරිභෝජනවාදී සමාජයකට සිර කිරීම හරහා සාහිත්‍යය සමාන කළේ පාරිභෝජන භාණ්ඩ සමඟය. එනම්, එය අනුභව කළ හැකිද? නැතහොත්, සාහිත්‍යයෙන් ගත හැකි ආර්ථික ලාභය කුමක්දැයි ජනතාවට ඒත්තු ගැන්වීමට කටයුතු කළේය. එනම්, එය වැඩකට නැති මංමුළාවූ පිරිසක් විසින් කියවන, ලියන හා කතා කරන රටේ දියුණුවට බාධා වන විෂයයක් ලෙස හුවාදැක්වීමය.

මහින්ද රාජපක්ෂ රජයේ සිටි ඇමතිවරයකුවූ සහ වර්තමාන ඇමතිවරයකු වන සරත් අමුණුගම වරෙක පැවසුවේ, මානව ශාස්ත්‍ර විෂයයන් හැදෑරූ අයට පත්තර පිරෙන්න විචාර හා විවේචන ඉදිරිපත් කළ හැකි වුවත්, රටේ ආර්ථික සංවර්ධනයට (වර්ධනයට) එයින් කිසිවක් එකතු කළ නොහැකි සේම එම විෂයයන් හැදෑරුවන්ට රැකියාවක් සොයා ගැනීමට පවා අසීරු වී ඇති බවයි.

මෙම කරුණු ගැන අවධානය යොමු කළ විට නූතන ධනවාදයේ මුග්ධ සූරාකෑම මත සියල්ලම මුදලින් සිතන සමාජයක් බිහිවී තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාව ලෝකයේ වැඩිම සිය දිවි නසා ගන්නා රට වීම, වැඩිම මත්පැන් හා මත් ද්‍රව්‍ය භාවිත කරන රට බවට පත් වෙමින් යාම, රටේ දික්කසාද වීම් වැඩි වීම හා සමාජ බිඳ වැටීම් වර්ධනයවූ රටක් ලෙස ලෝකයේ ඉදිරියට පැමිණ තිබේ.

සාහිත්‍ය කලාවන් වෙත ජනයා යොමු

වුවත්, නව ලෝක සාහිත්‍ය ප්‍රවණතා අපට ගලාගෙන එන්නේ ඉතාම සෙමින්. ඒ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

අරගලයක නිරත විය හැකි ප්‍රබුද්ධ විදග්ධ පන්තියක් නැහැ, ඒ නිසා මොන ආණ්ඩු තිබුණත්, බලයට එන්නේ කලාව ගැන මෙලෝ හැඟීමක් නැති අය. ඒ නිසා මෙහේ කලාව අවුල් වෙන්නේ ආණ්ඩුවල වරදින් නොවෙයි. කලා සංස්කෘතික යථාවබෝධය ගැඹුරින් ග්‍රහණය කර ගත හැකි පිරිසක් නැති නිසා. අපට හැදුණු උගත්තුන්ගෙන් බහුතරය තිරිසන් මනසක් තියෙන මුදල් හා භෞතික දේම ආත්මීයව ඉල්ලන අන්ත ග්‍රාම්‍ය පන්තියක්. ඒ නිසා ආණ්ඩුව කියන්නෙත් ඒ අයම නිසා කලාවට හැමදාම අපලයි.

**රළ**: මේ එළැඹ තිබෙන්නේ සාහිත්‍යය මාසයයි. ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ සිට විවිධ සාහිත්‍ය උත්සව පවත්වන කාලයයි. නමුත්, කෙටි කලකින් මේ උනන්දුව, ප්‍රබෝධය අවසන් වෙනවා. පත පොත, සාහිත්‍යය කියැවීම සමාජයෙන් වේගයෙන් ඈත් වෙමින් පවතිනවා. මේ තත්ත්වය ඔබ දකින්නේ කෙසේද?

**චින්තක**: උත්සව හා විවිධ අයිටම් ධනවාදය තුළ ඕනෑම විෂයයක් තුළට පැමිණීම සාමාන්‍යයයි. ඒක වාණිජවාදයේ එක් උපක්‍රමයක්. ඒ සාහිත්‍ය ප්‍රබෝධය අඛණ්ඩව පවත්වාගෙන යාම වෙනම කාරණයක්. සරලව කියනවා නම්, දේවාලේ පෙරහැර දාට නළාව පිඹීම කළත්, හැමදාම ළමයි නළා පිඹින්නේ නැහැ,

සාහිත්‍ය ප්‍රබෝධය සමාජය තුළ ගෙන යාමට නම්, දේශපාලන තීන්දු තිබිය යුතුයි. ඒ තීන්දු ක්‍රියාත්මක කරවීමට දැඩි අදහස් ඇති ප්‍රබුද්ධ මිනිසුන් සිටිය යුතුයි. ඒ තීන්දු ක්‍රියාත්මක කරවීමට මාධ්‍ය හා අධ්‍යාපනය යොදා ගත යුතුයි. ඔය එකක්වත් කරන්න 56 බිහිවී ඒ මූලමණ්ඩලවලින් පෝෂණයවූ ඔය පරම්පරාවට පෞරුෂයක් නැහැ. ඒ සඳහා පදනමින් වෙනස් කිරීම ඇරඹිය යුතුයි. නිදසුනක් ලෙස භය නැතිව මේ විභාගවලින් ඇතැම් ඒවා ඉවත් කොට ප්‍රශ්න කරන තර්ක කරන අගැයීම් ක්‍රම ගෙන ආ යුතුයි. ආණ්ඩුව මැදිහත් වී අපේ රටේ විශිෂ්ටතම පරිවර්තකයන් තෝරා ඔවුන්ට අවශ්‍ය දේ දිය යුතුයි. උසස් පොත් උසස් පොත් නිර්දේශ කොට ඒවා කියවන ශිෂ්‍යයන් අගැයීමට ලක් කළ යුතුයි. සරලව කියනවා නම්, ගැඹුරින් සාහිත්‍ය කලාව අධ්‍යයනය කරන අය ඉන්නේ සැඟවී. මාධ්‍යවේදීන් ඒ පිරිස් සොයා ගත යුතුයි.

**රළ**: තාක්ෂණය කෙතරම් වේගවත් වුවත්, නව ලෝක සාහිත්‍ය ප්‍රවණතා අපට ගලාගෙන එන්නේ ඉතාම සෙමින්. ඒ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

**චින්තක**: ඒකට හේතු කීපයක් තිබෙනවා. එකක්, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඇති වෙලා තියෙන ජාතික ප්‍රශ්නය. අනෙක ලෝක සාහිත්‍යය සිලබස්වලින් - විශේෂයෙන්ම පාසල්වල හා විශ්වවිද්‍යාලවලින් - ඉවත් කිරීම හා ඉතා සුළුවෙන් ඒවා යෙදීම. ආයි මම මුලට යන්නම්. 70 දශකයේදී ජනතා ලේඛක පෙරමුණ දකිනවා, පෙළ පොත් ජාවාරමෙන් සල්ලි හොයන්න පුළුවන් කියලා ආණ්ඩුවට රිංගලා. මේ ගේමට සෙට් වෙනවා. විශ්ව සාහිත්‍යය - උදාහරණ: කේ. ජී. කරුණාතිලකගේ 'බිම්ගෙයි සිරකරුවා' පොතෙන් පසු විශ්ව සාහිත්‍යය සිලබස්වලින් ඈත් වෙනවා. සාහිත්‍යය ඉගැන්වීම 'තනි සිංහල' වැඩක් බවට ලඝු වෙනවා. විද්‍යාලංකාර සිංහල විශේෂ සිලබස්වල අවුරුදු තුනටම සියයට 80ක් තියෙන්නේ, හුදෙක් සිංහල සාහිත්‍යය ගැන. ඉතින් කොහොමද තාක්ෂණය දියුණු වුණාට විශ්ව සාහිත්‍ය ප්‍රවණතාවලට සම්බන්ධ වෙන්නේ? මේකයි සත්‍ය තත්ත්වය.

**රළ**: සාහිත්‍යකරුවකුට සාහිත්‍ය කෘති නිර්මාණයේදී දෘෂ්ටිය ඉතාම වැදගත් වෙනවා. ඒ වාගේම හොඳ විචාරකයකුට හොඳ දෘෂ්ටියක් තිබිය යුතුයි. සාහිත්‍යකරුවා, විචාරය හා දෘෂ්ටිය පිළිබඳ ඔබේ අදහස දක්වන්න.

**චින්තක**: දෘෂ්ටිය කියා ඒකමානික අනම්‍ය දෙයක් ගැන මගේ ලොකු විශ්වාසයක් නැහැ. කෘතිය හා විචාරකයා අතර ගනුදෙනුව විවිධ ප්‍රවේශවලින්, විවිධාකාරයෙන් කියැවිය හැකියි. ඒත්, පොදුවේ මා දකින්නේ සාහිත්‍ය කෘතිය කියවන පාඨකයාව වෙනස් කළ හැකි ශක්‍යතාවයකින් යුක්ත විය යුතු බවයි. ඒ වෙනස කෙබඳු විය යුතුදැයි දීර්ඝ ලෙස වාද කළ හැකියි.

**රළ**: අවසාන වශයෙන් විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයකු, ලේඛකයකු, දේශකයකු සහ විචාරකයකු ලෙස පවත්නා දේශපාලන මොහොත පිළිබඳ ඔබේ අදහස් අපට කියන්න.

**චින්තක**: ඉතාම කෙටියෙන් මෙහෙමයි. 2015 ජනවාර් 08 ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ගත් තීරණය විශිෂ්ටයි. ඒත්, එය ක්‍රියාත්මක කරන්න එදා තිබුණු එක්වීම හැම බලවේගයකටම නැති වීම සියලු අර්බුදවල පදනමයි.

---

නොවීම මත සමාජ හර පද්ධතීන් සියල්ල දිය වෙමින් පවතියි. එම නිසා එවැනි සමාජයක මුදුන දක්වාම අද තම බිඳ වැටීම අත් වී තිබේ. කලාවෙන් හා සාහිත්‍යයෙන් පෝෂණය වීමෙන් ජනතාව මීට වඩා හොඳින් ප්‍රකෘතිය තේරුම් ගැනීමට උත්සාහ කිරීම, පරාජය කිරීම ධනපති ආණ්ඩුවල ප්‍රධානතම පන්ති වුවමනාව වී තිබේ.

එහෙයින්, මෙම සාහිත්‍යයට සිදු කරන කප්පාදුව හුදෙක් හුදෙකලාව සිදු වන සංසිද්ධියක් නොවන අතර, එය දිගින් දිගටම සිදු වෙමින් පවතින ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. එහෙයින්, අද දින ප්‍රාදේශීය සාහිත්‍ය උලෙළවල් තුළින් කෙටිකතාව සහ කවිය ඉවත් වීම සහ හෙට පාසල් විෂය ක්ෂේත්‍රයෙන් සාහිත්‍යයට අදාළව කවිය සහ කෙටිකතාවද ඉවත් නොවන බවට කාටවත් සහතිකයක් දිය නොහැකි වේ.

අප රටේ සංස්කෘතික අමාත්‍යාංශයට ආණ්ඩුව විසින් අයවැයෙන් වෙන් කරනු ලබන්නේ ඉතාමත් සොච්චම් මුදලකි. පුරාවිද්‍යා ස්ථාන දේශීය හා විදේශීය සංචාරකයන්ට පෙන්වා උපයා ගන්නා මුදල පවා සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට එකතු නොවේ. පසුගිය දිනක රාජ්‍ය නාට්‍ය උලෙළ පැවැත්වීමට මුදල් නොමැති වීමෙන් ඇතිවූ තත්ත්වයෙන් සාහිත්‍ය කලා කප්පාදුව පිළිබඳව අප කාටත් දැක ගත හැකි විය. අවසාන වශයෙන් කිව හැක්කේ මෙම සාහිත්‍ය කලාවට සිදු වන කප්පාදුව නතර කර ගැනීමට ජනයා පෙළ නොගැසුණහොත්, අප රටේ සමාජයට අත් වන ඛේදජනක ඉරණමට අප සැවොම ගොදුරු වන බවය.

## අබ්බාස් කියරොස්තාමි... >>04 පිටුවෙන්

**දිවි නසා ගැනීමෙන් ඉක්බිති සිය සිරුර මිහිදන් කිරීම සඳහා මිනිසකු සොයා ගැනීමට දරන උත්සාහය පිළිබඳ පුවතක් ඊට විෂය කරගෙන තිබේ.**

එමඟින් මිනිසෙකුගේ අධිතාත්වික ඇතුළාන්තය ගවේෂණය කරනු ලබයි. එහි එකම පසුතලයක විවිධත්වයෙන් යුතු ප්‍රකාශනයන් අපූරුවට ගොඩනැඟීම සිදු කර ඇත. මෙම සිනමා කෘතිය 'කෑන්ස්' සිනමා උලෙළේ Palm d'Or ජාත්‍යන්තර සම්මානයෙන් පිදුම් ලැබීය.

කියරොස්තාමි සිය සිනමා නිර්මාණයන්හිදී කාව්‍යාත්මක දෙබස් හා රූපණ භාවිතය හේතුවෙන්ද සිනමා ලෝකය තුළ විශේෂ අවධානයට පාත්‍ර වූවෙකි. මේ වන විට ඔහු චිත්‍රපට 40ක් පමණ නිර්මාණය කර ඇති අතර, ඊට කෙටි චිත්‍රපට මෙන්ම වාර්තා චිත්‍රපටද ඇතුළත් වේ. ඔහුගේ සුවිශේෂී සිනමා ආඛ්‍යාන ශෛලිය, දෘෂ්ටිය හා රිද්මය කාලයත් සමඟ පරිවර්තනයට




ලක්වූවකි. ළමා වියේ ගැටලු පිළිබඳව කෙටි චිත්‍රපට නිර්මාණය කරමින්, ඔහු කුඩා ළමයින් බහුලව යොදා ගැනීම, ග්‍රාමීය ජන ජීවිතය දෙසට එබී බැලීම, අවම සම්පත් ප්‍රමාණයකින් සිනමා කෘති නිර්මාණය කිරීම හරහා ඉතාමත් ගැඹුරු භාවමය තත්ත්වයන්ගෙන් පිරිපුන් කාව්‍යාත්මක සිනමාවක් ගොඩනැඟීමට දායකවූ අයෙකි. එබැවින්, බොහෝ සිනමාකරුවන්ට ඔහුගේ සිනමා භාවිතයෙන් ලද හැකි ආභාෂය හා ආලෝකය අතිමහත්ය.

කියරොස්තාමිගේ සිනමාව 1960 දශකයේ ඉරාන 'නූතනවාදී සිනමාත්මක ස්වරූපය' ලෙසද සැලැකේ. ඇතැම් විචාරකයෝ ඔහුගේ සිනමාව අදේශපාලනික වූවක් ලෙසද පෙන්වා දීමට උත්සාහ කරති. ඇතැමුන් ඒවා විදේශ රටවල ප්‍රේක්ෂකයන් ඉලක්ක කොට ගත් සිනමා කෘති ලෙසද හුවාදක්වයි. එහෙත්, කියරොස්තාමිගේ සිනමාවේ අන්තර්ගය, ආකෘතිය හා සමාජ දෘෂ්ටිය ඇතුළු සමස්ත සිනමා භාවිතයම අදේශපාලනික හෝ දේශපාලනයෙන් බැහැර නොවූවකි. එම සිනමා කෘති සෘජුවම හෝ වක්‍ර හෝ ආකාරයෙන් දේශපාලනය සමඟ බැඳී ඇත.

කියරොස්තාමිගේ මුල්ම සිනමා අත්දැකීම 'දි බ්‍රෙඩ් ඇන්ඩ් ඇලි' (The Bread and Alley - 1970) මේ සඳහා තිර පිටපත ඔහුගේම සහෝදරයාගේය. මෙය කෙටි චිත්‍රපටයකි. මෙයට අමතරව ඔහු 1975දී 'සෝ කැන් අයි' (So Can I) හා 'ටූ සොලූෂන්ස් ෆෝර් වන් ප්‍රොබ්ලම්' (Two solutions for one problem) යනුවෙන් කෙටි චිත්‍රපට දෙකක්ද, 80 දශකයේදී තවත් කෙටි චිත්‍රපට කිහිපයක්ම නිර්මාණය කොට ඇත. 'දි බ්‍රෙඩ් ඇන්ඩ් ඇලි' චිත්‍රපටයෙන් ඔහු සම්ප්‍රදායයන්ට හසු නොවී සිනමාත්මක කාලය හා සැබෑ කාලය එකිනෙකට සමීප කිරීමට සෞන්දර්යාත්මක හා තාක්ෂණික වෑයමක් ගත්තේය. මේ චිත්‍රපටයේදී ඉතාම කුඩා දරුවෙක්, බල්ලෙක් සහ වෘත්තීය අත්දැකීම් නොවූ (කැමරා ශිල්පියා හැර) කණ්ඩායමක් ඔහු සමඟ විය. මෙහි ඇතුළත් ළමයාගේ සහ බල්ලාගේ දර්ශන රූපගත කිරීම ඔහුගේ සිනමා ජීවිතයේදී රූපගත කළ වඩාත්ම දුෂ්කර දුරස්ථ දර්ශනය (Long take) බව ඔහු පෙන්වා දේ. මෙම චිත්‍රපටයේ දර්ශන එකිනෙකට වෙන් වෙන්ව රූගත නොකොට තනි දර්ශන ලෙස රූගත කිරීමට ගත් උත්සාහය පිළිබඳව කියරොස්තාමිගේ අදහස වනුයේ එයින් චිත්‍රපටයේ රිද්මයටත් වඩා එහි කතාව (plot) හා බැඳුණු යථාර්ථයට හා අන්තර්ගතයට හානියක් සිදු වීමට තිබූ ඉඩකඩ අවම කර ගත් බවයි. මේ සියලු කරුණු සැලැකිල්ලට ගත් කල කියරොස්තාමිගේ සිනමාව කියැවීම එක්තරා අයුරකින් ප්‍රේක්ෂකයාට නවමු හා දුෂ්කර අත්දැකීමකි.

මෙය මූලික වශයෙන් බලන විට සිනමාව සම්බන්ධ වෙනස් ස්ථාවරයකි. මන්ද, ඔහු සිනමාව බුද්ධියන් හා පරිකල්පනයෙන් වැළඳ ගැනීමට උත්සාහ දැරුවෙකි. ඔහුගේ සිනමාවේ දක්නට ලැබෙන තවත් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ නාට්‍යමය දෙබස් භාවිතය, දෙබස් පුනරුක්තිය හා දේශපාලනික දාර්ශනික ගැටලු මෙන්ම මිනිස් මනෝ භාවයන් සංකේතාත්මකව යොදා ගැනීමට ගත් උත්සාහයයි. එහෙයින්, ඔහුගේ සිනමාව කියැවීමේදී සංඥා, සංකේත, සංඥාකාරක මඟින් කොතෙක් දුරට අදාළ සමාජ, සංස්කෘතිය ප්‍රබලව ප්‍රකාශ වන්නේදැයි සලකා බැලිය යුතුය. 'ද ටේස්ට් ඔෆ් චෙරි' හා 'ද වින්ඩ් විල් කැරි අප්' (The wind will carry up - 1999) චිත්‍රපට උක්ත ලක්ෂණ පෙරටුකොට ගත් චිත්‍රපටවලට නිදසුනකි. එහි ප්‍රධාන නළුවාගෙන් එපිට එහි කිසිවක් දිස් නොවේ. මිනීවළ කපන්නා, කිරි ගෙනෙන දැරිය, මිය යන ස්ත්‍රිය ආදීන් පිළිබඳව අපට ඇසෙනවා මිස පෙනෙන්නේ නැත. එහෙත්. ඒ සියල්ල ප්‍රබල ශ්‍රව්‍ය-දෘශ්‍ය භාවිතයෙන් සිනමාරූපීව ගොඩනැඟීමට කියරොස්තාමි සමත්වී ඇත. ඒ අනුව කියරොස්තාමිගේ සිනමාවේ ඇති සංකල්පීය විශ්වය ප්‍රේක්ෂකයාට සම්බන්ධ වන්නේ විවිධවූ එහෙත්, වක්‍රකාර මාර්ගවලිනි.

තවද, ඔහු ඉතා සරල කතා තේමාවක් මත පිහිටා සුවිශේෂී සිනමා ආඛ්‍යානයක් ගොඩනැඟීමට නිරතුරුවම උත්සාහ කරයි. රිද්මය පිළිබඳ ඔහුගේ හැඟීම නම්, වේගරිද්මය හා උද්වේගය සහිත වාණිජ සිනමාවට ඔහු කිසිසේත් කැමැත්තක් පළ නොකිරීමයි. ඔහුගේ ජීවිතයේද ඉතා වේගවත් රිද්මයන් නැත. ඔහුගේ චිත්‍රපට කෙරෙන් මතු වන්නේද ඔහුගේම ජීවිතයේ වේගය සහ රිද්මයයි. ඔහුගේ තවත් සෞන්දර්යාත්මක සිනමා අත්දැකීමක්වූ 'වෙයාර් ඉස් මයි ෆ්‍රෙන්ඩ්ස් හෝම්', 'ලයිෆ් ඇන්ඩ් නතිං මෝ(ර්)' හා 'ක්ලෝස් අප්' යන චිත්‍රපට මීට කදිම නිදසුන් සපයයි. මේ අතුරින් 'වෙයාර් ඉස් මයි ෆ්‍රෙන්ඩ්ස් හෝම්' ළමා චිත්‍රපට අතර අගැයීම්වලත්, සරල, සුන්දර හා ප්‍රසන්න සිනමා පඨිතයකි. ඉතා නිදහස් සිනමා රීතියක පිහිටා සිටින කියරොස්තාමිගේ අනන්‍ය ලක්ෂණ රැකගෙන නිරන්තරයෙන් විෂයය කර ගැනුමට රුචිකර තේමාව වූයේ ළමා ලෝකයයි. මෙම චිත්‍රපටයේ සිදු වන්නේ භූමිකම්පාවක් සිදුවූ අවස්ථාවක තම මිතුරාට පොතක් දීමට යන ළමයකු පිළිබඳ පුවතකි. එහිදී තම මිතුරාගේ අභ්‍යාස පොත ඔහුට දීම සඳහා ඔහුගේ නිවස බලා යාම පිළිබඳ හුදු සිද්ධි මාලාව අභිබවා යන සංකේතාත්මක අර්ථ පිළිබඳ පර්සියානු අවබෝධය විදහා දක්වන කෘතියක් ලෙසයි. මෙම චිත්‍රපටය ජාත්‍යන්තර අවධානයට පාත්‍රවූ එකකි.

එවැනි සුවිශේෂී අවධානයක් දිනා ගත් කියරොස්තාමිගේ අනෙක් චිත්‍රපටයටද විෂයය වන්නේ සත්‍ය කතා පුවතක් පසුබිම් කර ගත් ජීවිත පිළිබඳ විවරණයකි. එම චිත්‍රපටය 'ලයිෆ් ඇන්ඩ් නතිං මෝ(ර්)' - 1991 සිනමා කෘතියයි. එයද භූමිකම්පාවකින් පසුව ජීවිතය පවත්වා ගැනීමට දරන ප්‍රයත්නයන් ඇතුළත් ඉතා සංවේදී මානුෂීය ප්‍රකාශනයක් සහිත චිත්‍රපටයකි. එම චිත්‍රපටයට 45 වැනි කාන් ජාත්‍යන්තර චිත්‍රපට උලෙළේදී 'රොස්සෙල් ලෙනි' සම්මානය හිමිවිය. මෑත භාගයේදී කියරොස්තාමි ජාත්‍යන්තර කීර්තියට පත් කළ මෙම සිනමා කෘතිය කාව්‍යමයවූද, දර්ශනාත්මකවූද චිත්‍රපටයකි. වැඩිහිටියන් මරණය හා විනාශය ඉදිරියේ කම්පනයට පත්වුවත්, ළමයින් ජීවිතය දෙස බලන ආකාරය අපූරුවට නිරූපණය කරයි. මුල, මැද, අග ඇතුළත් සෘජු ආඛ්‍යාන ශෛලියක් ඇති භාවාතිශය චිත්‍රපටවලට හුරු ප්‍රේක්ෂකයාට මෙය ආගන්තුක චිත්‍රපටයක් විය හැක. මන්ද, කියරොස්තාමිගේ චිත්‍රපටවල යථාර්ථය හා මිශ්‍ර තත්ත්වයන් විග්‍රහ කරන්නේ එහිම ඇතුළත් සිහිනමය ස්වභාවයද ඉස්මතු කරමිනි. ඔහුගේම අදහසකට අනුව **"අප යථාර්ථය යැයි පිළිගනු ලබන දෙය හා මිශ්‍රව පවතින ස්වභාවයන් ඇත. සිනමාවේ යථාර්ථය යනුවෙන් කලින් සිදුවූ දෙයක් පමණක්ම විය යුතු යැයි ගණන් ගැනීමක් නැත. කිසියම් දෙයක් සිදු විය හැකි නම්, එය යථාර්ථවාදී චිත්‍රපයටක විෂයය විය හැක."** ඔහුගේ තවත් ප්‍රකට චිත්‍රපටයක් වන 'ක්ලෝස් අප්' (Close up) 1990 වසරේ මොන්ට්‍රියල් සිනමා උලෙළේ ඉහළම චිත්‍රපටයට හිමි සම්මානයට පාත්‍රවූ අතර, කියරොස්තාමිගේ උක්ත අදහසට මනා නිදසුනක් 'ක්ලෝස් අප්' සිනමා කෘතියෙන් සපයයි.

කියරොස්තාමිගේ සිනමා භාවිතය පිළිබඳ ගැඹුරින් විවරණය කළ හැකි තවත් සිනමා කෘති රාශියක්ම ඉතිරිව ඇත. ඉරානයේ පිටිසරබද සමාජ පසුබිම් හා සෞන්දර්යාත්මක ඉසවු කැටිකොට ගත් 'කෝකර් ත්‍රිත්වය' (Koker Trilogy) දෙවැනි චිත්‍රපටය 'ඇන්ඩ් ලයිෆ් ගෝස් ඔන්' (And Life goes on - 1992) හා 'ත්‍රෑ ද ඔලිව් ට්‍රීස්' (Through the Olive trees - 1994), 'ද හවුස් ඉස් බ්ලැක්' (The house is black) ආදී චිත්‍රපට ලොව පුරා ඉමහත් අවධානයට හා අගැයීමට ලක් විය. සැබැවින්ම ඔහු රසිකයන් පිනවා මුදල් රැස් කිරීමේ චේතනාවෙන් බැහැරවූ නිර්මාණකරුවෙකි. ඔහුගේ පරමාර්ථය වූයේ මානව ජීවිතයේ ගැඹුරුවූද, සංවේදනීය දෑ පිළිබඳව රසිකයන් හා බුද්ධිමය සංවාදයකට ලක් කොට ඔවුන්ගේ රසඥතාවය හා ජීවිතාවබෝධය පුළුල් තලයකට ඔසවා තැබීමේ දැඩි මානවහිතවාදී සමාජ කාර්යයකි. එසේ ගෞරවාදරයට පත් ඉරාන මහා සිනමාකරු අපේ සිනමාවෙන් සමුගෙන ගතවූ මෙම නිමේෂයද සටහන් කරමින්, ජෝන් ලූ ගොඩර්ඩ් නම්වූ ප්‍රංශ සිනමාකරුවා පෙන්වා දුන් පරිදි "ග්‍රිෆින්ගෙන් ආරම්භවන සිනමාව අබ්බාස් කියරොස්තාමිගෙන් අවසන්වූ බව"ද යන සඳහන සමඟින් කියරොස්තාමි පිළිබඳ මෑතදී ලියැවුණු ලිපියක ඔහුට සමීපවම ආදරය කළ හා ඔහුගේ ඇසුර ලද ලාංකේය තරුණ සිනමාකරුවකු වන විමුක්ති ජයසුන්දර සඳහන් කළ වැකියක්ද මෙහි තබමි.

"දැවැන්ත නිර්මාණ සිදු වන ලෝකයක ඇයි ඔබ අවම සම්පත් ප්‍රමාණයක් යොදාගෙන කුඩා චිත්‍රපට කරන්නේ?" යනුවෙන් පුවත්පත් වාර්තාකරුවකු නගන ලද ප්‍රශ්නයට අබ්බාස් කියරොස්තාමි දුන් පිළිතුර මෙයයි;

"සමහර අය අක්කර ගණන් මුඩු බිම් හදලා ඒවායේ දහස් ගණන් අල වගා කරනවා. හැබැයි, මම සතුටු වන්නේ මට පුළුවන් විදියට මගේ ගෙදර පෝච්චියේ තක්කාලි ගහක් හිටවලා ඒ ගහේ තක්කාලි හැදෙනවා බලන්න".

රළ කලාව

2016 සැප්තැම්බර්

## මාක්ස්වාදී ඇසින්

# දෙවියන් මැවූ මිනිස්සු

මිනිස් මනසේ නිර්මාණශීලි පරිකල්පන හැකියාවේ අපූර්වත්වය පිළිබඳ හොඳම උදාහරණය වන්නේ දෙවියන්ය. ජීව පරිණාමය පිළිබඳ, මානව පරිණාමය පිළිබඳ දැනුම නොතිබූ අතීත සමාජයේ මිනිසුන් විශ්වාස කළේ මිනිසා මවනු ලැබුයේ දෙවියන් විසින්ය යනුවෙනි. වර්තමානයේද සමහරු මෙම විශ්වාසයේ සිටිති. එහෙත් සත්‍යය එහි අනෙක් පැත්තය. ලොව සියලුම දෙවිවරුන් මිනිසා විසින් මනඃකල්පිතව මවනු ලැබූ මිනිසාගේ නිර්මාණයන්ය. දෙවියන් තමන්ගේ හැඩරුවට සමාන ලෙස මිනිසා මැව්වා නොව මිනිසා තමන්ගේ හැඩරුවට සමාන ලෙස හා එය අපූර්වත්වයට, අතිශයෝක්තියට නංවා දෙවියන් මැවීය. ඒ භෞතිකව නොව සංකල්ප ලෝකය තුළය. එයද කලාවේම හපන්කමකි. මිනිසුන් විසින් සිතින් මවාගෙන සිටින සියලුම දෙවිවරුන්, සුරදූතයන් හා යකුන් දෙස බලන්න. ඒ තුළ ඇත්තේ එක්කො මිනිස් සිරුරකි නැතිනම් සත්වයෙකි. ඒවා සොබාදහම තුළ මිනිසා දුටු දේවල්ය. සොබාදහම තුළ තමන් දුටු මිනිස් රූප හෝ සත්ව රූප අතිශයෝක්තියට නැගීමෙන් මිනිස්සු දෙවියන් නිර්මාණය කරගෙන සිටිති. මිනිස් රුව අලංකාරමය හා තේජස්වී අතිශයෝක්තියකට නැංවීමෙන් දෙවියන් නිර්මාණය කළ මිනිසා මිනිස් රුව හෝ සත්ව රුවක් රෞද්‍ර හා භයංකර අතිශයෝක්තියකට නැංවීමෙන් යකුන් නිර්මාණය කළේය. මිනිස් මනසේ නිර්මාණයවූ මෙම සංකල්ප කලාකරුවාගේ තෙලි තුඩින් සිතුවමක් බවට පත්විය. ඒ අනුව අවසන් විග්‍රහයේදී දෙවියන් මවනු ලැබුයේ කලාකරුවන් විසින්ය යනුවෙන් පැවසුවහොත් එය අසත්‍යයක් නොවේ.

අතීතයේදී දෙවියන් නිර්මාණය කළ මිනිස්සු එක් එක් විෂයන් සඳහාද දෙවිවරුන් මැවූහ. එය වර්තමාන ඇමති මණ්ඩලයක් බඳුවිය. මෙය වඩාත් වැඩිපුර තිබුණේ යුරෝපයේය. ඒක දේව ආගමක් ලෙස ක්‍රිස්තියානිය බිහිවීමට පෙර බහුදේව ඇදහිලි පැවති අතර යුරෝපයේ එහි මධ්‍යස්ථානය වූයේ ග්‍රීසියයි. යුද්ධයට අධිපති, ප්‍රේමයට අධිපති, පොළවට, අහසට, ජලයට, වෙළදාමට ආදී ලෙස විවිධ ක්ෂේත්‍රවලට අධිපති දෙවියන් රැසක් එකල නිමවා තිබුණි. ඉන්දියාව මූලික කරගත් ආසියානු කලාපයේද මෙවැනි දේව ඇදහිලි රැසක් නිර්මාණය විය. එහිදී කලාවට අධිපති දෙවඟනක් ද නිර්මාණය කර ගන්නා ලදී. ඇය සරස්වතිය නම් විය. මෙහිදී ද සිදුව ඇත්තේ සරස්වතී දෙවඟන විසින් කලාව මැවීම නොව කලාකරුවා විසින් සරස්වතී දෙවඟන නිර්මාණය කිරීමය. සරස්වතිය කලාකරුවාගේ අපූර්ව නිර්මාණයක් විය.

කලාකරුවා සරස්වතිය නිර්මාණය කරනු ලැබුයේ වීනාවක් රැගෙන නෙලුම් මලක් මත වැඩ සිටින කෙනෙක් ලෙසය. වීනාවක් රැගෙන සිටින නිසා ඇය 'වීනාධාරී' ලෙසත් නෙලුම් මලක් මත වැඩ වසන නිසා "කමලවාසිනී" ලෙසත් රූමත් සිරුරක් ඇති නිසා "චාරුදේහිණී" ලෙසත් කවියෝ, ගීත රචකයෝ ඇය හැඳින්වූහ. අතීතයේ සිටම අපගේ කලාකරුවෝ සරස්වතිය සිය විෂයට අධිපති දෙවඟන ලෙස සැලකූහ. කලාකරුවන් යනු සරස්වතියගෙන් වරම් ලැබුවන් ලෙසද හැඳින්විය. මෙය ඉතාම අපූර්ව කලාත්මක සංකල්පණයක් වුවත් මේ තුළ වන අදහස විඥ්ඥානවාදයට යටවුණ අදහසක් නිසා එය කලාවට හෝ සමාජයට බාධාවක් මිස සේවය කරන්නේ නැත.

මාක්ස්වාදය ලෝකය දකින්නේ භෞතිකමය දෙයක් ලෙසය. එය විඥ්ඥානවාදයට එකඟ නොවේ. ඒ විඥ්ඥානවාදය ලෝකය පිලිබඳ වැරදි වූත් විකෘති කරන ලද්දාවූත් අදහසක් පතුරවන නිසාය. මේ අනුව කලාව පිළිබඳ සංවාදයේදීද මාක්ස්වාදය භෞතිකමය පදනමක් මත පිහිටා සිය විග්‍රහයන් ඉදිරිපත් කරයි. එම භෞතිකමය පදනමද අවසානයේ විඥ්ඥානවාදයට වැටෙන පාරභෞතිකවාදී පදනමක් නොව දයාලෙක්තිකවාදී භෞතික පදනමක් වේ. ඒ අනුව කලාව යනු දෙවියන්ගේ නිර්මාණයක්ය යන අදහස දැඩිව ප්‍රතික්ෂේප කරන මාක්ස්වාදය කලාව ජනතාවගේ නිර්මාණයක් මිනිසාගේ නිර්මාණයත් බව තහවුරු කරයි. කලාකරුවා යනු සරස්වතියගෙන් හෝ වෙනත් දෙවියෙකුගෙන් වරම් ගත්, සමාජයට ඉහළින් වැජඹෙන විශේෂ දිව්‍යමය පුද්ගලයෙකු නොව ඔහු මිනිසුන් අතරින් බිහිවුන සෞන්දර්යාත්මක පරිකල්පනයේ වැඩි හැකියාව ඇති තවත් එක් මිනිසෙක් ලෙස මාක්ස්වාදය දකී. කලාකරුවා පොදු මිනිසුන්ගෙන් වෙනස් වන විශේෂ කෙනෙක් බව පිළිගන්නා මාක්ස්වාදය එම විශේෂය දෙවියන්ගේ දායාදයක් නොව එය ඔහුගේ හෝ ඇයගේ මොළයේ ඇති සෞන්දර්යාත්මක පරිකල්පනයේ වැඩි හැකියාවක විශේෂය ලෙස දකිති.

මෙහිදී විඥ්ඥානවාදීහු මේ අදහස සමග සටනකට පැමිණෙති. ඔවුන් පවසන්නේ සාමාන්‍ය මිනිසා තුළ නොපවතින කලාකරුවා තුළ පවතින එම විශේෂ සෞන්දර්යාත්මක හැකියාව එක්කෝ ඔහුට දෙවියන්ගෙන් ලැබුන දායාදයක් බවය. නැතිනම් ඔහු පෙර ආත්මභාවයේ සිට රැගෙන ආ විශේෂ හැකියාවක් බවය. එහෙත් මෙයට පිළිතුර පැහැදිලිය. මිනිස් සිරුර සැදී ඇත්තේ විවිධ ඉන්ද්‍රියයන්ගෙනි. ඒ ඒ ඉන්ද්‍රියන්ට පැවරෙන විශේෂ කාර්යක්ද තිබේ. මෙහිදී පොදුවේ මිනිසුන් සියලු දෙනාගේම සෑම ඉන්ද්‍රියකම ක්‍රියාකාරිත්වය සමාන වන අතරම විශේෂත්වයක් ලෙස සමහර අයගේ විවිධ ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරිත්යේ විශේෂ හැකියාවන් ඇතිවේ. එය ස්වභාවධර්මයේ යථාර්ථය වන අතර කිසියම් බාහිර අද්භූත බලයක ප්‍රතිඵලයක් නොවේ. මිනිසුන් හැම දෙනාටම දිවීමට හැකි අතර උසේන් බෝල්ට්ට වේගයෙන් දිවිය හැකිය. ඒ ඔහු සතුවූ විශේෂ හැකියාවක් පුහුණුව මගින් ප්‍රගුණකර ගැනීම නිසාය. උස පැනීම දුර පැනීමද එසේය. අප හැම දෙනාටම මතක තබාගැනීමේ හැකියාව පොදුවේ තබෙන අතර සමහර අයට බොහෝ දේ මතක තබාගැනීමේ විශේෂ හැකියාව පවතී. ඒවා පොදු දේ තුළ වන විශේෂයන්ය. කලාවේ හැකියාද එසේය. එය මිනිස් මොළයේ චින්තනයේ විශේෂයකි. කලාකරුවා යනු දෙවියන්ගෙන් වරම් ලද හෝ සංසාර පුරුද්දට බිහිවන කෙනෙක් නම් සෞන්දර්ය විශ්වවිද්‍යාලයක සිසුන්ට කලාව (චිත්‍ර, මූර්ති, නර්තනය, සංගීතය) ඉගැන්වීම නිෂ්ඵලවිය යුතුය. එහෙත් එය එසේ නොවේ. කලාවේ විවිධ විෂයයන් උගන්වා ප්‍රගුණ කළ හැකිය. ඒ, සෑම මිනිහෙක් තුළම කලාව සඳහා ඉඩක් පවතින නිසාය.

සැබැවින්ම කලාවත් කලාකරුවාත් පොදු ජනයාගෙන් වියුක්තව ඉහළ තලයක හුදකලාව පැවතිය යුතු නැත. කලාව පොදු ජනයාගෙන් අත්දැකීම් ලබමින් ඉන් පෝෂණය වෙමින් පොදු ජනයා වෙනුවෙන්ම පැවතිය යුතුය. ඒ කලාවේ සැබෑ හිමිකරුවන් ජනතාව වන බැවිනි. නිකම්ම නිකම් ජනතාව නොව වැඩකරන ජනතාව වන බැවිනි. මෙය හොඳින්ම වටහා ගැනීමට නම් කලාව බිහිවූ අයුරුත් එහි ඓතිහාසික ගමන්මගත් භෞතිකවාදී දෘෂ්ටියක සිට හැදෑරිය යුතුය. මීළඟ කලාපයේ සිට අපි එයට පිවිසෙමු.

# ඉරාන සිනමාවේ සෞන්දර්යවේදියා

## අබ්බාස් කියරොස්තාමි (Abbas Kiarostami)



නොයෙල් විජේරත්න

ඉරාන සිනමාව ඉරාන භූගෝලීය කලාපය ඉක්මවා ගිය ඉරාන සංස්කෘතිකමය ලක්ෂණ සහිතව හෝ පර්සියානු භාෂාව කතා කරන සිනමාවක් ඊට අයත් වේ. විප්ලවීය ඉරාන සිනමාව අන්තර්ජාතික සිනමා උලෙළවල් ලෙස සැලැකෙන 'කෑන්ස්', 'බර්ලින්', 'වැනිෂ්' උලෙළ රාශියකදී විශේෂ අවධානයට හා අගැයීමට ලක්ව ඇත. ඉරාන සිනමාව මෙතෙක් පැමිණි දිගු ඓතිහාසික ගමන් මගේ කැපී පෙනෙන සිනමාකරුවන් අතර, අබ්බාස් කියරොස්තාමි කාගේත් වැඩි අවධානයට ලක්වූ සිනමාවේදියෙකි. සිනමා භාවිතය පිළිබඳ විවිධ සංඝටකයන් මෙන්ම ශෛලිය, තේමාව, මතවාදය සහ සංස්කෘතික අනන්‍යතාව හා නව සිනමා ව්‍යාකරණ භාවිතයෙන් ගැඹුරු අරුත් සිනමාත්මකව කියා පෑමේ පුරෝගාමී සිනමාවේදියකු වන අබ්බාස් කියරොස්තාමි ඉරානයේ කලාත්මක හා කාව්‍යාත්මක සිනමාවේ කූටප්‍රාප්තිය සනිටුහන් කළ සිනමාකරුවෙකි.

1940 ජූනි මස 20 වැනි දින ඉරානයේ ටෙහෙරාන්වල (Teheran) උපත ලැබූ ඔහු ටෙහෙරාන් විශ්වවිද්‍යාලයෙන් ලලිත කලා (Fine Arts) උපාධිය ලබා ගන්නා විට කලා ක්ෂේත්‍රයේ විවිධ හැකියාවන් ප්‍රකට කළ පුද්ගලයෙකි. ඔහු චිත්‍ර ශිල්පයේ විශිෂ්ටතා දැක්වූ අයෙකි. ඔහුගේ සිනමා භාවිතයේ සෞන්දර්යාත්මක එළැඹුම් කෙරෙහි විශාල බලපෑමක් කිරීමට ඔහු තුළ සැඟව සිටි චිත්‍ර ශිල්පියා සහ කවියා මෙන්ම සාහිත්‍යධරයා සමත්වූ බව අවිවාදයෙන් යුතුව පිළිගත යුත්තකි. එපමණක්ද නොව අබ්බාස් කියරොස්තාමි චිත්‍රපට සංස්කාරකවරයකු, කලා අධ්‍යක්ෂවරයකු, නිෂ්පාදකවරයකු, ඡායාරූප ශිල්පියකු මෙන්ම වෘත්තීයමය වෙළෙඳ දැන්වීම් නිෂ්පාදකවරයකු ලෙසද දක්ෂතා ප්‍රකට කළ අයෙකි. කියරොස්තාමි ඉරාන සිනමාවේ තරුණ නව රැල්ලේ සිනමාකරුවෙකි. ඉරාන සිනමාවේ නව රැල්ලේ උපත සිදු වූයේ 1960 දශකයේදීය. 70 දශකය තුළ ඉරාන නව රැල්ල කලාත්මක සිනමාවට සමාන්තරව වැඩුණි. ජනප්‍රිය සිනමාවේ දැඩි අභියෝගයන්ට ලක්ව පැවැති මොහොතක සාම්ප්‍රදායික චින්තන රාවෙන් මිදී වෙනත් සංස්කෘතීන් පිළිබඳව වටිනාකම්ද ගවේෂණය කිරීමට ළැදි තරුණ සිනමාකරුවන් පිරිසකගේ ආගමනය සනිටුහන් කළ වකවානුවකි. එම කාලපරිච්ඡේදය තුළ ඉරාන සිනමාව විසින් බිහි කළ විශිෂ්ටතම සිනමාකරුවා ලෙස විචාරකයන් පෙන්වා දෙන්නේ අබ්බාස් කියරොස්තාමිය.

මෙම වකවානුව වන විට ෂා පාලනයට එරෙහිව ගරිල්ලා සටන් උග්‍රව පැවැති අතර, නව රැල්ලේ සිනමාකරුවන්ගේ කෘතිවලට එකී සමකාලීන අත්දැකීම් සෘජුව විෂයය කොට ගැනීමට නොහැකි වීමට බාධා පැවැතිණි. විශේෂයෙන් සමකාලීන දේශපාලන අරගල සිනමා වස්තු නොවිය යුතු බවට එරට පොලිසිය හා හමුදාව විසින් මාර්ගෝපදේශකත්වය සපයා තිබිණි. එහෙත්, මෙම දශකය ඉරාන සිනමාවේ නව මානයන් එළිපෙහෙළි කළ වකවානුවක් ලෙස සැලැකේ. එනම්, වාණිජ අරමුණු මූලික කර ගත් ජනප්‍රිය සිනමාවට සමාන්තරව විකල්ප ධාරාවක කලාත්මක නැඹුරුවක් සහිත සිනමා කෘති නිර්මාණය වීමේ ප්‍රවණතාවයක් ඇති වීමේ හේතුවෙනි. එහිදී වඩාත් කාව්‍යාත්මකවූද, දේශපාලනිකවූද, දාර්ශනික ආස්ථානයක පිහිටා කටයුතු කළ සිනමාවේදීන් පිරිසක් ඉරාන සිනමාව නවරැල්ලේ දෙවැනි අදියරදී හමු වේ. ඒ අතර ප්‍රමුඛතම සිනමාවේදියා වන්නේ අබ්බාස් කියරොස්තාමිය.

මිනිස් ජීවිතයේ නිස්සාර ස්වභාවය, අනියත ස්වභාවය, අපේක්ෂා බිඳී යාම දැඩි නාටකීය ස්වභාවයකින්ද, සිනමාවේ නව මානයකින්ද, එහි සෞන්දර්යාත්මක ඉසවු කරා යොමු කළ සිනමාවේදියා කියරොස්තාමිය. එබැවින්, කියරොස්තාමිගේ සිනමා පඨිතයන් කියවන්නාට සිනමාව පමණක් නොව සාහිත්‍යය, දර්ශනය, කාව්‍යය, චිත්‍රය, මනෝ විද්‍යාව පිළිබඳ ඥානයන්ද අවශ්‍ය වේ. ඒ මක්නිසාද යත්, ඔහුගේ චිත්‍රපට දාර්ශනිකවූත්, අති සංවේදී දෘශ්‍යාත්මක චිත්‍රපට වන හෙයින්, ඒවා ලෙහෙසියෙන් තේරුම් ගැනීමටද අපහසු වන හෙයිනි. කියරොස්තාමිගේ සිනමාව පිළිබඳ ගැඹුරු විවරණයක යෙදෙන ගොඩ්ප්‍රි බෙෂයර් 'ඩිනෙර්ස්ට්' සඟරාවට ලියූ ලිපියක සඳහන් කරනු ලැබූ කරුණ මෙහිලා ඉතා වැදගත්වේ. "ඔහුගේ සිනමාවේ එන අද්විතීය ලක්ෂණ වන්නේ අපේ ඇස දකින රූප හා ඒවාට අප විසින් සපයනු ලබන සරලවූද, ආසක්ත වූද, ජනප්‍රිය අර්ථවලට එපිටින් සහ ස්ථර ගණනාවකින් සැදුණු අර්ථයන් ඇතුළත් වී තිබීමයි. එමෙන්ම ඔහුගේ චිත්‍රපටවල එකිනෙකට සම්බන්ධ වන සියුම් හුයක් ඇත. ඔහුගේ සිනමාවේ පශ්චාත් විප්ලවීය ලක්ෂණ සියල්ලම මේ වටා පෙළගැසේ. මෙම ලක්ෂණ අඩු වැඩි වශයෙන් ඔහුගේ 'ටේස්ට් ඔෆ් චෙරි' (Taste of Cherry), 'වෙයාර් ඉස්මයි ෆ්‍රෙන්ඩ්ස් හෝම්' (Where is my friend's home), 'ලයිෆ් ඇන්ඩ් නතිං මෝ(ර්)' (Life and nothing more), 'පැසෙන්ජර්' (Passenger), 'ත්‍රෲ ද ඔලිව් ට්‍රීස්' (Through the Olive trees) යන සිනමා කෘතිවල අන්තර්ගත වී තිබේ.

ජොනතන් රොසෙන්බෝම්ට අනුව අබ්බාස් කියරොස්තාමිගේ චිත්‍රපට තුළින් මවන ලෝකය ඔහුගේම ලෝකය බවත්, ඒ ලෝකය තේරුම් ගැනීමට නම්, ඉරානීය දෘෂ්ටියෙන් පමණක් එය සිදු කළ නොහැකි බවත්, ඉරානය හා බටහිර සම්බන්ධ කරන සිනමාරූපී නොවන සංස්කෘතික මාවත සමහරක් වශයෙනි. ඔහු සාමාන්‍ය මිනිසුන් සහ ඔවුන්ගේ ජීවිත හා බැඳුණු ගැටලු පිළිබඳව අවධානයක් යොමු කළ සිනමා නිර්මාණයන් අතර, 'ද ටේස්ට් ඔෆ් චෙරි' (The taste of Cherry - 1997) අතිශය වෙහෙසකර අත්දැකීමක් නැරඹීමට අප පොළඹවයි. එහි ජීවිතය හා මරණය පිළිබඳ උපමා කතාවකි. පුද්ගල චිත්ත වික්ෂෝභය ලඝු කරනු ලැබූ චිත්‍රපටයක් බවට පත් කිරීමට සිත්ගන්නා සුළු චිත්‍රපටයක් බවට පත් කිරීමට කියරොස්තාමි සිය සිනමා භාෂාව අපූර්ව ලෙස භාවිත කොට තිබේ.

'ටේස්ට් ඔෆ් චෙරි' සිනමා පටයේ මධ්‍යම පාන්තික ටෙහෙරාන් නුවර වැසියෙක් තම සිය දිවි නසා ගැනීම සඳහා සහයෝගය දිය හැකි අයකු සොයා සංචාරයේ යෙදීම **එසේත් නැතිනම්, පුද්ගලයකු** හට තම

>>ඉතිරිය 03